2015 දී ඔහු විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස පත් විය. ඉන් අනතුරුව, 2017 දී ඔහු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස පත් කරන ලදී. ඔහු ශ්‍රී ලංකන් ගුවන් සේවයේ සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි සභාපති තනතුර ද හෙබවීය. තවද, ඔහු ශ්‍රී ලංකන් ගුවන් සේවයේ වත්මන් කාර්ය සාධනය සහ අනාගත ව්‍යාපාරික උපාය මාර්ග අධ්‍යයනය කිරීමේ විශේෂඥ කමිටුවේ සභාපති ධුරය දැරූ අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන කමිටුවේ සභාපති (Needs Verification) ද විය.

විතානගේ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලන ක්ෂේත්‍රය පිළිබඳ විද්‍යාවේදී උපාධිය ලබා ඇති අතර කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කර ඇත. ඔහු සිවිල් ගුවන්සේවා සහ රාජ්‍ය පරිපාලනය සම්බන්ධ පුහුණු පාඨමාලා රාශියක් හදාරා ඇත. තවද, ඔහු විවිධ කලාපීය/ ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලට ද සහභාගී වී ඇති අතර ශ්‍රී ලංකා රජය විසින් පත් කරන ලද ගුවන්සේවා සාකච්ඡා කණ්ඩායම් 50 කට අධික සංඛ්‍යාවක සාමාජිකයෙකු ලෙස සහභාගී වී ඇති බැවින් ද්විපාර්ශ්වික ගුවන්සේවා සාකච්ඡා පිළිබඳ පුළුල් දැනුමක් ඔහු හට ඇත.

ඔහු කොළඹ පැවති SAARC කලාපීය බහුවිධ ප්‍රවාහන සම්මන්ත්‍රණයේ සභාපතිවරයා ලෙසද පත් කරන ලදී. 2006 දී ඔහු වොෂින්ටන් හි USTDA හි ආයෝජක සංසදයකට සහභාගී වීමට ශ්‍රී ලංකා රජයේ නියෝජිත කණ්ඩායමක්ද මෙහෙයවීය. තවද, 'Colombo Process' හි අමාත්‍ය උපදේශනය සංවිධානය කිරීමට ද ඔහු මූලික වූ අතර ශ්‍රී ලංකාවට සභාපතිත්වය ලබා ගැනීමට ඔහු සමත් විය.

කපිතාන් තේමිය අබේවික්‍රම මහතා
සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී

CAASL හි සාමාජික - හිටපු නිල
06-04-2020 සිට 31-07-2022 දක්වා

කපිතාන් තේමිය අබේවික්‍රම, ඔහුගේ පූර්වගාමියා වූ එච් එම් සී නිමල්සිරි මහතා විශ්‍රාම ගැනීමෙන් පසු 2020 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරී ලෙස වැඩ භාර ගන්නා ලදී. සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් ධුරයට පත්වීමට පෙර කපිතාන් තේමිය කුවේට්හි Jazeera Airways හි ජ්‍යෙෂ්ඨ කපිතාන්වරයෙකු ලෙස කටයුතු කළේය.

කපිතාන් තේමිය 1990 වසරේ එයාර් ලංකා ගුවන් සේවයේ ගුවන් සේවයේ කීර්තිමත් වෘත්තීය ජීවිතය ආරම්භ කළේ ලොක්හීඩ් ට්‍රයිස්ටාර් බලඇණියේ පියාසර ඉංජිනේරුවරයෙකු ලෙසය. ට්‍රයිස්ටාර් හි පළමු නිලධාරියෙකු බවට ඉක්මනින් පත් වූ ඔහු, පසුව එයාර්බස් බලඇණියේ සහ එයාර්බස් A 320/A 330/A 340 බලඇණියේ කපිතාන් ලෙස පත් විය. ඔහු නාමොද්දිෂ්ට චෙක් නියමුවකු මෙන්ම VVIP නියමුවෙකු ලෙසද කටයුතු කර ඇත.

පසුව ඔහු 2008 සිට Kingfisher Airlines හා සම්බන්ධ වූ අතර එහිදී ඔහු කපිතාන් ලෙස සේවය කළ අතර ඉන්දියානු සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ එයාර්බස් ඇණියේ නාමොද්දිෂ්ට චෙක් නියමුවෙකු ලෙසද සේවය කළේය. ඉන්දියානු සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නීතිරීති සහ රෙගුලාසිවලට අනුව ඔහු Kingfisher wide body fleet හි උපදේශක සහ නියමු පුහුණුව හඳුන්වාදුන් අතර VVIP ගුවන් ගමන් ද ක්‍රියාත්මක කළේය.

2011 දී ඔහු මිහින් ලංකා හි ප්‍රධාන පුහුණු හා ප්‍රමිති නියමුවා ලෙස වැඩ භාර ගත්තේය. එහිදී, ඔහු ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ චෙක් නියමුවෙකු ද වූ අතර නව්‍ය කැඩෙට් නියමුවන් බඳවා ගැනීම් සහ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම ද දැරිය. මෙම භූමිකාවේදී ඔහුට ගුවන් සමාගම වෙනුවෙන් CAASL හි බොහෝ නියාමන අවශ්‍යතා සපුරාලීමට සිදුවිය. නව ගුවන් යානා ප්‍රවිෂ්ට කිරීමේදී පිළිගැනීමේ පරීක්ෂණ පියාසැරි පැවැත්වීමට අමතරව, කපිතාන් තේමිය විශේෂ ගුවන් ගමන් සහ VVIP ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීමෙහිලා ද සම්බන්ධ විය.

2015 දී කපිතාන් තේමිය සාමාන්‍යාධිකාරී සහ නියෝජ්‍ය මෙහෙයුම් අධ්‍යක්ෂ ලෙස නේපාලයේ හිමාලයා ගුවන් සේවයට (Himalaya Airlines) බැඳින. ඔහු නේපාලයේද සිවිල් ගුවන්සේවා අධිකාරියේ නාමොද්දිෂ්ට චෙක් නියමුවෙකු ලෙස කටයුතු කළේය. ඔහු එයාර් ඔපරේටර් සහතිකය ලබා ගැනීමේදී ගුවන් සේවයට දායක වූ කණ්ඩායමේ සාමාජිකයෙකු වූ අතර නේපාල සිවිල් ගුවන්සේවා අධිකාරියේ නියාමන සහ බලපත්‍ර අවශ්‍යතා සපුරාලීම සඳහා ගුවන් නියමුවන්, තාක්ෂණික කාර්ය මණ්ඩලය සහ මැදිරි කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව සම්බන්ධීකරණය කිරීමේ වගකීම ද දැරිය. නැවත වරක්, හිමාලයන් ගුවන් සේවය සඳහා නව ගුවන් යානා පිළිගැනීමේ පරීක්ෂණ පියාසැරි පැවැත්වීමට ඔහුට බලතල ලැබුණු අතර, නේපාලයේ ගරු අග්‍රාමාත්‍යවරයාගේ චීන සංචාරය අධීක්ෂණය කිරීමටද කපිතාන් තේමියට භාර විය.

Himalaya Airlines වෙතින් කපිතාන් තේමිය 2016 වසරේදී කුවේට් හි Wataniya Airways වෙත බැඳෙන්නේ කුවේට් සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවශ්‍යතා අනුව සියලුම නියාමන අංශ අධීක්ෂණය කරමින් මෙහෙයුම් අධ්‍යක්ෂ ලෙස වැඩ භාර ගැනීමටය. ගුවන් සමාගමට එහි ගුවන් මෙහෙයුම් සහතිකය ලබා ගැනීමට ඔහු සහය ලබා දුන් අතර සෞදි අරාබිය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, බහරේන්, ඊජිප්තුව, ඉරානය, ඉරාකය, තුර්කිය, ලෙබනනය, ඉන්දියාව, නේපාලය සහ නැගෙනහිර යුරෝපීය රටවල් සමඟ අසල්වැසි රාජ්‍යයන් වෙත ගුවන් සමාගමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කළේය. Wataniya Airways සඳහා ගුවන් යානා පිළිගැනීමේ පරීක්ෂණ පියාසැරි ද කපිතාන් තේමිය විසින් සිදු කරන ලදී.

පී ඒ ජයකාන්ත මහතා

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී

CAASL හි නිලබලයෙන් පත් වූ සාමාජික
01-08-2022 සිට - මේ දක්වා

ගුවන්සේවා ක්ෂේත්‍රයේ ප්‍රවීණයෙකු සහ ICAO ප්‍රතිපාදනය ලත් ජාත්‍යන්තර විගණකවරයෙකු වූ පළමු ශ්‍රී ලාංකිකයා වන පී ඒ ජයකාන්ත මහතා 2022 අගෝස්තු 5 වන දින සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ (CAASL) ප්‍රධාන විධායක නිලධාරී ලෙස වැඩ භාර ගන්නා ලදී. අතිගරු ජනාධිපතිතුමාගේ අනුමැතිය ඇතිව අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයකට අනුව මෙම පත්කිරීම සිදු කර ඇත.

පී ඒ ජයකාන්ත මහතා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වරලත් නිලධාරියෙකු ලෙස සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළ අතර ඉන් අනතුරුව කළමනාකරණ නිලධාරියෙකු ලෙස එවකට ජාතික ගුවන් සේවය වූ එයාර්ලංකා ලිමිටඩ් හා සම්බන්ධ විය. 2004 දී ඔහු සිවිල් ගුවන්සේවා අධිකාරියේ, සිවිල් ගුවන්සේවා පරීක්ෂක වරයෙකු ලෙස ගුවන්සේවා ආරක්ෂක අංශයට අනුයුක්ත විය. 2020 වසරේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත්වීමට පෙර ඔහු ගුවන්සේවා ආරක්ෂක අධ්‍යක්ෂ සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් යන තනතුරු හෙබවිය.

ඔහු ICAO විසින් පිළිගත් ජාත්‍යන්තර විගණකවරයෙකු ද වන අතර ICAO විශ්ව ආරක්ෂණ විගණන වැඩසටහන සඳහා 2010 වසරේ සිට විදේශ රටවල රාජ්‍ය වල විගණන පවත්වමින් එහි විගණන කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙසද සේවය කරයි. ICAO හි සාමාජික රටවල් වන පැපුවා නිව්ගිනියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, තායිලන්තය, මියන්මාරය, බංග්ලාදේශය, වියට්නාමය, භූතානය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ මැලේසියාව යන රටවල පැවති ජාත්‍යන්තර විගණන සඳහා ඔහු විශේෂඥ විගණන පරීක්ෂකවරයෙකු ලෙස සහාය ලබා දී ඇත.

ඔහු කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව (විශේෂ) උපාධියක් ද, කැලණිය විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත. මීරිගම ඩී.එස්.සේනානායක මධ්‍ය මහා විද්‍යාලයේ කැපී පෙනෙන ශිෂ්‍යයකු වූ ඔහු සටන් කලාව, වොලිබෝල් වැනි ක්‍රීඩා ක්‍රියාකාරකම්වල දක්කම් දක්වමින් 1981 වර්ෂයේ විද්‍යාලයේ ප්‍රධාන ශිෂ්‍ය නායක බවට පත්විය.

ඔහු 2010 වසරේ සිට ICAO විසින් පත් කරන ලද සිවිල් ගුවන්සේවා ආරක්ෂාව පිළිබඳ විශේෂඥ විගණන පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. ඔහු මේ දක්වා ICAO විසින් ශ්‍රී ලංකා රාජ්‍යයේ පත් කරන ලද පළමු සහ එකම ජාත්‍යන්තර විගණකවරයා වේ. 2012 දී ICAO විසින් පවත්වන ලද සිවිල් ගුවන්සේවා ආරක්ෂක විගණනයේදී ශ්‍රී ලංකාව සඳහා කලාපීය සහ ගෝලීය වශයෙන් ඉහළ ස්ථානයක් අත්කර ගැනීමට මූලික වූ ජයකාන්ත මහතා එම විගණනය සඳහා ICAO හි ජාතික සම්බන්ධීකාරකවරයා ද විය.

මීට අමතරව, Covid-19 රෝග වසංගතය හමුවේ, ගුවන් තොටුපල ආරක්ෂක මෙහෙයුම් ජයකාන්ත මහතාගේ මගපෙන්වීම යටතේ නියමිත ප්‍රමිතීන්ට අනුව සිදු කරන ලද අතර එමඟින් කාර්ය මණ්ඩලයේ සහ මගීන්ගේ ආරක්ෂාව සහතික කිරීමට හැකිවිය. ආරක්ෂක අමාත්‍යාංශය සමඟ එක්ව ගුවන් යානා පැහැර ගැනීමකදී ප්‍රාණ ඇපකරුවන් බේරා ගැනීම සඳහා පුහුණු නිලධාරීන් කණ්ඩායමක් පිහිටුවීමටද ඔහු පුරෝගාමී වී ඇති අතර, සිවිල් ගුවන්සේවා ආරක්ෂාව පිළිබඳ ජාතික වැඩසටහනක් සකස් කිරීමේ මෙහෙවරේද ඔහු පුරෝගාමියෙක් වෙයි. තම උපන් නගරයේ සමාජ හා ආගමික ප්‍රගමනය වෙනුවෙන් ඔහු කළ විශිෂ්ට සේවය අගයමින් දේශ බන්දු සහ දේශ කීර්ති යන ජාතික ගෞරව සම්මානයන්ගෙන් ඔහු පිදුම් ලබා ඇත.

(විශ්‍රාමික) මේජර් ජෙනරාල් ජී. ඩී. එච්. කමල් ගුණරත්න මහතා

WWV RWP RSP USP ndc psc MPhil
ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය

CAASL හි නිලබලයෙන් පත් වූ සාමාජික
19-11-2019 සිට මේ දක්වා

2020 දෙසැම්බර් 28 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ත්‍රිවිධ හමුදා ප්‍රධානියා විසින් තරු හතරේ ජෙනරාල් නිලයට උසස් කරන ලද විශ්‍රාමික ජෙනරාල් කමල් ගුණරත්න, ශ්‍රී ලංකාවේ කැපී පෙනෙන නායකත්ව චරිතයකි. වසර 35කට අධික කීර්තිමත් යුධ

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි 13 වන සහ 14 වන මණ්ඩලයෙහි සාමාජිකයන් පිළිබඳ හැඳින්වීම

දිවියක් සපිරුණු, බළඇණි, මාණ්ඩලික සහ උපදේශන පත්වීම් රැසක් දරමින්, ශ්‍රී ලංකා රජයේ වටිනා නිලධාරියෙකු ලෙස වසර දෙකකට ආසන්න කාලයක් සේවය කර ඇති ජෙනරාල් ගුණරත්න මහතා දැනට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් තනතුර දරයි. ඔහු ප්‍රධාන ආරක්ෂක ප්‍රතිපත්ති සම්පාදකයෙකු ලෙස සහ ගරු ජනාධිපතිතුමාගේ සහ ආරක්ෂක රාජ්‍ය අමාත්‍යවරයාගේ ආරක්ෂක/ජාතික ආරක්ෂාව සම්බන්ධ කරුණු පිළිබඳ උපදේශකවරයෙකු ලෙස ද ක්‍රියා කරයි.

කීර්තිමත් ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරියෙකු වූ ඔහු මානුෂීය මෙහෙයුමේ අවසන් අදියරේදී 53 වන සේනාංකයේ සේනාංකාධිපති සහ අණදෙන නිලධාරියා (GOC) ලෙස ඉටුකළ කාර්යභාරය අතිශයින් ප්‍රශංසනීය වූ අතර එය ශ්‍රී ලංකාවේ සමකාලීන යුධ ඉතිහාසයේ වාර්තා තබා ඇත.

මේජර් ජෙනරාල් ගුණරත්න යුධමය කාලසීමාවේදී සුවිශේෂී සේවාවක් ඉටුකළ අභීත රණවිරුවෙකි. සිය යුදෙ හමුදා සේවා කාලය තුල ආරක්ෂක සේනා මූලස්ථානය - වන්නි හි ආඥාපති, 53 වන සේනාංකයේ සේනාංකාධිපති, විශේෂ බලකාය, ගජබා රෙජිමේන්තුව සහ යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව යන රෙජිමේන්තුවල රෙජිමේන්තු අධිපති සහ යුදෙ හමුදා මූලස්ථානයේ යුධෝපකරණ මාස්ටර් ජෙනරාල් වශයෙන් රාජකාරි කර ඇත.

මේජර් ජෙනරාල් කමල් ගුණරත්න බලූකිස්තාන් විශ්ව විද්‍යාලයෙන් 'යුධ කලාව සහ විද්‍යාව' පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ලබා ඇති අතර ඔහුගේ ඉහළම හමුදා අධ්‍යයන සුදුසුකම (NDC) ලබා ඇත්තේ ගෞරවනීය හමුදා ආයතනයක් වන ඉන්දියාවේ ජාතික ආරක්ෂක විද්‍යාලයෙනි. ඔහු මදුරාසි විශ්ව විද්‍යාලයෙන් 'ආරක්ෂක සහ උපායමාර්ගික අධ්‍යයනය' පිළිබඳ දර්ශනපති උපාධියක් ද ලබා ඇත.

ඔහු ශ්‍රී ලංකා යුදෙ හමුදාවේ සේවය කළ කාලය තුළ විදේශයන්හි සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සම්මන්ත්‍රණ ගණනාවකට සහභාගී වී ඇති අතර බ්‍රසීලයේ නියෝජ්‍ය දූත මණ්ඩල ප්‍රධානියා ලෙස රාජ්‍ය තාන්ත්‍රික ක්ෂේත්‍රයේ ද සේවය කර ඇත. ශ්‍රී ලාංකේය ඉතිහාසයේ ප්‍රථම වරට යුදෙ සාහිත්‍යය නව්‍යකරණය කළ කතුවරයකු වන ඔහු, 'රණමග ඔස්සේ නන්දිකඩාලී' ඇතුළු පොත් හතක් රචනා කර ඇති අතර, ගීත හතක්ද රචනා කර ඇති ප්‍රවීණ ගීත රචකයෙක්ද වේ.

පී කේ අයන්ති ද සිල්වා මහත්මිය

භාණ්ඩාගාර නියෝජිත
අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව

CAASL හි සාමාජික - හිටපු නිල
26-01-2020 සිට 27-02-2022 දක්වා

අයන්ති ද සිල්වා මෙනවිය මුදල් අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරිය වන අතර, ප්‍රතිපත්ති තීරණ සඳහා රජයේ ආයෝජනවලින් ලැබෙන ප්‍රතිඵල වාර්තා කිරීමේ වගකීම දරයි. රාජ්‍ය ආයෝජනවලින් සාමාන්‍ය ජනතාවට අපේක්ෂිත ප්‍රතිලාභ ලබා දීම සඳහා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන අධීක්ෂණය, ඇගයීම සහ උපදේශනය සඳහා මෙහෙයුම් කණ්ඩායමට අයැ නායකත්වය ලබා දෙයි.

1994 දී සහකාර අධ්‍යක්ෂවරියක ලෙස රාජ්‍ය සේවයට එක් වූ ඇය, සාර්ව ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික සැලසුම්කරණය, ජාතික අයවැයකරණය සහ ප්‍රතිඵල අධීක්ෂණය යන ක්ෂේත්‍රවල භාණ්ඩාගාරයේ විවිධ දෙපාර්තමේන්තු වෙත කැපී පෙනෙන සේවාවක් ලබා දුන්නේය.

ඇයගේ වසර 27ක වෘත්තීය ජීවිතය තුළ ඇය ජාතික ජල මණ්ඩලය, ලංකා විදුලිබල සමාගම, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සහ වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය ඇතුළු රාජ්‍ය ආයතන 15ක අධ්‍යක්ෂ මණ්ඩලයේ නිල බලයෙන් සාමාජිකත්වය ලබා ඇත. ඇය ශ්‍රී ලංකාවේ ආර්ථික විද්‍යාඥයන්, ඇගයුම්කරුවන් සහ ජනවිකාසඥයන් වැනි වෘත්තීය සංගම් 03 ක ක්‍රියාකාරී සාමාජිකාවකි. ඇය පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජවේදී උපාධිය සහ ශාස්ත්‍රපති උපාධි දෙකෙහිම ගෞරව ලබා ඇති අතර ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ ඕස්ට්‍රේලියාවේ ෆ්ලින්ඩර්ස් විශ්වවිද්‍යාලයෙන් (Flinders University) මෙන්ම ජනවිකාස විද්‍යාව පිළිබඳ කොළඹ විශ්වවිද්‍යාලයෙන් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද ලබා ඇත.

ජේ සී වැලිගමගේ මහත්මිය

භාණ්ඩාගාර නියෝජිත
අධ්‍යක්ෂ ජනරාල් රාජ්‍ය මුදල්

CAASL හි සාමාජික - හිටපු නිල
28-02-2022 සිට 17-08-2022 දක්වා

ජේ සී වැලිගමගේ මෙනවිය රාජ්‍ය මූල්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරිය වන අතර ඇයගේ ප්‍රධාන කාර්යභාරය වන්නේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමයි. වැලිගමගේ මෙනවිය රාජ්‍ය අංශයේ වසර 40කට ආසන්න කාලයක් සර්වේයර් ජනරාල් දෙපාර්තමේන්තුව, පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ රාජ්‍ය මූල්‍ය යන දෙපාර්තමේන්තුවල විධායක සහ ජ්‍යෙෂ්ඨ විධායක මට්ටමේ තනතුරු දරා ඇති අතර 2020 වසරේදී රාජ්‍ය මූල්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරිය ලෙස රාජකාරි බාරගන්නා ලදී.

ඇය 1996 සිට 2020 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමින් ශ්‍රී ලංකාවේ මූල්‍ය රෙගුලාසි (FR) සංශෝධනය කිරීම, භාණ්ඩාගාර තනි ගිණුම්කරණ (TSA) පද්ධතිය සහ පරිගණකගත ඒකාබද්ධ රාජ්‍ය ගිණුම්කරණ පද්ධතිය (CIGAS) සහ ගිණුම්කරණ මෘදුකාංග පැකේජය ක්‍රියාත්මක කිරීම සඳහා පත් කරන ලද ප්‍රධාන කණ්ඩායම් සාමාජිකාවක් ද වේ. වැලිගම මගේ මහත්මිය රාජ්‍ය ආයතන රැසක අධ්‍යක්ෂ මණ්ඩලයේ ද සේවය කර ඇත.

ඒ කේ සෙනෙවිරත්න මහතා

භාණ්ඩාගාර නියෝජිත

CAASL හි නිලබලයෙන් පත් වූ සාමාජික
18-08-2022 සිට - මේ දක්වා

ආනන්ද කිත්සිරි සෙනෙවිරත්න මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (SLAS) විශේෂ ශ්‍රේණියේ නිලධාරියෙකි. සෙනෙවිරත්න මහතා කැලණිය විශ්වවිද්‍යාලයෙන් රසායන විද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධියක් (ගෞරව) ලබා ඇති අතර, ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් ව්‍යාපාර හා මූල්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ද කොළඹ විශ්වවිද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ලබා ඇත.

ඔහු 1995 දී ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳුණි. ඔහුගේ සේවා කාලීන පුහුණු වසර අවසන් වූ පසු 1996 දී මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරන ලදී. 2015 දී ඔහු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරන ලද අතර, 2018 ජනවාරි මාසයේ සෙනෙවිරත්න මහතා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් විය.

ඉන් අනතුරුව 2018 පෙබරවාරි මස භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු ලෙස පත් වූ ඔහු 2020 නොවැම්බර් දක්වා එම තනතුර හෙබවීය. ඉන්පසු ඔහු අධ්‍යාපන අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශයේ අතිරේක ලේකම්වරයෙකු ලෙස සේවය කර ඇති අතර, 2022 අගෝස්තු මාසයේ සිට ඔහු නැවතත් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයෙකු වැඩ භාර ගත්තේය. සෙනෙවිරත්න මහතා අධ්‍යක්ෂ මණ්ඩල අධ්‍යක්ෂවරයෙකු ලෙස රජය සතු ආයතනයන් රැසක සේවය කර ඇත.

ඩබ්ලිව් එම් එස් චමින්ද වෙලේගම මහතා

CAASL හි සාමාජික
03-01-2020 සිට 11-08-2022 දක්වා

1989 දී ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ අභ්‍යාසලාභී සහකාර අධිකාරීවරයකු ලෙස වෙලේගම මහතා සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. ඔහු තලවාකැලේ ජාතික වැවිලි

කළමනාකරණ තේ පර්යේෂණ මණ්ඩලය සහ ලුණුවිල පොල් පර්යේෂණ මණ්ඩලය යටතේ පුහුණුව ලබා ඇත. ඔහු වසර 32ක කාලයක් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව හැකියාවක් යටතේ වැවිලි කර්මාන්තයට සහ පෞද්ගලික අංශයට සිය සේවය ලබාදී ඇත.

ඔහු 2011-2015 දක්වා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කර ඇත. ඔහු දැනට Deraniyagala Plantations Pvt Ltd හි සභාපති තනතුර දරන අතර, බනිජ තෙල් නිෂ්පාදන වෙළඳාමට සම්බන්ධ Cimbalanka Holdings (Pvt) බවා හි සම කළමනාකාර අධ්‍යක්ෂවරයා ලෙසද කටයුතු කරයි. ඔහු මෝටර් රථ, සමුද්‍ර සහ ට්‍රාන්ස්ෆෝමර් ලිහිසි තෙල් නිෂ්පාදන සමාගමක් වන මැලේසියාවේ Hyrax ys SDN Bhd හි අධ්‍යක්ෂ තනතුරක් ද දරයි.

ඔහු British Ceylon Corporation හි සභාපතිවරයා ද වේ. (Please verify) ඔහු PIPF වැඩසටහනේ පුහුණුව සාර්ථකව නිම කර ඇත්තේ ජපානයේ විදේශ තාක්ෂණික ශිෂ්‍යත්ව සංගමය (AOTS) යටතේය. ඔහු 2003 දී ඉන්දියානු කළමනාකරණ සහ තාක්ෂණ ආයතනයේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ද සම්පූර්ණ කර ඇත.

(විශ්‍රාමික) එයාර් වයිස් මාර්ෂල් සාගර කොටදෙණිය මහතා

WWV, RWP, RSP, Msc (Def) amp; Stu), MAIR, VSV, USP, psc

CAASL හි සාමාජික
12-08-2022 සිට - මේ දක්වා

එයාර් වයිස් මාර්ෂල් සාගර කොටදෙණිය කොළඹ විශ්ව විද්‍යාලයෙන් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් (MAIR) සහ ඉන්දියාවේ මදුරාසි විශ්වවිද්‍යාලයෙන් ආරක්ෂක සහ උපාය මාර්ගික අධ්‍යයනයන් පිලිබඳ උපාධියක් ලබා ඇත. ඔහු වොෂින්ටන් හි ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාලයේ සහ චීනයේ ජාතික ආරක්ෂක විශ්ව විද්‍යාලයේ ආදී ශිෂ්‍යයෙකි.

ශ්‍රී ලංකාවේ සහ පාකිස්ථානයේ මූලික ගුවන් ගමන් ආරක්ෂාව/අනතුරු විමර්ශන සහ ඉන්දියාවේ ආරක්ෂක සේවා බලඇණි සහ මාණ්ඩලික විද්‍යාලය ඇතුළුව ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි ගුවන්සේවා සහ උපායමාර්ගික කළමනාකරණ පුහුණුව සඳහා අඛණ්ඩව නිරාවරණය වී ඇති දක්ෂ නිලධාරියෙක් වන ඔහු සිය හමුදා ජීවිතය තුළ සම්මන්ත්‍රණ සහ පාඨමාලාරැසකට ද සහභාගී වී ඇත.

ඔහq IATA ආයතනයෙන් ගුවන්සේවා කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් සහ ගුවන්සේවා ස්ථාන කළමනාකරණය පිළිබඳ සහතිකයක් ද ලබා ඇති අතර, ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා ප්‍රථම ගුවන් සම්මන්ත්‍රණය සැලසුම් කිරීම සහ පැවැත්වීම සඳහා ඔහු දායක විය.

ගුවන් හමුදාවේ වසර 35ක සේවා කාලය තුළ එයාර් වයිස් මාර්ෂල් කොටකදෙනිය මාණ්ඩලික සහ අණදෙන නිලධාරි පත්වීම් රැසක් හොබවා ඇත. මාණ්ඩලික නිලධාරී ගුවන් මෙහෙයුම් 1, මාණ්ඩලික නිලධාරී (ගුවන්) ඒකාබද්ධ මෙහෙයුම් අණදෙන නිලධාරී, ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ ගුවන් පක්ෂයේ ප්‍රධාන උපදේශක සහ අංක 07 බලඝණයේ අණදෙන නිලධාරී වශයෙන් ඔහු සේවය කර ඇත. ඒ සියල්ලටම වඩා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් කඳවුරු හයටම අණ දුන් එකම ගුවන් හමුදා නිලධාරියා ඔහුය. ඔහු සටන් මෙහෙයුම් සහ VVIP පියාසර යන දෙඅංශයෙන්ම පියාසර පැය 5000කට වඩා වාර්තා කර ඇති ජ්‍යෙෂ්ඨ VVIP නියමුවෙකි. ඔහු ගුවන් හමුදා කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ගුවන් ආරක්ෂක ආඥාපති, අධ්‍යක්ෂ ලොජිස්ටික් සහ ගුවන් බුද්ධි අධ්‍යක්ෂ වැනි තනතුරු හෙබවීය.

ඔහු ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී තනතුරට පත්වීමට පෙර කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා ලෙසද කටයුතු කළේය.

එයාර් වයිස් මාර්ෂල් සාගර කොටදෙණිය මානුෂීය මෙහෙයුම්වල මෙහෙයුම් නියමුවෙකු සහ මෙහෙයුම් අණදෙන නිලධාරියෙකු ලෙස කටයුතු කළ අතර ඔහුගේ නිර්භීත ක්‍රියාවන් අගයමින් වීර වික්‍රම විභූෂණ (WWV), රණ වික්‍රම පදක්කම (RWP) සහ රණ සූර පදක්කම (RSP) යන පදක්කම් ත්‍රිත්වයෙන් පිදුම්හමන ලදී. ඔහු රටට කළ විශිෂ්ඨ, ආදර්ශවත් සේවයට ප්‍රචාරක සහ මෙහෙයුම් සේවා පදක්කම්වලට අමතරව විශිෂ්ඨ සේවා විභූෂණ (VSV), උත්තම සේවා පදක්කම (USP) සහ ශ්‍රී ලංකා සන්නද්ධ සේවා සඳහා දිගු සේවා පදක්කම් ද ඔහු වෙත පිරිනමා ඇත.

කපිතාන් නවීන් ද සිල්වා මහතා

CAASL හි සාමාජික
23-02-2021 සිට 23-07-2022 දක්වා

ඇමරිකා එක්සත් ජනපදයේ ෆ්ලොරිඩා හි පිහිටි කීර්තිමත් ෆ්ලයිට් සේෆ්ටි ඉන්ටර්නැෂනල් ෆ්ලයිං ඇකඩමියේ අධ්‍යාපනය හැදෑරීමෙන් පසු කපිතාන් නවීන් ද සිල්වා ශ්‍රී ලංකා සිවිල් යුද්ධයේ උග්‍ර සමයේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ස්වේච්ඡා සේවකයෙකු ලෙස සිය පියාසර ජීවිතය ආරම්භ කළ අතර එහිදී ස්වේච්ඡා ගුවන් නියමුවෙකු ලෙස මව්බිමට සිය යුතුකම ඉටු කළේය.

1986 දී ඔහු එයාර් ලංකා ජාතික ගුවන් සේවයට කැඩෙට් නියමුවෙකු ලෙස සම්බන්ධ වූ අතර එතැන් සිට කපිතාන් නිලයට ළඟා වී, වසර 25 කට වැඩි කාලයක් උපදේශකයෙකු සහ පරීක්ෂකවරයෙකු ලෙස තම වගකීම් ඉටු කළේය. ජාතික ගුවන් සේවයට සම්බන්ධ වූ දා සිට ඔහු A320 බලඇණියේ ප්‍රධාන නියමු, ගුවන් මෙහෙයුම් ප්‍රධානී සහ ශිෂ්‍යභට පුහුණු වැඩසටහන භාර ප්‍රධාන නියමු වැනි කළමනාකරණ තනතුරු හොබවා ඇත.

කපිතාන් නවීන් ද සිල්වා මහතා ශ්‍රී ලංකන් ගුවන් සේවයේ කළමනාකාරීත්වයේ කොටසක් සහ වෘත්තීය ගුවන් නියමුවෙකු ලෙස කටයුතු කරන කාලය තුළ ගුවන්සේවා කර්මාන්තයට අදාළ විවිධ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ පුහුණු වැඩසටහන් රාශියකට සහභාගී වී ඇත. ඔහු කැපී පෙනෙන ක්‍රීඩකයෙකු ද වන අතර වසර 38 ක ක්ෂේත්‍රය තුළ ඔහු ලබාගත් අවබෝධය ප්‍රයෝජනයට ගනිමින් ශ්‍රී ලංකාවේ ගුවන්සේවා ක්ෂේත්‍රයේ කැපී පෙනෙන චරිතයක් බවට පත්වීමට ඔහුට හැකි විය.

කපිතාන් මිලින්ද රත්නායක මහතා

CAASL හි සාමාජික
12-08-2022 සිට - මේ දක්වා

ප්‍රවීණ ගුවන් නියමුවෙකු වන කපිතාන් මිලින්ද රත්නායක මහතා පියාසර පැය 15,000කට අධික වන්ක්යාවක් වාර්තා කර ඇත්තේ මහී ගුවන් යානාවන් වල අතර, එයාර් සිලෝන්, එයාර් ලංකා සහ ශ්‍රී ලංකන් ගුවන් සේවයෙහි වසර 40ක් පුරා ප්‍රගතිය සියැසින් දැක ඇත. ඔහුගේ පියාසර වෘත්තියට අමතරව, පියාසර මෙහෙයුම් සහ සේවා සැපයීම (ආරක්ෂාව, මැදිරි කාර්ය මණ්ඩලය සහ ගොඩබිම් හැසිරවීම් කළමනාකරණය) වැනි කළමණාකරණ අත්දැකීම් සම්භාරයක් ද ඔහු සතුය. 2018 වසරේ ශ්‍රී ලංකා ගුවන් තොටුපළ සහ ගුවන් සේවාවේ (ASSL) උප සභාපති ධුරය ද ඔහු හෙබවීය.

ඔහු IATA Flight Operations Group හි සිටින එකම ශ්‍රී ලාංකික නියෝජිතයා වන අතර, විශිෂ්ට ගොල්ෆ් ක්‍රීඩකයෙක් ද වේ. කපිතාන් රත්නායක ගුවන්සේවා කර්මාන්තයට ධනාත්මක වෙනසක් ගෙන වීමට අපේක්ෂා කරයි. ඔහු ඕස්ට්‍රේලියාව, ඈත පෙරදිග, යුරෝපය සහ උතුරු සහ දකුණු ඇමරිකාව වැනි රට වල පුළුල් ලෙස සංචාරය කර ඇත.

නිහාල් ජයවර්ධන මහතා (PC)

CAASL හි සාමාජික
31-12-2019 සිට 30-12-2022 දක්වා

මහනුවර ශාන්ත අන්තෝනි විද්‍යාලයෙන් පාසල් අධ්‍යාපනය ලැබූ ඔහු 1980 වර්ෂයේදී ශ්‍රී ලංකා නීති විද්‍යාලයට ඇතුළත් විය. ජයවර්ධන මහතා

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි 13 වන සහ 14 වන මණ්ඩලයෙහි සාමාජිකයන් පිළිබඳ හැඳින්වීම

1983 නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයෙකු ලෙස ලියාපදිංචි වූ අතර පසුව 1984 ජූලි මාසයේදී නීතිපති දෙපාර්තමේන්තුවට බැඳුණි. 1990-91 අධ්‍යයන වර්ෂයේදී ඔහු London University College හි මහජන ජාත්‍යන්තර නීතිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබා ගත් අතර 1991 වර්ෂයේදී ඔහු එංගලන්තයේ සහ වේල්සයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ සොලිසිටර්වරයෙකු ලෙස ලියාපදිංචි විය.

ජයවර්ධන මහතා ගුවන්සේවා නීති ක්ෂේත්‍රයේ විශාල පළපුරුද්දක් දරයි. කලක් සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුවේ නීති උපදේශකයෙකු ලෙස කටයුතු කල ඔහු, සිවිල් ගුවන්සේවා අධිකාරී පනත සහ සිවිල් ගුවන්සේවා පනත කෙටුම්පත් කිරීමට සක්‍රීයව දායක වුයේය.

ඔහු රටවල් විශාල සංඛ්‍යාවක් සමඟ ද්විපාර්ශ්වික ගුවන්සේවා ගිවිසුම් ගණනාවක සාකච්ඡාවලට සහභාගී වී ඇති අතර, 2004 වසරේ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වී 2013 ජූලි දක්වා එම තනතුරේ කටයුතු කර ඇත. සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ඔහු 2019 දෙසැම්බර් මාසයේ සිට එම තනතුරේ කටයුතු කරයි. ඔහු 1996 සිට රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ නීති උපදේශකයින්ගේ කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස ද කටයුතු කළේය.

මෙම කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස ඔහු 1996 සිට 2005 දක්වා රජය විසින් සිදු කරන ලද රජයේ ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රමුඛතම වැඩසටහන් සියල්ලටම පාහේ සහභාගී වී ඇත. ඔහු ජාතික ගුවන් සේවය වන එයාර් ලංකා පුද්ගලීකරනය, කොළඹ වරාය, වැවිලි, රක්ෂණ සහ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයන් හි ඇතැම් කොටස් පුද්ගලීකරණය කිරීම වැනි ක්‍රියාවලීන්ට දායක වී ඇත. 2003 අප්‍රේල් මාසයේදී ඔහු මෙම නීති උපදේශක කණ්ඩායමේ නායකයා වූ අතර 2005 මැයි මාසයේදී රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා තෙක් එම තනතුරේ කටයුතු කළේය. 2002 වර්ෂයේදී නීතිපති දෙපාර්තමේන්තුවේ සංස්ථා අංශයේ සමස්ත පරිපාලනය භාරව ඔහු පත් කරන ලද අතර, මෙම අංශය රජයේ සංස්ථා 200 ක පමණ නීතිමය කටයුතු මෙහෙයවීය.

ඔහු 1993 මැයි මාසයේ සිට සමාගම් නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට සහභාගී වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස 2007 අංක 7 දරන සමාගම් පනත බලාත්මක විය. ඔහු මුලින් ක්‍රියා කළේ ප්‍රතිසංස්කරණ අවශ්‍ය ක්ෂේත්‍ර පිළිබඳ අධ්‍යයනයන් සිදු කිරීම සඳහා පත් කරන ලද අනු කමිටුවක ලේකම්වරයා ලෙස වන අතර, ඉන් පසුව සමාගම් නීති උපදේශක කොමිෂන් සභාවේ පර්යේෂණ සම්බන්ධීකාරකවරයා ලෙස ලොව පුරා සමාගම් නීති ප්‍රතිසංස්කරණ පිළිබඳ පුළුල් පළපුරුද්දක් ඇති ලෝක බැංකු උපදේශකයෙකු සමඟද ඔහු කටයුතු කළේය. කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියේ ඔහුගේ සැලකිය යුතු දායකත්වය අගයමින් 1998 අගෝස්තු මාසයේදී ඔහු සමාගම් නීති උපදේශක කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස පත් කරන ලද අතර ඔහු එහි 2008 අගෝස්තු දක්වා සේවය කළේය.

2002 සිවිල් ගුවන්සේවා අධිකාරී පනත සහ 2010 සිවිල් ගුවන්සේවා පනත කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට සහ ඊට පෙර පැවති පෞරාණික නීති තන්ත්‍රය වෙනුවට හඳුන්වා දුන් නවීන සංකල්ප ප්‍රවර්ධනය කිරීමට ඔහු ක්‍රියාකාරීව සහභාගී වූ අතර, 2005 මැයි මාසයේදී නැවත පුද්ගලික නීතිඥ මණ්ඩලයට ඔහු පැමිණියේය. 1997 වර්ෂයේ සිට ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු සහ වාණිජ නීති පරීක්ෂකවරයකු ලෙස ඔහු සේවය කරන අතර, ශ්‍රී ලංකා නීති අධ්‍යාපන කවුන්සිලයේ උසස් නීති අධ්‍යයන ආයතනයේ ආයතනික නීතිය පිළිබඳ කථිකාචාර්යවරයකු ද වේ.

ඔහු සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුව, සිවිල් ගුවන්සේවා අධිකාරිය, නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ නීති උපදේශකවරයෙකු ලෙස කටයුතු කළේය. 2004 සිට 2015 දක්වා ඔහු කොළඹ හිල්ටන් හෝටලයේ හිමිකාරිත්වය දරන හෝටල් ඩිවෙලොපර්ස් (ලංකා) සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කර ඇති අතර, සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සීමාසහිත ශ්‍රී ලංකා ලිබියා කෘෂිකාර්මික සහ පශු සම්පත් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද, සීමාසහිත ලංකා සතොස සමාගමේ අධ්‍යක්ෂ සහ ආරම්භක සභාපතිවරයාද විය.

ගුවන්සේවා නීතිය, රාජ්‍ය නීති සංස්ථාපිත සහ වාණිජ නීතිය පිළිබඳ කීර්තිමත් උපදේශකයෙකු ලෙස ඔහු නීති වෘත්තියට කළ දායකත්වය අගයමින් 2012 වර්ෂයේදී ඔහු ජනාධිපති නීතිඥවරයකු ලෙස පත් කරන ලදී. ඔහු 2021 දී කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත කෙටුම්පත් කර අවසන් කළ කෙටුම්පත්කරුවන් තිදෙනෙකුගෙන් යුත් මණ්ඩලයේ සාමාජිකයෙකු ද විය. ඔහු සමාගම් නීති උපදේශක කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස කටයුතු කරන අතර හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු ද වේ.



"සැමට නිරුපද්‍රත සහ කාර්යක්ෂම අහසක්"

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය



සාරධර්ම
CAASL සහ එහි සේවකයින්:

- ගුවන්සේවා සුරක්ෂිතභාවයට ඉහළ ප්‍රමුඛතාවක් දීම සහ වැදගත්කමක් නියම කිරීම තුළින් සුරක්ෂිත සංස්කෘතියක් ප්‍රවර්ධනය කළ යුතුය.
- CAASL හි සේවාලාභීන්ට සේවා සැපයීමේ විශිෂ්ටයෙකු විය යුතුය.
- භාරගන්නා සෑම කාර්යයකදීම "කළ හැකිය" යන ආකල්පයෙන් යුතුව ක්‍රියා කළ යුතුය.
- විශ්වසනීය බව, යථාර්ථවාදී බව සහ ස්ථීර බව අරමුණු කර ගත යුතුය.
- අඛණ්ඩ දියුණුවක් උදෙසා වෙනස් වීමට හැකියාවක් සහ අපේක්ෂාවක් තිබිය යුතුය.
- සාර්ථකත්වය උදෙසා එක්ව කටයුතු කළ යුතුය.
- විවෘතව, අවංකව සහ විනිවිදභාවයෙන් යුතුව කටයුතු කළ යුතුය.
- සිදුකරන සෑම දෙයකම කාර්යක්ෂමතාව, ඵලදායීතාවය සහ විධිමත් බව ප්‍රවර්ධනය කළ යුතුය.
- සගයන් කෙරෙහි විශ්වාසය හා ගෞරවය දක්වමින් කණ්ඩායමක් ලෙස ක්‍රියා කළ යුතුය.
- සෑමගේ දායකත්වය අගය කළ යුතුය.
- සමාජ වගකීම් සහ යුතුකම් හඳුනා ගත යුතුය.
- සිදුකරන කාර්යයන් තුළින් තෘප්තිමත් විය යුතුය.
- වෘත්තීය ප්‍රවේශය ගැන ආඩම්බර විය යුතුය.
- රැකියා දිවියේ සහ ගෘහ පරිසරයේ සමබරතාවයක් පවත්වාගෙන යා යුතුය.

දර්ශනය

අපට ඉහළින් ඇති ගුවන් අවකාශය, අප රටේ ප්‍රගතිය, සමෘද්ධිය සහ අපගේ අනාගත පරම්පරාව සඳහා කළමනාකරණය කළ යුතු, සමාජ-ආර්ථික සංවර්ධනය සඳහා විශාල විභවයක් සහිත පොදු සම්පතකි.

අරමුණු

- ආරක්ෂාව සහ ආරක්ෂක ඉලක්ක සපුරා ගැනීම සහ ඒවා අභිබවා යාම.
- අපේ වටිනා සම්පත් නිසි ලෙස භාවිත කිරීම.
- වෘත්තීයමය වීම හා කාර්යක්ෂම වීම.
- පුළුල් වූ විශ්වසනීයත්වයක් සහ පිළිගැනීමක් අත්කර ගැනීම.
- නවමු ජයග්‍රහණ ලබා ගැනීම සහ වැඩි දියුණු වීම.
- සිදු කරන සෑම කටයුත්තකම ඉහළම ඵලදායීතාව අත්කර ගැනීම.
- ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නිර්දේශිත පිළිවෙත් සමඟ ඉහළ මට්ටමක අනුකූලතාවක් පවත්වා ගැනීම
- සිවිල් ගුවන්සේවා සැලසුම් කිරීම හා සංවර්ධනය සඳහා ශක්තිමත් පහසුකම් සැපයුම්කරුවෙකු වීම.

අපේක්ෂිත ප්‍රතිඵල

- අප රාජ්‍යය සතු සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ වගකීම් ඉටු කිරීම සහ ඒවා ජාත්‍යන්තර ප්‍රමිතීන් හා නිර්දේශිත පිළිවෙත් වලට අනුකූලව, ඉතා ඉහළ ඵලදායීතාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම.
- ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා පද්ධතිය ජාත්‍යන්තරව පිළිගන්නා අතර, සම්බාධක සහ බාධා පැමිණීම්, සහ මගහැරීම්වලින් තොරව, ICAO විසින් රජයේ ගුවන්සේවා පද්ධතියට එරෙහිව අනිසි අයුරින් ආරක්ෂිත ගැටලු මතු කිරීම වළක්වා ගැනීම.
- සිවිල් ගුවන්සේවාවෙහි ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ විධිමත්භාවය සහ ගුවන් ප්‍රවාහන පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසය වැඩි දියුණු කිරීම.
- පාරිභෝගික තෘප්තිය වැඩි කිරීම සහ අධිකාරියේ මූල්‍ය කාර්යසාධනය වැඩි දියුණු කිරීම.

උපායමාර්ග

- ව්‍යවස්ථාපිත කාර්යයන් වැඩිදියුණු කිරීම, ස්ථාවර ලෙස ක්‍රියාත්මක කිරීම සහ අදාළ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ නිර්දේශිත පිළිවෙත්වලට අනුකූලව සමාජ වගකීම් ඉටු කිරීම
- විශේෂ ගුවන්සේවා ගැටලු සඳහා විසඳුම් හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම.
- විශේෂිත සංස්කෘතික වෙනස්කම් වලට මුලපිරීම සහ හඳුන්වා දීම.
- ගුවන්සේවා කර්මාන්තය සමඟ එක්ව සහයෝගයෙන් කටයුතු කිරීම.
- විනිවිදභාවයකින් ක්‍රියා කිරීම සහ අභ්‍යන්තර සහ අභ්‍යන්තර ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීම.
- සියලුම ලිපි ලේඛන හා අභ්‍යන්තර ක්‍රියා පටිපාටිවල ඵලදායීතාවය හා අනුකූලතාව පවත්වා ගැනීම.

CAASL හි ආසන්නතම ඉලක්ක

- වාණිජ ගුවන්සේවා අංශයට අදාළව සිදුවිය හැකි මාරාන්තික අනතුරු වලක්වා ගැනීම.
- ගුවන්සේවා පැහැර ගැනීම් සහ සිවිල් ගුවන්සේවා කාර්යයන්හි සිදු වන නීති විරෝධී මැදිහත්වීම් වලක්වා ගැනීම.
- සාමාන්‍ය අනතුරු වලක්වා ගැනීම.
- ගුවන්තොටුපළ භූමියේ සිදුවන මාරාන්තික ගුවන්යානා අනතුරු වලක්වා ගැනීම.
- ඉංජිනේරු කටයුතු/නඩත්තු වැඩමුළු වල ඇතිවිය හැකි අනතුරු අවම කර ගැනීම.
- ගුවන්සේවා අහිසි සිටුවීම් අවම කිරීම.
- "නියමිත වේලාවට" පිටත්වීමෙහි ප්‍රමාදය අවම කිරීම සඳහා සහාය වීම.
- ගුවන් ගමන් සේවාවේ ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට දිරිමත් කිරීම.
- ආරක්ෂක අවශ්‍යතා ගැන සැලකිලිමත් වෙමින් ගුවන්තොටුපළවල තදබදය අවම කිරීම සහ මගීන් පිරිසැකසුම් කිරීම වේගවත් කිරීම.
- ගුවන් ප්‍රවාහනයේ මෙහෙයුම් පිරිවැය සහ අපද්‍රව්‍ය අවම කිරීමට උපකාරී වීම.
- ගුවන්සේවාවෙන් පරිසරයට ඇති වන අහිතකර බලපෑම් අවම කිරීම සඳහා සහය වීම.
- සිවිල් ගුවන් සේවයේ ප්‍රතිලාභ පිළිබඳව පාසල් දරුවන් දැනුවත් කිරීම.
- මීළඟ පරම්පරාව උදෙසා ගුවන්සේවා වෘත්තිකයන් සූදානම් කිරීම.

ප්‍රතිදානය

ප්‍රතිදාන වර්ගය	ප්‍රතිදානය
ප්‍රතිපත්තිමය උපදෙස්	රජයට සහ වෙනත් සංවිධානවලට උපදෙස් ලබා දීම
	ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය
	රීති විකාශනය
	ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති විකාශනය සහ පළ කිරීම
	ගුවන්සේවා ප්‍රතිපත්ති සංවර්ධනය කිරීම
	ක්‍රියා පටිපාටි අත්පොත් සංවර්ධනය කිරීම
	ගුවන්සේවා යටිතල පහසුකම් පිළිබඳව සැලැස්මක් සකස් කිරීම
නිරුපද්‍රතතා තක්සේරුව සහ සහතික කිරීම	ගුවන් තොටුපල/ගුවන් තොටුපල නිරුපද්‍රතතාවය පිළිබඳ අවදානම් කළමනාකරණය
	ගුවන් ප්‍රවාහන අංශයේ සහ පොදුවේ ගුවන්සේවා අංශයේ නිරුපද්‍රතතාවය
	පුද්ගල බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ නිරුපද්‍රතතාවය
	පියාසර පුහුණුවන් වල නිරුපද්‍රතතාවය
	ගුවන් යානා නඩත්තු කිරීමේ නිරුපද්‍රතතාවය සහ ගුවන්සේවා අංශයේ අවදානම් කළමනාකරණය
නිරුපද්‍රතතා විශ්ලේෂණය, තොරතුරු සහ ප්‍රවර්ධනය	නිරුපද්‍රතතා විමර්ශනය
	නිරුපද්‍රතතා විශ්ලේෂණය
	නිරුපද්‍රතතාවය පිළිබඳ තොරතුරු, අධ්‍යාපනය ලබා දීම සහ ප්‍රවර්ධනය
	ගුවන්යානා අනතුරු සිදුවීම් විමර්ශනය කිරීම සහ නිරුපද්‍රතතා නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම
අනුමැති ලබා දීම්	ගුවන්සේවා කාලසටහනන් අනුමත කිරීම
	ගුවන් ගමන් ගාස්තු අනුමත කිරීම
	සංචාරක නියෝජිත සහතිකය
	ගුවන් යානා ලියාපදිංචි කිරීම
	ගුවන් යානා අමතර කොටස් ආනයනය සඳහා අවසර ලබා දීම
	උස් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දීම
	පොදු වෙළඳ නියෝජිතයින් සඳහා අනුමැතිය ලබා දීම
	ජාත්‍යන්තර කාර්යකරණයන් සඳහා දේශීය ගුවන් ප්‍රවාහන සමාගම් නම් කිරීම
නිරුපද්‍රතතා තක්සේරුව සහ සහතික කිරීම	සිවිල් ගුවන්සේවා අංශයේ ආරක්ෂක අවදානම් කළමනාකරණය
බලාත්මක කිරීම්	නියාමන කඩකිරීම් කෙරෙහි ප්‍රතිචාර දැක්වීම
	මහජන සෞඛ්‍යය සහ සනීපාරක්ෂක අවශ්‍යතා බලාත්මක කිරීම
රජයට සහාය දැක්වීම	ගුවන් ප්‍රවාහන සමාගම් වෙතින් අපගමන බදු අයකර ගැනීම

නියාමන විෂය පථය

2022 වර්ෂය අවසන් වන විට සිවිල් ගුවන්සේවා අධිකාරියේ නියාමන විෂය පථය පහත පරිදි විය.

නියාමන ක්ෂේත්‍රය	2022	2021	වෙනස (%)
ගුවන්තොටුපළ			
අභ්‍යන්තර ගොඩබිමි ගුවන්තොටුපළ	**10**	11	-9%
අභ්‍යන්තර ජල යාත්‍රා අංගන	**11**	11	-
ජාත්‍යන්තර ගුවන්තොටුපළ	**4**	3	33%
ගුවන් සමාගම්			
අභ්‍යන්තර ගුවන් සේවයෙහි නිරත වන දේශීය ගුවන් සමාගම්	**5**	5	-
ජාත්‍යන්තර ගුවන් සේවයෙහි නිරත වන දේශීය ගුවන් සමාගම්	**2**	2	-
ජාත්‍යන්තර විදේශීය ගුවන් සමාගම්	**31**	36	-14%
පුහුණු සංවිධාන			
පියාසර පාසල්	**8**	8	-
වර්ගීකරණ පුහුණු සංවිධාන	**2**	2	-
ඉංජිනේරු/නඩත්තු පාසල්	**4**	4	-
සිවිල් ගුවන්සේවා පුහුණු මධ්‍යස්ථාන	**1**	1	-
ගුවන් සංතරණය			
ගුවන් සංතරණ සේවා සැපයුම්කරුවන්	**1**	1	-
ගුවන්යානා ලියාපදිංචිය සහ ගුවන් යෝග්‍යතාව			
මහා පරිමාණයේ ගුවන්යානා (ගුවන්ගත කිරීමේ උපරිම බර කි.ග්‍රෑ. 5700 සහ ඊට වැඩි)	**30**	25	20%
කුඩා පරිමාණයේ ගුවන්යානා (ගුවන්ගත කිරීමේ උපරිම බර කි.ග්‍රෑ. 5700 ට අඩු)			
සැහැල්ලූ ප්‍රවාහන ගුවන්යානා	**41**	43	-5%
අධි සැහැල්ලූ ගුවන්යානා	**1**	1	-
හෙලිකොප්ටර්	**7**	7	-
උෂ්ණ වායු බැලූන	**4**	4	-
කෘතිම පුහුණු උපක්‍රම/පියාසර පුහුණු උපක්‍රම			
දේශීය පූර්ණ පියාසර අනුකාරක - A 320/A 330/ Integrated Panel Trainer	**3**	3	-
ගුවන් ගමන් පාලන අනුකාරක (ATC)	**1**	1	-
පුද්ගල බලපත්‍ර			
ශිෂ්‍ය නියමු බලපත්‍රලාභීන්	**145**	211	-31%
පෞද්ගලික නියමු බලපත්‍රලාභීන්	**124**	173	-28%
වාණිජ නියමු බලපත්‍රලාභීන්	**174**	306	-43%
ගුවන් ප්‍රවාහන නියමු බලපත්‍රලාභීන්	**293**	448	-35%
ගුවන් ගමන් පාලන බලපත්‍රලාභීන්	**45**	54	-17%
ගුවන්යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍රලාභීන්	**-**	1	-100%
ගුවන්යානා නඩත්තු බලපත්‍රලාභීන්	**60**	81	-26%
ගුවන්යානා පිටත්කර හැරීමේ බලපත්‍රලාභීන්/ගුවන් මෙහෙයුම් නිලධාරී බලපත්‍රලාභීන්	**-**	1	-100%
ගුවන්යානා සේවාස්ථාන ක්‍රියාකාරක බලපත්‍රලාභීන්	**1**	-	*1 කින් වැඩි විය
ගුවන් මැදිරි කාර්ය මණ්ඩල සාමාජික සහතිකලාභීන්	**253**	176	44%
පියාසර උපදේශකවරුන්	**7**	1	600%
සහකාර පියාසර උපදේශකවරුන්	**-**	8	-100%
භූමි උපදේශක බලපත්‍රලාභීන්	**-**	3	-100%
ගුවන් පරීක්ෂකවරුන්	**6**	6	-
නම් කරන ලද සෝදිසි නියමුවන්	**20**	20	-
සිවිල් ගුවන්සේවා වෛද්‍ය පරීක්ෂකවරුන්/වෛද්‍ය තක්සේරුකරුවන්	**6**	6	-
සහතික කළ ගුවන්සේවා ආරක්ෂක පිරික්සුම්කරුවන්	**747**	648	15%
සහතික කළ ගුවන්සේවා ආරක්ෂක උපදේශකවරුන්	**19**	14	36%
සහතික කළ ගුවන්සේවා ආරක්ෂක කළමනාකරුවන්	**19**	20	-5%
ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරුවන්			
ගෝලීය බෙදාහැරීමේ සේවා සැපයුම්කරුවන්	**3**	4	-25%
ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරු බලපත්‍රලාභීන්	**442**	309	43%
ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරු බලපත්‍රය - අ කාණ්ඩය	**420**	298	41%
ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරු බලපත්‍රය - ආ කාණ්ඩය	**22**	11	100%
සාමාන්‍ය අලෙවි නියෝජිතයන්	**23**	23	-

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි පාලනය සහ වගකීම

අධිකාරියෙහි කාර්යභාරය

- අධිකාරියෙහි ප්‍රධාන කාර්යභාරයට අයත් කාර්යයන් අතර පහත සඳහන් දෑ ප්‍රමුඛත්වයක් ගනී.
- තම අදහස් රටේ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රය සැලසුම් කිරීමේ දී පිළිබිඹු වන බව සහතික කිරීම සඳහා සිවිල් ගුවන්සේවා විෂය භාර ගරු අමාත්‍යවරයා සහ අනෙකුත් රජයේ පාර්ශ්වකරුවන් සමඟ සන්නිවේදනය කිරීම;
- සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ ප්‍රතිපත්ති සහ ඉලක්ක සැකසීම සහ CAASL හි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ආයතනික කාර්යසාධනය අධීක්ෂණය කිරීම සහ අදාළ වන පරිදි සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රය තුළ රජයේ අරමුණු පිළිබිඹු කිරීම සඳහා CAASL හි ආයතනික සැලැස්ම යාවත්කාලීන කිරීම;
- CAASL හි ප්‍රධාන විධායක නිලධාරියා ද වන සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වගකීම පැවරීම;
- CAASL හි කාර්යයන් සහ රාජකාරි ඉටු කිරීමට හැකි වන පරිදි සුදුසුකම් ලත් සහ කුසලතා සපිරි පුද්ගලයන් සේවයේ යෙදවීම සහ ඔවුන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නිර්ණය කිරීම;
- CAASL හි ආයතනික සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ සැලසුම් සහ ප්‍රගතිය පිළිබඳ සිවිල් ගුවන්සේවා විෂය භාර ගරු අමාත්‍යවරයාට වගකීම;

අධ්‍යක්ෂ මණ්ඩල සාමාණිකයින්

ගුවන්සේවා හා සංචාරක ගරු අමාත්‍යතුමා විසින් 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත යටතේ ඔහුට පැවරී ඇති බලතල අනුව සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයන් පත් කරන ලදී. සභාපති ලෙස උපුල් ධර්මදාස CTC මහතා සහ උපසභාපති ලෙස අමිත විජයසූරිය මහතා පත් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ පාලනය

අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සතුව ව්‍යාපාර සහ පරිපාලන, මූල්‍ය, නෛතික සහ ගුවන්සේවා ක්ෂේත්‍රවල විවිධ කුසලතා සහ පළපුරුද්ද ඇති බැවින් ඔවුන් විසින් සිවිල් ගුවන්සේවා සම්බන්ධ ප්‍රතිපත්තිමය ගැටලු පිළිබඳව පුළුල් පරාසයක අදහස් හා මත පළ කරනු ලැබේ. පත් කරනු ලැබීමෙන් පසු, සියලුම සාමාජිකයන් සිවිල් ගුවන්සේවා අධිකාරියේ යහපත වෙනුවෙන් ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කරන අතර අධිකාරිය එහි තීරණ සම්බන්ධයෙන් ඒකමතිකව සිටිය යුතු බවත්, තනි තනි සාමාජිකයන්ට අධිකාරියෙන් පිටත වෙනම පාලන භූමිකාවක් නොමැති බවත් පිළිගත යුතුය.

යෝග්‍ය ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සැකසීම මගින් CAASL හි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බලතල සහ කාර්යයන් පැවරීමෙන් අධිකාරිය විසින් ප්‍රධාන විධායක නිලධාරියා මෙහෙයවනු ලැබේ. අධිකාරියේ ඉදිරි සැලසුම් එහි ත්‍රෛවාර්ෂික ආයතනික සංයුක්ත සැලැස්මට ඇතුළත් කර ඇති අතර සෑම වසරකම ආරම්භයේ දී අධිකාරිය විසින් අනුමත කරනු ලබන වාර්ෂික වැඩසටහන, පුහුණු වැඩසටහන, ප්‍රතිසම්පාධන වැඩසටහන, වැඩසටහන් අයවැය සහ විගණන වැඩසටහන හරහා ඵලදායී ලෙස අධීක්ෂණය කරනු ලැබේ. දැනට නිශ්චිත විධිවිධාන නොමැති සියලුම කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා හරහා අධිකාරිය ප්‍රධාන විධායක නිලධාරිතුමා වෙත උපදෙස් ලබා දෙන අතර එවැනි යෝජනා බලාත්මක කිරීම ප්‍රධාන විධායක නිලධාරිතුමාගේ යුතුකම වේ.

අධිකාරියේ විධායක බලතල

2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතට අනුව, අමාත්‍ය මණ්ඩලය විසින් සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරනු ලබන අතර, ඔහු සිවිල් ගුවන්සේවා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරිවරයා ලෙස ද ව්‍යවස්ථාව අනුව ක්‍රියා කරයි.

අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන එකී සේවා නියමයන් සහ කොන්දේසිවලට ඔහු යටත් විය යුතු අතර ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත මගින් හෝ අදාළ වන වෙනත් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ ඔහුට/ඇයට පවරා ඇති සියලුම රාජකාරි සහ කාර්යයන් ඉටු කළ යුතුය. එසේම අධිකාරියේ කාර්යයන් පිළිබඳ සාමාන්‍ය පරිපාලනය සම්බන්ධයෙන් වන වගකීම් ද පැවරෙනු ඇත. සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට ව්‍යවස්ථාපිතව පැවරී ඇති කාර්යයන් සම්බන්ධයෙන් ඔහු ස්වාධීනව කටයුතු කරනු ඇතැයි අධිකාරිය විසින් පිළිගැනේ. කෙසේ වෙතත්, එවැනි රාජකාරි සහ කාර්යයන් ඉටු කිරීමේ දී, ඔහුට CAASL හි සම්පත් අනුමත ක්‍රියා පටිපාටි සහ මාර්ගෝපදේශයන් යටතේ භාවිත කළ හැකිය.

අධිකාරී කමිටු

අධිකාරිය ස්ථාවර කමිටු පහක් (05) පිහිටුවා ඇත.

1. කාර්ය මණ්ඩල කමිටුව
2. විගණන හා කළමනාකරණ කමිටුව
3. සැලසුම් කමිටුව
4. සිවිල් ගුවන්සේවා සංවර්ධන හා අධ්‍යාපන කමිටුව (CADEC)
5. NGAP ශ්‍රී ලංකා වැඩසටහන ජාතික කමිටුව

කාර්ය මණ්ඩලයෙහි ගැටළු නිරාකරණය, විගණන සහ කළමනාකරණ ක්‍රියාකාරකම්, සිවිල් ගුවන්සේවා දැනුවත් කිරීමේ ක්‍රියාකාරකම් සහ සංවර්ධන සැලසුම් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ විශේෂිත කරුණු කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම මෙම කමිටුවල අරමුණ වේ. අධිකාරියේ අරමුණු සපුරාලීම, නියමිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා සංවිධානයේ ප්‍රගතිය ඇති කිරීමට සහ අධීක්ෂණය කිරීම සඳහා සෑම කමිටුවකටම බලතල පවරා ඇත. පහත සඳහන් කවර හෝ කාරක සභාවකට බලතල සහ කාර්යයන් පැවරීම නොතකා, මණ්ඩලයට අවශ්‍ය යැයි සලකනු ලබන වැනි ඕනෑම හෝ සියලු කරුණු සම්බන්ධයෙන් එහි බලතල දිගටම ක්‍රියාත්මක කළ හැකිය.

කාර්යමණ්ඩල කමිටුව

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කාර්ය මණ්ඩල කමිටුව අධිකාරියට වගකිව යුතුය;

- ආයතනික ව්‍යුහයක් සම්මත කර ගැනීම සහ අවශ්‍ය විටෙක, අවශ්‍ය පරිදි එය වෙනස් කිරීම;
- වැටුප් හා සේවක සංඛ්‍යාව තීරණය කිරීම;
- තෝරා ගැනීම, බඳවා ගැනීම, පත්කිරීම, උසස් කිරීම, පහත හෙළීම, විශ්‍රාම ගැන්වීම/සේවයෙන් පහ කිරීම යනාදි අදාළ සේවකයන්ගේ කටයුතු;
- අවශ්‍ය විටදී, අවශ්‍ය පරිදි බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සංවර්ධනය කිරීම හෝ සංශෝධනය කිරීම;
- CAASL සඳහා මාණ්ඩලික රීති සහ පරිපාලන ක්‍රියා පටිපාටි සංවර්ධනය කිරීම;
- CAASL සඳහා කාර්යාල පටිපාටි සංවර්ධනය;
- සේවකයන් පිළිබඳ විනය ක්‍රියාමාර්ග ගැනීම
- CAASL සේවකයන් සඳහා විනය පටිපාටි සංවර්ධනය කිරීම;
- CAASL ආයතනික සැලැස්ම අවශ්‍ය විටදී, අවශ්‍ය පරිදි සංශෝධනය කිරීම හෝ යාවත්කාලීන කිරීම;
- CAASL හි වාර්ෂික වැඩසටහන සහ පුහුණු ප්‍රතිපත්ති, ක්‍රියා පටිපාටි සහ වැඩසටහන අධීක්ෂණය කිරීම;
- සේවකයන් සඳහා විදේශීය පුහුණුව සඳහා අනුමැතිය ලබා දීම සහ CAASL සේවකයන් සඳහා ශිෂ්‍යත්ව ප්‍රධානය කිරීම;
- චංචල හෝ නිශ්චල දේපළ අත්පත් කර ගැනීම සහ/හෝ එවැනි දේපළ සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අනුමැතිය ලබා දීම;
- DCL සේවකයන් සඳහා කල් නොපිරුණු විශ්‍රාම හෝ වෙන්වීම සඳහා වන වන්දි යෝජනා ක්‍රම සංවර්ධනය කිරීම,
- CAASL සේවකයන් සඳහා සමාජ සහ සුභසාධන යෝජනා ක්‍රම සංවර්ධනය කිරීම.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි පාලනය සහ වගකීම

CAASL හි පහත සඳහන් සාමාජිකයන්ගෙන් කාර්ය මණ්ඩල කමිටුව සමන්විත වේ.

- උපුල් ධර්මදාස මහතා (සභාපති) - 2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා
- පී. ඒ. ජයකාන්ත මහතා (සාමාජික) - 2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා
- නිහාල් ජයවර්ධන මහතා, ජනාධිපති නීතීඥ (සාමාජික) - 2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා

විගණන සහ කළමනාකරණ කමිටුව

පහත සඳහන් කරුණු සඳහා විගණන හා කළමනාකරණ කමිටුව වගකිව යුතුය;

- තත්ව සහ අභ්‍යන්තර විගණන අංශයේ වගකීම තීරණය කිරීම සහ වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම;
- ආයතනයේ සියලුම ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කිරීම සහ ඇගයීම;
- පිරිවැය ඵලදායිතාව සහතික කිරීම සහ නාස්තිකාර වියදම් ආදිය ඉවත් කිරීම සඳහා නියමිත කාල පරාසයන් තුළ කාර්ය සාධනය සමාලෝචනය කිරීම;
- බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධ වීම සහ විගණකාධිපතිගේ කළමනාකරණ ලිපි පසු විපරම් කිරීම;
- ව්‍යවස්ථාව, රෙගුලාසි, නීති සහ චක්‍රලේඛ අනුකූලද යන්න තහවුරු කර ගැනීම;
- ගිණුම්කරණ ප්‍රමිතීන් සමග වන අනුකූලතාව සහතික කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය කිරීම;
- නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග සඳහා අභ්‍යන්තර විගණන/බාහිර විගණන වාර්තා සහ කළමනාකරණ ලිපි සමාලෝචනය කිරීම;
- රාජ්‍ය ව්‍යවසාය කමිටුවේ නිර්දේශ/නියෝග ක්‍රියාත්මක කිරීම සහ සමාලෝචනය කිරීම;
- වාර්ෂික වාර්තාවට ඇතුළත් කිරීම සඳහා කමිටුවේ නිගමන පිළිබඳ වාර්තාව සකස් කිරීම;
- සියලුම විගණන කටයුතු පිළිබඳව අධිකාරිය විසින් ඉල්ලා සිටින විට සහ ඉල්ලා සිටින පරිදි අධිකාරිය වෙත වාර්තා කිරීම.

විගණන සහ කළමනාකරණ කමිටුව පහත සාමාජිකයන්ගෙන් සමන්විත වේ.

- අයන්ති ද සිල්වා මෙනවිය - සභාපතිනිය (2020 ජනවාරි 21 සිට 2022 පෙබරවාරි 25 දක්වා)
- චමින්ද වෙලේගම මහතා - සාමාජික (2020 ජනවාරි 21 - 2022 ජූනි 15)
- අවන්ති සේනාරත්න මෙනවිය - සාමාජික (2020 අගෝස්තු 27 - 2022 ජූනි 15)
- ජේ. සී. වැලිගමගේ මහත්මිය - සභාපති (2022 මාර්තු 15 - 2022 අගෝස්තු 18)
- ඒ.කේ. සෙනෙවිරත්න මහතා - සභාපති (2022 ඔක්තෝබර් 7 - මේ දක්වා)
- කපිතාන් මිලින්ද රත්නායක - සාමාජික (2022 ඔක්තෝබර් 7 - මේ දක්වා)
- එයාර් වයිස් මාර්ෂල් සාගර කොටකදෙණිය - සාමාජික (2022 ඔක්තෝබර් 7 - මේ දක්වා)

සැලසුම් කමිටුව

පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සැලසුම් කමිටුව අධිකාරියට වගකිව යුතුය;

- ජාතික සිවිල් ගුවන්සේවා ප්‍රතිපත්තිය සකස් කිරීම.
- ජාතික සිවිල් ගුවන්සේවා සංවර්ධන සැලැස්මක් සකස් කිරීම.
- සිවිල් ගුවන්සේවා සම්බන්ධ අනුබද්ධ නීති සමාලෝචනය කිරීම සහ අවශ්‍ය නම් සංශෝධන හඳුන්වා දීම.
- ජාතික සිවිල් ගුවන්සේවා ආරක්ෂණ වැඩසටහන අධීක්ෂණය සහ ක්‍රියාත්මක කිරීම.
- ජාතික ගුවන් ප්‍රවාහන පහසුකම් සැලසීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.
- සිවිල්-හමුදා සම්බන්ධීකරණය අධීක්ෂණය.
- ගුවන්සේවා මෙහෙයුම් අධීක්ෂණය.
- ගුවන්සේවා සැපයුම්කරුවන්ගේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම.

සිවිල් ගුවන්සේවා සංවර්ධන හා අධ්‍යාපන කමිටුව (CADEC)

සිවිල් ගුවන්සේවා සංවර්ධන සහ අධ්‍යාපන කමිටුව (CADEC) 2010 අගෝස්තු මාසයේදී පිහිටුවන ලද්දේ අනාගත පරපුර (පාසල් දරුවන්) සහ සිවිල් ගුවන්සේවා කටයුතු පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම අරමුණු කරගත් විශේෂ වැඩසටහන් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා ය. මෙම කමිටුව ඇධ්ක් සහ ප්‍රධාන විධායක නිලධාරී විසින් ප්‍රධානත්වය දරන අතර අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහාය ලැබේ. DGCA විසින් නම් කරන ලද සහ මණ්ඩලය විසින් අනුමත කරන ලද විට සහ CAASL හි සේවකයින් වන සාමාජිකයින් එහි අඩංගු විය හැකිය.

NGAP ශ්‍රී ලංකා වැඩසටහන පිළිබඳ ජාතික කමිටුව

ශ්‍රී ලංකාවේ "ඊළඟ පරම්පරාව උදෙසා ගුවන්සේවා වෘත්තිකයන්ගේ" (NGAP) වැඩසටහන පිළිබඳ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) සංකල්පය.

නුදුරු අනාගතයේ දී අපේක්ෂිත දක්ෂ ගුවන්සේවා වෘත්තිකයන්ගේ හිඟයක් ඇති වනු ඇතැයි ජාත්‍යන්තර ගුවන්සේවා ප්‍රජාව විසින් පිළිගෙන ඇත. එබැවින්, මෙම ගැටලුව විසඳීම සඳහා, අනාගත ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන පද්ධතිය ක්‍රියාත්මක කිරීමට, කළමනාකරණය කිරීමට සහ පවත්වාගෙන යාමට වඩාත් සුදුසුකම් සහිත දක්ෂ ගුවන්සේවා වෘත්තිකයන් සිටින බව සහතික කිරීම සඳහා ICAO විසින් "ඊළඟ පරම්පරාව උදෙසා ගුවන්සේවා වෘත්තිකයන්" (NGAP) යනුවෙන් මුලපිරීමක් හඳුන්වා දෙන ලදී.

NGAP ශ්‍රී ලංකා වැඩසටහනට එහි මෙහෙවර, දැක්ම, අරමුණු සහ ප්‍රධාන ක්‍රියාකාරී සැලැස්මට අදාළ වගකීම් සඳහා NGAP ශ්‍රී ලංකා වැඩසටහන පිළිබඳ ජාතික කමිටුව විසින් සහය දක්වනු ලැබේ.

NGAP ශ්‍රී ලංකා වැඩසටහනේ අරමුණු පහත පරිදි වේ;

- ගුවන්සේවා කර්මාන්තයේ පාර්ශ්වකරුවන්ගේ දිගුකාලීන මානව සම්පත් අවශ්‍යතා හඳුනා ගැනීමේ දී සහ ගුවන්සේවා වෘත්තිකයන් ආකර්ෂණය කර ගැනීම, දැනුම ලබා දීම, පුහුණු කිරීම සහ රඳවා ගැනීම සඳහා උපායමාර්ග සැකසීමේ දී ඔවුන් හා සන්නිවේදනය කිරීමට සහ ඔවුන්ට සහය වීමට ජාතික සංසදයක් පිහිටුවීම.
- ඊළඟ පරම්පරාව සම්බන්ධ කර ගැනීම සඳහා මාර්ගෝපදේශ සහ මෙවලම් සැපයීම සහ තරුණයන් සඳහා ගුවන්සේවාව ශක්‍ය වෘත්තියක් ලෙස ප්‍රවර්ධනය කිරීම මගින් කර්මාන්තයට සහය වීම.

පාර්ශවකරුවන් සමඟ සබඳතා

සිවිල් ගුවන්සේවා විෂය භාර ගරු අමාත්‍යතුමාගේ අපේක්ෂාවන් පිළිබඳව අවබෝධයෙන් සිටීමටත්, විශේෂයෙන්ම පාර්ශ්වකරුවන් සමඟ සමීප සහ නිරන්තර සම්බන්ධතා පැවැත්වීමේ වගකීම ගුවන්සේවා අධිකාරිය පිළිගනී.

අධිකාරියේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාර මණ්ඩලයේ වගකීම

අධිකාරියෙහි සහ ප්‍රධාන විධායක නිලධාරී ප්‍රමුඛ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ කාර්යභාරය පැහැදිලිව වෙන්කර තිබීම සිවිල් ගුවන්සේවා අධිකාරිය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන වැදගත්ම සාධකය වේ. අධිකාරියෙහි සහ ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සහ උපාය මාර්ග පිහිටුවීම කෙරෙහි අවධානය යොමු කරමින් අනතුරුව අරමුණු වෙත ළඟාවීමේ ප්‍රගතිය අධීක්ෂණය කෙරේ. අධිකාරිය තවදුරටත් එහි පරිවර්තන ප්‍රතිපත්ති, කාර්ය පටිපාටි හෝ චර්යාවන් තුළ නිශ්චිත විධිවිධාන නොපවතින කරුණු සම්බන්ධව මගපෙන්වීමද ලබා දෙයි.

මෙකී ඉහළ මට්ටමේ ප්‍රතිපත්ති සහ උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ වගකීම ප්‍රධාන විධායක නිලධාරී ප්‍රමුඛව ජ්‍යෙෂ්ඨ කළමනාකරණය මත පැවරී ඇත.

2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත, ඒ යටතේ සාදන ලද ගුවන් සන්තරණ රෙගුලාසි හෝ වෙනත් ලිඛිත නීතියක් ප්‍රකාරව සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත විශේෂයෙන් පවරා ඇති නිශ්චිත නියාමන වගකීම් ඉටු කිරීමේ වගකීම අධිකාරිය විසින් බෙදා නොගන්නා අතර අධිකාරිය ඉන් වෙන්ව සිටියි.

කෙසේ වෙතත්, සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ රජය මත පැවරී ඇති නියාමන වගකීම් සහ කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය පිරිස්, උපකරණ, පහසුකම් සහ සේවාවන් සඳහා ඇතුළත් නමුත් ඒවාට සීමා නොවන, අවශ්‍ය සියලු සම්පත් සහ සහය අධිකාරිය විසින් ලබා දෙනු ඇත.

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ CAASL හි ප්‍රධාන විධායක නිලධාරී වෙත බලතල සහ කාර්යයන් පැවරීම සංක්ෂිප්ත සහ සම්පූර්ණ බව සහතික කිරීම මඟින් අධිකාරිය එම තැම්කාවන් පැහැදිලිව පෙන්නුම් කරයි.

වගකීම

අධිකාරිය සහ එහි කමිටු විසින් එහි උපායමාර්ගික අරමුණු වෙත ළඟාවීමේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සහ සිවිල් ගුවන්සේවා අධිකාරියේ කටයුතු එහි ආයතනික සැලැස්මේ දක්වා ඇති ප්‍රතිපත්ති, උපායමාර්ගික මඟ පෙන්වීම් සහ අපේක්ෂාවන් අනුව කළමනාකරණය කිරීම, මෙහෙයවීම, ගිණුම්කරණය සහ අධීක්ෂණය කිරීම සහතික කිරීම සඳහා නිරන්තරයෙන් රැස්වීම් පවත්වනු ලැබේ.

අභිමත ගැටුම්

අධිකාරිය විසින් අභිමතයන් ලේඛනයක් පවත්වා ගෙන යන අතර අධිකාරියේ සාමාජිකයන් ඔවුන්ගේ අභිමතයන් ප්‍රකාශ කිරීමට ඇති වගකීම් පිළිබඳව දැනුවත් බව සහතික කරයි. මෙම ප්‍රවේශය, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් සහ CAASL හි සියලුම සේවකයන් සඳහා අභිමත ගැටුම් ලේඛනයක් පවත්වාගෙන යාමේ ක්‍රියාවලිය හරහා ද පිළිබිඹු වේ.

තත්ත්ව සහ අභ්‍යන්තර විගණනය

අධිකාරියේ බොහෝ කාර්යයන් සහ රාජකාරී පවරා ඇති නමුත්, ඵලදායී ආයතනික පාලන සහ අධීක්ෂණ පද්ධති පවත්වාගෙන යාමේ සමස්ත අවසාන වගකීම අධිකාරිය සතුව පවතී.

අධිකාරියේ නිශ්චිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සහතික කිරීම සඳහා ස්ථාපිත ප්‍රතිපත්ති පද්ධති සහ ක්‍රියා පටිපාටි අභ්‍යන්තර පාලනයට ඇතුළත් වේ. මෙම වාර්තාවේ අඩංගු වගකීම් ප්‍රකාශයට අත්සන් කිරීම මඟින් අධිකාරිය සහ ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය තම වගකීම පිළිගෙන ඇත.

එක් එක් CAASL අංශයන්හි අභ්‍යන්තර පාලන පද්ධති පිළිබඳ සවිස්තරාත්මක විමර්ශනය සහ අධීක්ෂණය සඳහා වගකිව යුතු තත්ව සහ අභ්‍යන්තර විගණන අංශයකින් අධිකාරිය සමන්විත වේ. තත්ව සහ අභ්‍යන්තර විගණන අංශය CAASL විසින් ඉටු කරනු ලබන සමස්ත රාජකාරී, කාර්යයන් සහ සේවාවන්හි ගුණාත්මකභාවය පවත්වා ගැනීම සඳහා වගකිව යුතු අතර නියමිත ක්‍රියා පටිපාටි අනුව, අධිකාරියේ සභාපතිවරයා සහ විගණන සහ කළමනාකරණ කමිටුව වෙත සෘජුවම වාර්තා කරන ලද මූල්‍ය සහ අනෙකුත් තොරතුරුවල විශ්වසනීයත්වය සඳහා වගවිය යුතුය.

අභ්‍යන්තර විගණනය, ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වයෙන් ස්වාධීනව ක්‍රියාත්මක වන අතර නියමිත ක්‍රියා පටිපාටි අනුව, CAASL හි ප්‍රධාන විධායක නිලධාරිවරයා වශයෙන් ද කටයුතු කරන CAASL හි අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ විගණන සහ කළමනාකරණ කමිටුවට එහි නිගමනය සෘජුවම වාර්තා කරයි.

ව්‍යවස්ථාදායක අනුකූලතාව

සංවිධානය සියලු නීතිරීතිවලට අනුකූල වන බව සහතික කිරීමේ වගකීම අධිකාරිය විසින් පිළිගනු ලැබේ. අනුකූලතා ගැටලු ක්‍රමානුකූලව හඳුනා ගැනීම සහ සේවකයන්ට විශේෂයෙන් අදාළ වන ව්‍යවස්ථාදායක අවශ්‍යතා පිළිබඳව ඔවුන් සියලු දෙනා දැනුවත් ද යන්න සහතික කිරීම සඳහා වැඩසටහනක් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා වන වගකීම අධිකාරිය විසින් ජ්‍යේෂ්ඨ කළමනාකාරිත්වය වෙත පවරා ඇත.

රජයේ සංවිධාන විසින් අධිකාරිය වෙත නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂිත චක්‍රලේඛ සහ/හෝ විධානයන් එක් එක් අවස්ථාව මත පදනම්ව අධිකාරියට අදාළ කර ගැනීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් තීරණ ගනු ලැබේ. එබැවින්, අධිකාරියේ නීත්‍යනුකූල බලතල, කර්තව්‍ය සහ යුතුකම් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කෙරෙහි අධිකාරිය විසින් එකී චක්‍රලේඛ වල අන්තර්ගතයන්හි බලපෑම පරීක්ෂා කර ඒවා අදාළ කර ගැනීමෙහි ස්වභාවය සහ වපසරිය තීරණය කරන්නේ නම් මිස, රජයේ දෙපාර්තමේන්තුවක් විසින් නිකුත් කරනු ලබන සෑම චක්‍රලේඛයක්ම CAASL හි කළමනාකරණය තුළ ස්වයංක්‍රීයව අදාළ නොකර ගනු ඇත.

CAASL හි ක්‍රියාකාරිත්වය සඳහා රජයේ චක්‍රලේඛ යොදා ගැනීම දීර්ඝ කිරීම සම්බන්ධයෙන් යාවත්කාලීන වූ වකඟතා ලැයිස්තුවක් පවත්වාගෙන යාමේ වගකීම කීඛ හි ආයතනික කටයුතු සහ ආර්ථික නියාමන අංශය වෙත පැවරේ.

ආචාර ධර්ම

අධිකාරිය විසින් ආචාරධර්ම සංග්‍රහයක් සකස් කර ඇති අතර, කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් සදාචාරාත්මක හැසිරීම් පිළිබඳ උසස් ප්‍රමිතීන් පවත්වා ගෙන යන්නේ ද, "යහපත් ආයතනික පාලනයේ" මූලධර්ම ක්‍රියාත්මක කරන්නේ ද යන්න නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ. සදාචාරාත්මක ප්‍රමිතීන් සමඟ ඇති අනුකූලතාව පිළිබඳ අධීක්ෂණය කිරීම ක්‍රියාත්මක කරනු ලබන්නේ පැමිණිලි සහ විනය ක්‍රියාමාර්ග, අභ්‍යන්තර විගණන වාර්තා, හෝ ආචාර ධර්ම සංග්‍රහයේ අඩංගු මූලධර්මවලට පටහැනි ඕනෑම වාර්තාවක් හෝ හැඟවීමක් ආදියට අදාළ ප්‍රවණතා අධීක්ෂණය කිරීම වැනි ක්‍රම මඟිනි.

යහපත් ආයතනික පුරවැසිභාවය යන්නෙන් අධිකාරියෙන් මෙන්ම අධිකාරිය විසින් අධීක්ෂණය කරන කර්මාන්තයෙන් ද පිටත ප්‍රජාවන් රැසකගේ සාමාජිකයෙකු බව තමන් විසින් පිළිගැනීම සහ එම ප්‍රජාවන්ට අයත් සියලුම පුරවැසියන්ගේ ආචාරධර්ම, සම්මත අයිතිවාසිකම් සහ වගකීම් සමඟ පාරදෘශ්‍ය, ස්ථාවර, ස්වාධීන සහ වගකීම් සහගත ලෙස ක්‍රියා කිරීමට කැපවීම යන ලක්ෂණවලින් යුත් අධිකාරිය සහ එහි සේවකයන් අදහස් වේ.

සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්ය මණ්ඩලය

අධිකාරියේ කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය පහත පරිදි නිරූපණය කෙරේ. කෙටි යෙදුම්, මෙම වාර්තාව ආරම්භයේ ලැයිස්තුගත කර ඇත.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ

මෙහෙයුම් සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්යමණ්ඩලය





Legends
SCAI – Senior Civil Aviation Inspector
Mgr. – Manager
CAI – Civil Aviation Inspector
AM – Assistant Manager

Rev 03 – 09/05/2019

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි පාලනය සහ වගකීම

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ මෙහෙයුම් සංවිධාන ව්‍යුහය - කළමනාකරණ කාර්යමණ්ඩලය

	කෙටි යෙදුම	Os කේතය	තනතුර
1.			සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ ප්‍රධාන විධායක නිලධාරී
2.	ADG 01	OS1-HM22-ADG	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
3.	DDG 01	OS2-HM21-DDG-1	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ගුවන් අවකාශ සහ සුරක්ෂිතතා නියාමන)
4.	DDG 02	OS2-HM21-DDG2	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පියාසර නිරුපද්‍රතතා නියාමන)
5.	DDG 03	OS2-HM21-DDG3	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වීකාබද්ධ කටයුතු සහ ආර්ථික නියාමන)
6.	DDG 04	OS2-HM2-1-DDG4	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ගුවන්සේවා සුරක්ෂිතතා නියාමන)
7.	D 01	OS3-HM11-D2	අධ්‍යක්ෂ (ගගන යාත්‍රාංගන)
8.	D 02	OS3-HM11-D3	අධ්‍යක්ෂ (ගුවන් සන්තරණ සේවා)
9.	D 03	OS3-HM11-D10	අධ්‍යක්ෂ (පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්)
10.	D 04	OS3-HM11-D5	අධ්‍යක්ෂ (ගුවන්යානා මෙහෙයුම්)
11.	D 05	OS3-HM11-D6	අධ්‍යක්ෂ (ගුවන්යානා ලියාපදිංචි සහ ගුවන් යෝග්‍යතා)
12.	D 06	OS3-HM11-D8	අධ්‍යක්ෂ (මානව සම්පත් සහ දේපළ කළමනාකරණ)
13.	D 07	OS3-HM11-D9	අධ්‍යක්ෂ (මූල්‍ය සහ ආදායම් කළමනාකරණ)
14.	D 08	OS3-HM11-D7	අධ්‍යක්ෂ (ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන)
15.	D 09	OS3-HM11-D1	අධ්‍යක්ෂ (ගුවන්සේවා ආරක්ෂණ)
16.	D 10	OS3-HM11-D4	අධ්‍යක්ෂ (පරිසර, පර්යේෂණ සහ ව්‍යාපෘති)
17.	D 11	OS3-HM11-D11	අධ්‍යක්ෂ (තත්ව සහ අභ්‍යන්තර විගණන)
18.	D 12	OS3-HM11-D12	අධ්‍යක්ෂ (තොරතුරු සන්නිවේදන සහ තාක්ෂණ)
19.	SCAI 01	OS4-MM11-AD-1	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන යාත්‍රාංගන)
20.	SCAI 02	OS4-MM11-AD-2	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන යාත්‍රාංගන ප්‍රමිති)
21.	SCAI 03	OS4-MM11-AN-1	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණය - මෙහෙයුම්)
22.	SCAI 04	OS4-MM11-AN-2	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන නාවික තොරතුරු සේවා)
23.	SCAI 05	OS4-MM11-AN-5	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන නාවික කාලගුණ විද්‍යාව)
24.	SCAI 06	OS4-MM11-AN-3	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණය - තාක්ෂණික)
25.	SCAI 07	OS4-MM11-AN-4	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ඕඑ සහ ප්‍රමිති සහ ක්‍රියා පටිපාටි)
26.	SCAI 08	OS4-MM11-PL-1	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත් රජරීක්ෂණ සහ ප්‍රමිති)
27.	SCAI 09	OS4-MM11-PL-3	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත් - ගුවන්යානා කාර්ය මණ්ඩලය)
28.	SCAI 10	OS4-MM11-PL-4	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත් - පියාසර කටයුතුවලින් පරිබාහිර කාර්ය මණ්ඩලය)
29.	SCAI 11	OS4-MM11-OP-1	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා පියාසර මෙහෙයුම්)
30.	SCAI 12	OS4-MM11-OP-2	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා භූමි මෙහෙයුම්)
31.	SCAI 13	OS4-MM11-OP-3	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා මැදිරි ආරක්ෂාව)
32.	SCAI 14	OS4-MM11-AW-1	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා ලියාපදිංචි සහ ගුවන් යෝග්‍යතා ප්‍රමිතීන්)
33.	SCAI 15	OS4-MM11-AW-2	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (නඩත්තු සහ අලූත්වැඩියා සංවිධාන)
34.	SCAI 16	OS4-MM11-AW-3	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ක්‍රියාකරු සහතිකකරණය සහ නිරීක්ෂණය)
35.	SCAI 17	OS4-MM11-HR-1	කළමනාකරු (මානව සම්පත් කළමනාකරණය)
36.	Mgr 18	OS4-MM11-HR-2	කළමනාකරු (ආයතනික කටයුතු සහ දේපළ කළමනාකරණය)
37.	Mgr 19	OS4-MM11-HR-3	කළමනාකරු (කාර්ය මණ්ඩල පුහුණුව සහ සංවර්ධනය)
38.	Mgr 20	OS4-MM11-FM-1	කළමනාකරු (අයවැය සහ වැඩසටහන්)
39.	Mgr 21	OS4-MM11-FM-2	කළමනාකරු (මූල්‍ය මෙහෙයුම්)
40.	Mgr 22	OS4-MM11-AT-1	කළමනාකරු (ගුවන්සේවා සහ ගුවන් ගමන් හිමිකම්)
41.	SCAI 23	OS4-MM11-AS-1	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් තොටුපල සුරක්ෂිතතා)
42.	SCAI 24	OS4-MM11-AS-2	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් සමාගම් ආරක්ෂණ)
43.	Mgr 25	OS4-MM11-SP-1	කළමනාකරු (පර්යේෂණ සහ සංවර්ධන සැලසුම්)
44.	Mgr 26	OS4-MM11-HR-5	කළමනාකරු (ලිපිලේඛන සහ වෙබ් කළමනාකරණය)
45.	Mgr 27	OS4-MM11-IA-1	කළමනාකරු (අභ්‍යන්තර විගණනය සහ තත්ව සමීක්ෂණය)
46.	Mgr 28	OS4-MM11-DM-2	කළමනාකරු (නෛතික කටයුතු සහ බලාත්මක කිරීම්)

	කෙටි යෙදුම	Os කේතය	තනතුර
47.	Mgr 29	OS4-MM11- DM -4	කළමනාකරු (තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය)
48.	SCAI 30	OS4-MM11-PL-2	ජ්‍යෙෂ්ඨ සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්සේවා ඖෂධ)
49.	MGR 31	OS4-MM11-DM-1	කළමනාකරු (ගුවන්සේවා ආරක්ෂණ අධීක්ෂණ)
50.	Mgr 32	OS4-MM 1-1-DM-3	ප්‍රධාන විධායක නිලධාරීතුමාගේ විධායක සහකාර
51.	Mgr 33	OS4-MM 1-1-DM-4	මණ්ඩලයේ ලේකම්
52.	Mgr 34	OS4-MM 1-1DM -5	කළමනාකරු (සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධන)
53.	CAI 01	OS5-MA5-3-AD-1 -1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන යාත්‍රාංගන මෙහෙයුම්)
54.	CAI 02	OS5-MA5-3-AD-1-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන යාත්‍රාංගන මෙහෙයුම්)
55.	CAI 03	OS5-MA5-3-AD-1-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන යාත්‍රාංගන මෙහෙයුම්)
56.	CAI 04	OS5-MA5-3-AD-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන යාත්‍රාංගන ප්‍රමිතීන්)
57.	CAI 05	OS5-MA5-3-AN-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණය - මෙහෙයුම්)
58.	CAI 06	OS5-MA5-3-AN-2-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන නාවික තොරතුරු සේවය)
59.	CAI 07	OS5-MA5-3-AN-2-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගගන නාවික තොරතුරු සේවය)
60.	CAI 08	OS5-MA5-3-AN-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් ගමන් කළමනාකරණය - තාක්ෂණික)
61.	CAI 09	OS5-MA5-3-AN-4	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ඕඑ ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටි)
62.	CAI 10	OS5-MA5-3-PL-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර පරීක්ෂණ)
63.	CAI 11	OS5-MA5-3-PL-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර ප්‍රමිතීන්)
64.	CAI 12	OS5-MA5-3-PL-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - ගුවන්යානා කාර්ය මණ්ඩලය)
65.	CAI 13	OS5-MA5-3-PL-5	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පුද්ගල බලපත්‍ර - පියාසර කටයුතුවලින් පරිබාහිර කාර්ය මණ්ඩලය)
66.	CAI 14	OS5-MA5-3-PL-4	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (පියාසර පුහුණුව)
67.	CAI 15	OS5-MA5-3-OP-1-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා පියාසර මෙහෙයුම්)
68.	CAI 16	OS5-MA5-3-OP-1-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා පියාසර මෙහෙයුම්)
69.	CAI 17	OS5-MA5-3-OP-1-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා පියාසර මෙහෙයුම්)
70.	CAI 18	OS5-MA5-3-OP-2-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා භූමි මෙහෙයුම්)
71.	CAI 19	OS5-MA5-3-OP-2-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා භූමි මෙහෙයුම්)
72.	CAI 20	OS5-MA5-3-OP-2-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා භූමි මෙහෙයුම්)
73.	CAI 21	OS5-MA5-3-OP-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්යානා මැදිරි ආරක්ෂාව)
74.	CAI 22	OS5-MA5-3-OP-4	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (මිනිසුන් රහිත ගුවන්යානා පද්ධති)
75.	CAI 23	OS5-MA5-3-AW-4	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතාව - නිර්මාණය සහ නිෂ්පාදනය)
76.	CAI 24	OS5-MA5-3-AW-1-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතාව - ගුවන් බඳ)
77.	CAI 25	OS5-MA5-3-AW-2-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතාව - බල එන්ජිම)
78.	CAI 26	OS5-MA5-3-AW-3	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතාව - ගුවන් ඉලෙක්ට්‍රොනික ශිල්පය)
79.	CAI 27	OS5-MA5-3-AW-1-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතාව - ගුවන් බඳ)
80.	CAI 28	OS5-MA5-3-AW-2-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් යෝග්‍යතාව - බල එන්ජිම)
81.	AM 29	OS5-MA53-HR-1	සහකාර කළමනාකාරු (මානව සම්පත් කළමනාකරණය)
82.	AM 30	OS5-MA53-HR-2	සහකාර කළමනාකරු (ආයතනික කටයුතු සහ දේපළ කළමනාකරණය)
83.	AM 31	OS5-MA53-HR-3	සහකාර කළමනාකරු (පුහුණු)
84.	AM 32	OS5-MA53-FM-1	සහකාර කළමනාකරු (අයවැය සහ වැඩසටහන්)
85.	AM 33	OS5-MA53-FM-1	සහකාර කළමනාකරු (මූල්‍ය මෙහෙයුම්)
86.	AM 34	OS5-MA53-AT-1	සහකාර කළමනාකරු (ගුවන්සේවා සහ ගුවන් ගමන් හිමිකම්)
87.	AM 35	OS5-MA53-AT-3	සහකාර කළමනාකරු (ගුවන් ප්‍රවාහන සේවා)
88.	CAI 36	OS5- MA53-AS-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන්තොටුපළ ආරක්ෂණ)
89.	CAI 37	OS5-MA53-AS-2-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් සමාගම් ආරක්ෂණ)
90.	CAI 38	OS5-MA53-AS-2-2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ගුවන් සමාගම් ආරක්ෂණ)
91.	CAI 39	OS5-MA53-AS-3 - 1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ආරක්ෂණ ප්‍රමිතීන්)
92.	CAI 40	OS5-MA53-AS-3 -2	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (ආරක්ෂණ ප්‍රමිතීන්)
93.	CAI 41	OS5-MA53-Fal-1	සිවිල් ගුවන්සේවා පරීක්ෂක (සේවා පහසුකම්)
94.	AM 42	OS5-MA53-SP-3	සහකාර කළමනාකරු (සංඛ්‍යාලේඛන සහ පුරෝකථනය)

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි පාලනය සහ වගකීම

	කෙටි යෙදුම	Os කේතය	තනතුර
95.	AM 43	OS5-MA53-SP-2	සහකාර කළමනාකරු (සැලසුම්)
96.	AM 44	OS5- MA53-SP-1	සහකාර කළමනාකරු (විශේෂ වැඩසටහන්)
97.	AM 45	OS5-MA53-HR-5	සහකාර කළමනාකරු (ලිපිලේඛන සහ වෙබ් කළමනාකරණය)
98.	AM 46	OS5-MA53-IA-1	සහකාර කළමනාකරු (අභ්‍යන්තර විගණනය සහ තත්ව සමීක්ෂණය)
99.	AM 47	OS5-MA53-DM-2	සහකාර කළමනාකරු (නෛතික කටයුතු සහ බලාත්මක කිරීම)
100.	AM 48	OS5-MA53-AT-2	සහකාර කළමනාකරු (ජාත්‍යන්තර සබඳතා)
101.	AM 49	OS5-MA53-HR-4	සහකාර කළමනාකරු (තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය)
102.	AM 50	OS5-MA53-DM-1	සහකාර කළමනාකරු (ගුවන්සේවා ආරක්ෂණ අධීක්ෂණය)
103.	JM 51	OS6-JM11-SP-4	සභාපතිතුමාගේ පෞද්ගලික සහකාර
104.	JM 52	OS6-JM 1-1-DM-1	සහකාර කළමනාකරු (සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධනය)
105.	JM 53	OS6-JM11-DM-3-1	සම්බන්ධීකරණ නිලධාරී
106.	JM 54	OS6-JM11-DM-3-2	සම්බන්ධීකරණ නිලධාරී
107.	JM 55	OS6-JM11-DM-3-3	සම්බන්ධීකරණ නිලධාරී
108.	JM 56	OS6-JM11-DM-3-4	සම්බන්ධීකරණ නිලධාරී
109.	JM 57	OS6-JM11-DM-3-5	සම්බන්ධීකරණ නිලධාරී



මෙහෙයවීම සහ කළමනාකරණය



මෙහෙයවීම සහ කළමනාකරණය

CAASL රැස්වීම්

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් සමාලෝචිත කාල සීමාව තුළ අධිකාරී රැස්වීම් නවයක් (09) පවත්වන ලද අතර CAASL සහ එය නියාමනය කරනු ලබන සිවිල් ගුවන්සේවා කර්මාන්තය යන දෙකෙහිම ප්‍රගතිය සහ යහපැවැත්ම සඳහා යෝජනා සම්මත කර ඇත. CAASL හි මාණ්ඩලික කමිටුව දෙවරක් (02) රැස් වූ අතර CAASL හි විගණන කමිටුව සමාලෝචිත කාල සීමාව තුළ තුන් වතාවක් (03) රැස් විය.

තත්ත්ව සහ අභ්‍යන්තර විගණන අංශය (QIA)

විශේෂ ඉස්මතු කිරීම්







වෙනත් කටයුතු

- ගුණාත්මක පියවරක් ලෙස පාරිභෝගික ප්‍රතිචාරයන් නිතිපතා ලබා ගැනීමට සහ සේවාවේ අවශ්‍යතා වැඩිදියුණු කර කළමනාකාරිත්වයට වාර්තා කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකයේ සහාය ඇතිව අපි "පාරිභෝගික සමීක්ෂණ යෙදුමක්" (Customer Survey App) සංවර්ධනය කළෙමු.

TO & PEL අංශයේ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව DGCA සහ CEO විසින් ක්‍රියාත්මක කරන ලද පද්ධති වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය සමඟ QIA අංශය ක්‍රියාකාරිව සම්බන්ධ වේ. ඊට අමතරව, SLCAP 5000: මාණ්ඩලික නීති සහ පරිපාලන ක්‍රියාපටිපාටිය සමාලෝචනයේ කමිටු සාමාජිකයෙකු ලෙස සේවය කල අතර, කාර්ය මණ්ඩල තාක්ෂණික දීමනා, ගෙවීම්, අදාළ චක්‍රලේඛවලට අනුකූල බව තහවුරු කර ගැනීම සඳහා මෙම අංශය කාර්ය මණ්ඩල තාක්ෂණික දීමනා ඇගයීම් කමිටුවේ කණ්ඩායම් සාමාජිකයෙකු ලෙසද කටයුතු කරන ලදී.

පරිසර පර්යේෂණ සහ ව්‍යාපෘති අංශය

සිවිල් ගුවන්සේවා සංඛ්‍යාන වැඩසටහන

CAASL විසින් ගුවන් ප්‍රවාහන සංඛ්‍යාන වැඩසටහන සහ CAASL සංඛ්‍යාලේඛන වැඩසටහන ඇතුළත් සිවිල් ගුවන්සේවා සංඛ්‍යාන වැඩසටහන කළමනාකරණය කරයි. මෙම සංඛ්‍යාන වැඩසටහනට විවිධ මෙවලම් සහ ශිල්පීය ක්‍රම භාවිතා කරමින් දත්ත රැස් කිරීම, සම්පාදනය, අර්ථ නිරූපණය සහ ඉදිරිපත් කිරීම ඇතුළත් වේ. එහි ප්‍රතිඵලයක් ලෙස, 2022 ජනවාරි සහ දෙසැම්බර් අතර, CAASL විසින් ගුවන් ප්‍රවාහන සංඛ්‍යාන වැඩසටහන යටතේ ජාත්‍යන්තර ගුවන්සේවා/ගුවන් තොටුපළ, දේශීය ගුවන්සේවා/ගුවන් තොටුපළ, ගුවන් යානා ලියාපදිංචිය, බලපත්‍රලාභී පිරිස් සහ ඉන්ධන පරිභෝජනය පිළිබඳ සංඛ්‍යාලේඛන එකතු කර ICAO සහ අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන වෙත දත්ත බෙදා හැර ඇත.

තවද, CAASL වාර්ෂික වාර්තාව 2022 ඇතුළුව CAASL මාසික කාර්ය සාධන වාර්තා සකස් කිරීම සඳහා CAASL සංඛ්‍යාන වැඩසටහන යටතේ සංවිධානයේ සෑම අංශයකින්ම මාසික කාර්ය සාධන සංඛ්‍යාලේඛනද එකතු කරන ලදී.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ලේඛන, වාර්තා සහ සඟරා ප්‍රකාශයට පත් කිරීම

ආයතනික සැලැස්ම වැඩිදියුණු කිරීම, CAASL හි කාර්ය වැඩසටහන, රේඩියෝ අමාත්‍යාංශය සඳහා ප්‍රගති සහ කාර්ය සාධන වාර්තාව, සංඛ්‍යාලේඛන වාර්තාව, මහ බැංකු වාර්තාව, ප්‍රගති මිනුම් ප්‍රතිඵල වාර්තාව සහ සිවිල් ගුවන්සේවා අධිකාරියේ වාර්ෂික වාර්තා ප්‍රසම්පාදනය කිරීමේ කටයුතු අවසන් කර, ප්‍රකාශයට පත් කර ඇති අතර, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට සහ අදාළ රාජ්‍ය ආයතනවලට මෙන්ම කර්මාන්තයේ අනෙකුත් සේවාදායකයින්ට ඉදිරිපත් කර ඇත.

ජාත්‍යන්තර ගුවන්සේවා සඳහා කාබන් පියසටහන ඉවත් කිරීමේ සහ අඩු කිරීමේ යෝජනා ක්‍රමය (CORSIA)

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) ඉන්ධන පරිභෝජන දත්තවල අවශ්‍යතාවයන්ට අනුකූලව, ශ්‍රී ලංකන් ගුවන් සේවයේ විමෝචන දත්ත සහ අනෙකුත් දත්ත එක්රැස් කර, එම දත්තවල නිරවද්‍යතාවය තහවුරු කර, ඉන්පසු එම දත්ත ICAO හි මධ්‍යම ලේඛනාගාරය වෙත ඉදිරිපත් කර ඇත.

සිවිල් ගුවන්සේවා අධිකාරියේ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සිදු කිරීම

සියලුම CAASL භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සහ උපදේශන ERP අංශය මගින් සිදු කරන ලදී. එහි ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම, ලංසු ලේඛන සකස් කිරීම, කමිටු පත් කිරීම, අදාළ අනුමැතීන් ලබා ගැනීම, සැපයුම්කරුවන් සමඟ සාකච්ඡා කිරීම සහ ගිවිසුම් සකස් කිරීම ඇතුළත් විය. මෙම සියලු කටයුතු 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව සිදු කරන ලදී.

භෞතික යටිතල පහසුකම් සංවර්ධනය

පරිසරය, පර්යේෂණ සහ ව්‍යාපෘති අංශය මගින් සිදුකරන ව්‍යාපෘති සැලසුම් කිරීම, ප්‍රසම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා CAASL ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි ව්‍යාපෘතිය, වාහන නැවැත්වීමේ නවාතැන් ව්‍යාපෘතිය රූපාන්තරය කිරීම සහ ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි කටයුතු නඩත්තු කිරීම ඇතුළත් වේ.

ගුවන්සේවා නිරුපද්‍රතතා අධීක්ෂණ ඒකකය

වසර තුළ සිදු කරන ලද ප්‍රධාන කාර්යයන්

- ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සම්මුතියේ ඇමුණුම 13 සමඟ නවතමයට අනුකූල වීම සඳහා AAIB පනත් කෙටුම්පතට අවශ්‍ය සංශෝධන සිදු කරන ලදී.
- ශ්‍රී ලංකාවේ ජාතික ගුවන්සේවා ආරක්ෂණ සැලැස්ම (NASP) 2023-2025 DGCA විසින් පත් කරන ලද කණ්ඩායමක් සමඟින් වැඩි දියුණු කරන ලදී. ඊට සමගාමීව, ICAO විසින් NASP i-pack යෙදවීමේ ව්‍යාපෘතිය විෂය කරුණු පිළිබඳ විශේෂඥයෙකු හරහා තාක්ෂණික සහාය සඳහා ප්‍රතිපාදන සමඟින් ඉදිරිපත් කරන ලදී. එමගින්, NASP ගෝලීය ගුවන්සේවා ආරක්ෂණ සැලැස්ම 2023-2025 සහ කලාපීය ගුවන්සේවා සුරක්ෂිතතා සැලැස්ම 2023-2025 සමඟ සමපාතව සංශෝධනය කර සම්පූර්ණ කරන ලදී.
- ගුවන් ක්‍රියාකරුවන්ගේ ආරක්ෂිත කළමනාකරණ පද්ධති අත්පොත් හයක් මෙහෙයුම් අංශ මගින් පිළිගැනීමට පෙර SMS රාමුව මත SLCAIS 070 ප්‍රමිති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සමාලෝචනය කර පරීක්ෂා කරන ලදී.
- අනිවාර්ය සිදුවීම් වාර්තා කිරීම සහ ස්වේච්ඡා වාර්තාකරණ පද්ධතිය සඳහා මාර්ගගත වාර්තාකරණ පද්ධතිය 2022 මුල් භාගයේදී ස්ථාපිත කරන ලද්දේ කර්මාන්තයේ පාර්ශවකරුවන්ගෙන් ආරක්ෂිත දත්ත සහ තොරතුරු රැස් කිරීම සහ කාර්යක්‍රමය පහසු කිරීම සඳහා ය.

ගුවන් සේවයෙහි හදිසි අවස්ථා

2022 වසරේ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් යානා සහ විදේශ ලියාපදිංචි ගුවන් යානා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා භූමිය තුළ හදිසි අවස්ථා 330ක් වාර්තා වී ඇත.

වාර්තා වූ සමස්ත සිදුවීම් අතරින්, ගුවන්යානා වල පක්ෂීන් ගැටීම් 88 ක් ඇති අතර, එය එක් කාණ්ඩයක් තුළ වාර්තා වූ වැඩිම සිදුවීම් ගණනට හේතු විය. වාර්තා වූ පක්ෂී ගැටීම් අතරින් 48ක් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේදී ද, 04ක් රත්මලාන කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළේදීද, එකක් කටුකුරුන්ද ගුවන්තොටුපළේදීද වාර්තා විය.

- වර්ෂය තුළ පද්ධති/සංරචක අසමත්වීම් හෝ අක්‍රියවීම් සම්බන්ධ සිදුවීම් 68ක් වාර්තා විය.

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර/සන්නිවේදනය ආශ්‍රිත සිදුවීම් 56ක් ඇති අතර, සිදුවීම්වලින් බහුතරයක් ATS ඒකක සමඟ සම්බන්ධ නොවීම හේතුවෙන් වාර්තා වූ අතර, වැඩිම සංඛ්‍යාව වාර්තා වූයේ මුම්බායි FIR තුළය.

ගුවන් යානා පිලිබඳ විමර්ශන

- කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සිට ඕස්ට්‍රේලියාවේ කිංග්ස්ෆෝර්ඩ් ස්මිත් ජාත්‍යන්තර ගුවන් තොටුපළ දක්වා FL 390 FL 390 ගුවන් යානයේ යාත්‍රා කිරීමේදී ශ්‍රී ලංකන් ගුවන් සේවයේ UL 606, 4R-ALR ගුවන් යානය ආසන්න වශයෙන් අඩි 1540 ක් පමණ උන්නතාංශ අපගමනය පිළිබඳ වාර්තා කළ ගුවන් යානා සිද්ධිය පිළිබඳ විමර්ශනය මාර්තු 2 2211 දින අවසන් විය. මෙවැනි සිදුවීමක් නැවත ඇතිවීම වැලැක්වීම සඳහා ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීමට ගුවන් ක්‍රියාකරු වෙත ආරක්ෂක නිර්දේශ නිකුත් කරන ලදී.
- කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සිට සෞදි අරාබියේ රියාද් හි කින්ග් කාලිඩ් ජාත්‍යන්තර ගුවන් තොටුපළ වෙත 2021 සැප්තැම්බර් 18 වැනි දින පිටත් වූ ශ්‍රී ලංකන් ගුවන් සේවයට අයත් UL1265, 4R-ALM ගුවන් යානයට හිම කැට වර්ෂාවක් වැල්ල වීමේ සිද්ධිය සම්බන්ධයෙන් විමර්ශනය කර කඩිනම් පිළියම් යොදන ලදී.

දෙවුන්දර දක්වා රට හරහා සංචාලන ගුවන් ගමනක් සඳහා පුහුණු ගුවන් ගමනක් ලෙස පිටත් වූ 4R-ASJ ලියාපදිංචිය දරන Piper PA 38- 112 සකුරායි ගුවන් යානයේ එන්ජිමේ RPM පහත වැටීමේ සිද්ධිය විමර්ශනය කරන ලදී. කඩිනම් ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීමට මූලික වාර්තාව නිකුත් කර ඇති අතර, අවසාන වාර්තාව නිකුත් කර අදාළ ආයතන වෙත ආරක්ෂක නිර්දේශ සහිතව ප්‍රකාශයට පත් කරන ලදී

2021 දෙසැම්බර් 27 වන දින, සකුරායි ගුවන් සේවයෙහි හි 4R- GAF ලියාපදිංචිය සහිත Cessna 172L ගුවන් යානය සීගිරිය ගුවන් තොටුපළහි (VCCS) සිට කොග්ගල ගුවන් තොටුපළ (VCCK) වෙත යාත්‍රා කරන ලද අතර එය එන්ජිමේ RPM උච්චාවචනයකට ලක්වීමෙන් පසුව එන්ජිම ක්‍රියා විරහිත විය.

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ සිට ඊසාන දෙසින් නාවික සැතපුම් 2 සිට 3 දක්වා දුරක් ඇතුළත ගුවන් ධාවන පථය අංක 22 වෙත හදිසි ප්‍රවේශයේදී මගීන් 04 දෙනෙකු සමඟ ගුවන් යානය කඩා වැටී ඇත. විමර්ශනය කිරීම සඳහා අධිකාරිය විසින් ගුවන් යානා අනතුරු විමර්ශන මණ්ඩලයක් (AAIB) පත් කරන ලදී. AAIB විසින් ක්ෂණික ආරක්ෂක නිර්දේශ සහිත මූලික වාර්තාවක් නිකුත් කරන ලද අතර ICAO ඇමුණුම 13 හි දක්වා ඇති ප්‍රමිති සහ නිර්දේශිත පරිචයන්ට අනුකූලව අතුරු වාර්තාවක් ප්‍රකාශයට පත් කරන ලදී.

- A7-BAC ලියාපදිංචිය සහිත A7-BAH සහ QTR 54C, Boeing B777- 300 ලියාපදිංචිය සහිත QTR 34U, Boeing ඊ777- 300ER අතර ATC සිද්ධිය 2022 මැයි 06 වැනි දින හ640 (බටහිර දෙසට) මාර්ගයේ ELATI ස්ථානය පසුකර යන කොළඹ සාගර පාලන ප්‍රදේශය තුළට, විමර්ශනය කර අවසන් කරන ලදී.

ඊට අමතරව, CAASL නිලධාරීන්ට ආරක්ෂිත කළමනාකරණ පද්ධති සහ රාජ්‍ය ආරක්ෂිත වැඩසටහන් පිළිබඳ වැඩමුළු දෙකක් පවත්වන ලද අතර, 2022 මාර්තු මාසයේදී යුරෝපා සංගම් ගුවන්සේවා ආරක්ෂිත නියෝජිතායතනයේ තාක්ෂණික සහාය ඇතිව ගුවන් සේවයේ නිලධාරීන්ට ශ්‍රී ලංකාවේදී පවත්වන ලදී.

මෙහෙයවීම සහ කළමනාකරණය

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් යානා සහ ශ්‍රී ලංකා භූමිය තුළ විදේශ ලියාපදිංචි ගුවන් යානා වල සියලුම සිදුවීම් 2022



Abbreviations	
ADRM	ගගන යාත්‍රාංගන
ARC	අසාමාන්‍ය ධාවන පථ සම්බන්ධතාවය
ATM	ATM/CNS
BIRD	පක්ෂී ගැටීම්
CABIN	ගුවන්යානා මැදිරි ආරක්ෂාව
F-NI	ගිනි/දුම් (බලපෑමක් නොවන)
MAC	AIRPROX/ACAS ඇඟවීම්/වෙන්වීම නැතිවීම/ (ආසන්න) ආකාස මධ්‍යයේ ගැටීම්
MED	වෛද්‍ය
OTHR	වෙනත්
RAMP	ගොඩබිම් හැසිරවී
RI	ධාවන පථ ආක්‍රමණය - වාහන, ගුවන් යානා හෝ පුද්ගලයින්
SCF-NP	පද්ධතිය/සංරචක අක්‍රිය හෝ අක්‍රමවත් වීම
SEC	සුරක්ෂිතතාවය
TURB	කැළඹීම්වලට මුහුණ දීම
WSTRW	සුළං මාරුව හෝ අකුණු කුණාටු
NAV	සංචාලන දෝෂ
SCF-PP	බලාගාරය හෝ අක්‍රිය වීම

නීති කටයුතු සහ බලාත්මක කිරීමේ ඒකකය

2022 වර්ෂය තුළ, 2022 වාර්ෂික වැඩ වැඩසටහනට අනුව පහත සඳහන් පරිදි සිය කාර්යය ඉටු කිරීමට LA&E ඒකකයට හැකි විය.

- හදිසි අනතුරු හා සිද්ධි විමර්ශන කාර්යාංශය පනත් කෙටුම්පත බලාත්මක කිරීම.
- CAASL නිරීක්ෂණ සඳහා අවසන් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවෙන් ලැබී ඇත.
- ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සහ ඒ ආශ්‍රිත පරිපූරක ප්‍රොටෝකෝලවලට අදාළ නීති විරෝධී ක්‍රියා මර්දනය කිරීම පිළිබඳ බෙයිජිං සම්මුතිය බලාත්මක කිරීම.
- අවසාන කෙටුම්පත සඳහා කෙටුම්පත CAASL නිරීක්ෂණ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී.
- කේප් ටවුන් සම්මුතිය සහ අදාළ ප්‍රොටෝකෝල බලාත්මක කිරීම.
- දෙවන කෙටුම්පත සඳහා පනත් කෙටුම්පත සඳහා CAASL නිරීක්ෂණ රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.
- ගුවන් යානා තුළ සිදු කරන ලද වැරදි සහ වෙනත් ක්‍රියා පිළිබඳ සම්මුතිය සංශෝධනය කිරීම සඳහා ප්‍රොටෝකෝල බලාත්මක කිරීම - මොන්ට්‍රියල් ප්‍රොටෝකෝලය 2014.
- පනත් කෙටුම්පත සකස් කිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.
- චිකාගෝ සම්මුතියේ 3 වැනි වගන්තිය අනුමත කිරීම.
- පාර්ශ්වකරුවන් සමඟ රැස්වීම් කැඳවීම සඳහා කමිටුවක් පත් කිරීමට රේඛීය අමාත්‍යාංශය කටයුතු කරමින් සිටී.
- චිකාගෝ සම්මුතියේ 50(අ) සහ 56 වැනි වගන්තිය අනුමත කිරීම.
- සම්මුතියේ වගන්තිවලට එකඟ වීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය රේඛීය අමාත්‍යාංශය හරහා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.
- ජල ගගන යාත්‍රාංගන රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම.
- 2022/08/09 දිනැති අංක 2292/34 දරන රජයේ අති විශේෂ ගැසට් නිවේදනයක රෙගුලාසි ප්‍රකාශයට පත් කරන ලදී.
- ගුවන්සේවා සැපයීමේ බලපත්‍ර රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම.
- ඉංග්‍රීසි භාෂාවෙන් දෙවන කෙටුම්පත සඳහා CAASL නිරීක්ෂණ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී.
- ගුවන් යානා ජාතිකත්වය ප්‍රකාශයට පත් කිරීම සහ ලියාපදිංචි ලකුණු රෙගුලාසි.
- අවසාන කෙටුම්පත සඳහා CAASL නිරීක්ෂණයන්, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී.
- ගුවන් රෙගුලාසි මගින් අනතුරුදායක භාණ්ඩ ආරක්ෂිතව ප්‍රවාහනය කිරීම ප්‍රකාශ කිරීම.
- අවසාන කෙටුම්පත සඳහා CAASL නිරීක්ෂණ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී.
- සිවිල් ගුවන්සේවා අධිකාරී පනතට සහ සිවිල් ගුවන්සේවා පනතට සංශෝධන.
- CAASL, ගුවන් තොටුපළ සහ ගුවන්සේවා ශ්‍රී ලංකා සමගම සහ ශ්‍රී ලන්කන් ගුවන් සේවයෙහි අවසන් යෝජනා රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.
- 2018 අංක 29 දරන ගුවන් ප්‍රවාහන පනත සංශෝධනය කිරීම.
- පළමු කෙටුම්පත සඳහා කෙටුම්පත CAASL නිරීක්ෂණ රේඛීය අමාත්‍යාංශය හරහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී.
- ගුවන් සංචාලන අංශය මගින් නිකුත් කරන ලද සියලුම ලියකියවිලි වල නීත්‍යානුකූල වලංගුභාවය සමාලෝචනය කරන ලදී.
- මෙම වසර තුළ, LA&E ඒකකය නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහාය ඇතිව නඩු හයක් (6) සඳහා තිස් එක් (31) වතාවක් අධිකරණයට ඉදිරිපත් වූ අතර, එක් (1) අභියාචනාධිකරණ නඩුවක්, එක් (1) මහාධිකරණ නඩුවක්, මහේස්ත්‍රාත් අධිකරණ නඩු දෙකක් (2) සහ කම්කරු විනිශ්චය සභා නඩු දෙකක් (2) CAASL විසින් ගොනු කර ඇති සහ CAASL ට එරෙහිව ගොනු කර ඇත.

මෙම නඩු සඳහා, අපි අධිකරණයට ඉදිරිපත්

කිරීමට නීතිමය ලියකියවිලි නවයක් (09) සකස් කර ඇත. තවද, ඉහත සිද්ධීන් සඳහා සහ ගුවන්සේවා රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම සඳහා LA&E ඒකකය නීතිපති දෙපාර්තමේන්තුවේ සහ නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ උපදේශන දහ අටකට (18) සහභාගී විය.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට ලබා දී ඇති නීති උපදෙස්/නීති උපදේශනයන්



තොරතුරු සන්නිවේදන සහ තාක්ෂණ (ICT) ඒකකය

කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා නව පද්ධති සහ තාක්ෂණයන් කිහිපයක් ක්‍රියාත්මක කරමින් තොරතුරු තාක්ෂණ ඒකකය පසුගිය වසර තුළ සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. අපගේ කැපී පෙනෙන ජයග්‍රහණවලින් සමහරක් පහත සඳහන් වේ:

- CAASL ඩිජිටල් සිදුවීම් වාර්තාකරණ පද්ධතිය සහ පරිපාලක උපකරණ පුවරුව සංවර්ධනය කිරීම
- අක්තපත්‍ර නිකුත් කිරීමේ පද්ධතිය සංවර්ධනය කිරීම
- ඩ්‍රෝන් අනුමත කිරීමේ මාර්ගගත පද්ධතිය සහ පරිපාලක උපකරණ පුවරුව සංවර්ධනය කිරීම
- AVSEC සහතික අධීක්ෂණ පද්ධතිය සංවර්ධනය කිරීම
- ගුවන් අනතුරට ගොදුරු වූවන් සම්බන්ශයෙන් ඇති වෙබ් යෙදුම සංවර්ධනය කිරීම
- NGAP ඡායාරූප තරඟ වෙබ් යෙදුම සංවර්ධනය කිරීම
- නිරීක්ෂණ සැලසුම් අධීක්ෂණ යෙදුම සැකසීම සහ වින්‍යාස කිරීම
- විගණන සමීක්ෂණ යෙදුම සහ පරිපාලක උපකරණ පුවරුව සංවර්ධනය කිරීම
- AVSEC මාර්ගගත විභාග ක්‍රමය සංවර්ධනය කිරීම - දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතියකි
- මාර්ගගත නිරීක්ෂණ පද්ධතිය සංවර්ධනය - අදියර I
- ගුවන් යානා සහ මගී සංචලන පිළිබඳ සංඛ්‍යාන පිටුව සංවර්ධනය කිරීම

සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධන සහ මාධ්‍ය ඒකකය

අනාගතය සඳහා ආයෝජනය - පාසල් ළමුන් සඳහා ගුවන් සේවාව පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන





ශ්‍රී ලංකාවේ අනාගත පරපුර අතර ගුවන්සේවා සම්බන්ධ දැනුම ගොඩනැගීමේ අරමුණින් පාසල තුළ 'සිවිල් ගුවන්සේවා සමාජයකී පිහිටුවීම පිළිබඳව සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පහක් පවත්වන ලදී. මෙම වැඩසටහන් වල අරමුණ වන්නේ මෙම විෂය පිළිබඳ වැඩි දැනුවත්භාවයක් සහ උනන්දුවක් ඇති කිරීම සඳහා සිවිල් ගුවන්සේවා සංකල්පය සමඟ තරුණ සිසුන් සම්බන්ධ කර ගැනීමයි.

හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලය	- 2022 මාර්තු 25
මීරිගම ඩී එස් සේනානායක විද්‍යාලය	- 2023 සැප්තැම්බර් 30
රුවන්වැල්ල මධ්‍ය මහා විද්‍යාලය	- 2023 ඔක්තෝබර් 3
බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලය	- 2023 නොවැම්බර් 16
මහියංගනය මධ්‍ය මහා විද්‍යාලය	- 2023 නොවැම්බර් 17





ගුවන්සේවා පිලිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු - ගුවන්තොටුපළ

පාසල් දැනුවත් කිරීමේ වැඩසටහනේ දෙවන පියවර ලෙස සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධන ඒකකය විසින් ගුවන් තොටුපළ වැඩමුළු හඳුන්වා දී ඇති අතර, වැඩමුළු සඳහා සිසුන් 250 දෙනෙකු සහභාගී වුනි. මෙයාකාරයෙන්, වැඩසටහන් දෙකක් ද පවත්වන ලදී.

- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ (සිසුන් 250) 2023 - ඔක්තෝබර් 11 වැනි දින



මෙහෙයවීම සහ කළමනාකරණය



විශේෂ උත්සව සංවිධානය

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා දිනයේ 78 වැනි සංවත්සර උත්සවය වීම සුවිශේෂී අවස්ථාව සිහිපත් කිරීම සඳහා ප්‍රවර්ධන ඒකකය විසින් සංවිධානය කරන ලද අතර මෙහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා සහභාගි විය.

දේශීය සහ ජාත්‍යන්තර පාඨකයන් සඳහා නව මාධ්‍යයන් හරහා සිවිල් ගුවන්සේවා පිලිබඳ තොරතුරු බෙදා හැරීම

වෙබ් පාදක සම්පත් සහ සමාජ මාධ්‍ය වැනි නව මාධ්‍යයන්, සිවිල් ගුවන්සේවා අධිකාරිය සහ එහි ක්‍රියාකාරකම් මෙන්ම සිවිල් ගුවන්සේවා සම්බන්ධ තොරතුරු දේශීය හා ගෝලීය ප්‍රජාවන් අතර දැනුවත් කිරීම සඳහා ප්‍රයෝජනවත් මාධ්‍යයන් ලෙස සැලකේ. මේ සඳහා, නුදුරු අනාගතයේ දී මෙම මාධ්‍යයන් දැනුවත් කිරීම සහ අර්ථවත් අන්තර්ගතයන් දියත් කිරීමට සහ මෙම මාධ්‍ය විකල්පයන් පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට මෙම අංශය කටයුතු කරමින් සිටී.

අනාගත මාධ්‍ය උත්සාහයන්

අතීතයේ සහ වර්තමානයෙහි සියලුම වැදගත් දත්ත සංරක්ෂණය කිරීමේ අරමුණින්, මෙම අංශය මඟින් වසර තුළ විද්‍යුත් පුස්තකාලයක් ආරම්භ කරන ලදී. මෙම අංශය මෙම පුස්තකාලයේ අන්තර්ගතය සාරවත් කිරීමට අඛණ්ඩව කටයුතු කරන අතර ඓතිහාසික වශයෙන් වැදගත් කරුණු සහ සිදුවීම් අඛණ්ඩ පදනමක් මත සම්පාදනය කිරීම සඳහා කටයුතු කරයි.

ගුවන් වෛද්‍ය සේවා ඒකකය

වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රධාන මහජන සෞඛ්‍ය පිලිබඳ ක්‍රියාකාරකම් පහත දැක්වේ;

- සෞඛ්‍ය අමාත්‍යාංශය, සංචාරක අමාත්‍යාංශය සහ WHO හි ජාතික කමිටු කිහිපයක CAASL නියෝජනය.
- සෞඛ්‍ය අමාත්‍යාංශය, ජාතික COVIa මධ්‍යස්ථානය සහ ඌධ කාර්යාලය වැනි ජාතික අධිකාරීන් සමඟ සම්බන්ධීකරණයෙන් COVID-19 රෝගය පැතිරීම වැළැක්වීමේ ක්‍රියාකාරකම් සඳහා ගුවන් වෛද්‍ය සේවා ඒකකය සිය දායකත්වය දිගටම කරගෙන ගියේය.
- ලෝක සෞඛ්‍ය සංවිධානය සහ සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ එක්ව COVID-19 රෝග නිවාරණය සඳහා ගුවන්සේවා කර්මාන්තය සඳහා මාර්ගෝපදේශයන් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය සම්පත්ලෙ, මානව සම්පත් ලෙස සපයනු ලබන ලදී.
- මහජන සෞඛ්‍ය සිදුවීම් වැළැක්වීම සඳහා ක්‍රියාකාරීව සම්බන්ධ වී, ජාතික IHR මෙහෙයුම් කමිටු රැස්වීම් සහ ජාතික ඒවියන් ඉන්ෆ්ලුවෙන්සා (Avian Influenza) රැ ස්වීම්වල කමිටු සාමාජිකයෙකු ලෙසද සෞඛ්‍ය අමාත්‍යාංශයේ පැවති රැස්වීම්වලදී CAASL නියෝජනය කළේය.
- ගුවන් වෛද්‍ය සේවා ඒකකයේ ජාත්‍යන්තර ජයග්‍රහණයන:

1. ICAO ආසියා පැසිෆික් මහජන සෞඛ්‍ය කමිටුවේ ගුවන් සේවයේ ක්‍රියාකාරී සාමාජික, ICAO CART (Council Aviation Recovery Taskforce) ලේඛනය සහ CAPSCA රෙගුලාසි වැනි ගුවන්සේවා ආශ්‍රිත මහජන සෞඛ්‍ය ලේඛන සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණික සහාය සහ උපදෙස් ලබා දෙන සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීම.

2. ICAO ඇමුණුම 9 වෙත වැඩිදියුණු කිරීම් සහ සංශෝධන සොයා බැලීම සඳහා ICAO ගුවන්සේවා තුළ සෞඛ්‍ය ගැටලු පැතිරීම (HIOATF) පිලිබඳ කාර්ය සාධක බලකාය සහ එක් ක්‍රියාකාරී කණ්ඩායමක නායකයා ලෙස අඛණ්ඩව කටයුතු කිරීම.

ගුවන්සේවා වෛද්‍ය සහ ගුවන්සේවා මහජන සෞඛ්‍ය විධිමත් කිරීමේ ක්‍රියාමාර්ගයන් (ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව ICAO සහ WHO) සම්පූර්ණ කර ඇත;

- COVID-19 සඳහා විශේෂ උපදෙස්
- ICAO, WHO සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නවතම අවශ්‍යතා අනුව වරින් වර සංශෝධන සහිතව ප්‍රකාශයට පත් කෙරේ.
- ගුවන් සේවාවන් වල මහජන සෞඛ්‍ය වැළැක්වීමේ අවශ්‍යතා සඳහා වන සාමාන්‍ය දිශානතිය 011 හි 02 වන සංස්කරණය දේශීය සහ ජාත්‍යන්තර අවශ්‍යතාවන්ට අනුකූලව (GD 011) ප්‍රකාශයට පත් කරන ලදී.

නවතම ICAO සහ EASA රෙගුලාසිවලට අනුව ජාතික ගුවන් වෛද්‍ය සේවා රෙගුලාසි සංශෝධනය කිරීම;

- ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිති 036 (IS 036) හි 3 වන සංස්කරණය 2022 මාර්තු මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදී.
- SLCAP 3020 හි 3 වන සංස්කරණය ප්‍රකාශයට පත් කරන ලදී

තාක්ෂණික පුස්තකාල ඒකකය

ලේඛන කළමනාකරණය

තාක්ෂණික පුස්තකාලය දැනුම සොයන්නන් සඳහා කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියා කරන අතර ගුවන්සේවා රෙගුලාසි යාවත්කාලීන කිරීම් ඇතුළුව ගෝලීය ගුවන්සේවා කර්මාන්තය පිළිබඳ වර්තමාන දැනුම සහ අතිවිශාල තොරතුරු ඉදිරිපත් කරයි. සමාලෝචිත වර්ෂය පුරාවට රු. 2022 වර්ෂය සඳහා පුස්තකාලයට නව ප්‍රකාශන මිලදී ගැනීම සඳහා රු. 364,970.66ක් වැය කරන ලදී. ඊට අමතරව කාර්ය මණ්ඩලය අතර යාවත්කාලීන කිරීම් බෙදා හැරීමේ අරමුණින් තාක්ෂණික පුස්තකාලය මඟින් අංශ පුස්තකාල අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබීය.

වසර තුළ බාගත කර පරීක්ෂා කරන ලද ICAO ප්‍රකාශන 1770 න්, එය පිළිවෙළින් හතළිස් අටක් (48) සහ 1037 ක් තාක්ෂණික පුස්තකාලය සහ අංශ පුස්තකාල සඳහා ප්‍රවේශ වී යාවත්කාලීන කර ඇත. රාජ්‍ය ලිපි 341ක් අදාළ අංශ/කොට්ඨාශ අතර බෙදා හැර ඇත.

වසර පුරා, USOAP CMA වැඩසටහනේ අඛණ්ඩ ප්‍රගති කළමනාකරණයක් පැවති අතර එහිදී නිවැරදි කිරීමේ ක්‍රියාකාරී සැලසුම් (CAP) අනුව ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා අංශ රැස්වීම් පවත්වන ලදී. තාක්ෂණික පුස්තකාලය විශ්ව ආරක්ෂණ අධීක්ෂණ විගණන වැඩසටහන යටතේ ICAO හි ප්‍රොටෝකෝල ප්‍රශ්න (PQ) සම්බන්ධීකරණය සහ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා දත්ත සමුදායන් සංවර්ධනය කරන ලදී - තාක්ෂණික අංශ සඳහා අදාළ වන අඛණ්ඩ අධීක්ෂණ ප්‍රවේශය (USOAP-CMA) මෙහෙයුම් (126 PQs), ගුවන් යෝග්‍යතාවය (186 PQs), පුද්ගල බලපත්‍ර (PQs 93), ගුවන් සංචාලනය (122 PQs), හදිසි අනතුරු විමර්ශන (PQs 84), ගගන යාත්‍රාංගන (143 PQs), සංවිධානය (13 PQs) සහ නීතිමය (23 PQs). ICAO වෙත ඉදිරිපත් කිරීම සඳහා ප්‍රොටෝකෝල ප්‍රශ්න, අනුකූලතා පිරික්සුම් ලැයිස්තු සහ රාජ්‍ය ගුවන්සේවා ක්‍රියාකාරකම් ප්‍රශ්නාවලියේ ප්‍රගතිය සඳහා වරින් වර සමාලෝචන කර ඇත.

ලේඛන කළමනාකරණය (ජනවාරි-දෙසැම්බර් 2022)



CAASL **වෙබ් අඩවිය**

CAASL හි වෙබ් අඩවිය අඛණ්ඩව යාවත්කාලීන කර ඇත

වසර 2021

51,692

නරඹන්නන්

වසර 2022

92,284

නරඹන්නන්





ගගන යාත්‍රාංගන සේවා නියාමන ශාඛාව



ගගන යාත්‍රාංගන සේවා නියාමන ශාඛාව

ගගන යාත්‍රාංගන අංශය

ගගන යාත්‍රාංගන සහතික කිරීම

සෑම ජාත්‍යන්තර ගුවන්තොටුපළක්ම IS 30 ප්‍රමිතියට අනුව සහතික කළ යුතු අතර මෙම සහතිකය වසර දෙකක කාලයක් සඳහා වලංගු වේ. මෙම සහතිකය අලුත් කිරීම ගගන යාත්‍රාංගන අංශය විසින් කරනු ලබන ගුවන් යාත්‍රාංගණ සහතික අලුත් කිරීමේ විගණනයට යටත් වේ.

පහත සඳහන් ගුවන් තොටුපළවල් සඳහා සහතික 2022 වර්ෂයේදී අලුත් කර ඇත.

- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ
- යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ

කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපළ රත්මලාන IS 30 ප්‍රමිති අනුකූලතාව සඳහා විගණනය කරන ලද අතර 2022 දී ගුවන් යාත්‍රාංගන සහතිකය නිකුත් කරන ලදී.

බලපත්‍ර ලබා දීම්

ජාත්‍යන්තර අවශ්‍යතාවයක් ලෙස ජාත්‍යන්තර ගුවන් ගමන් සඳහා ගුවන් යානා සහතික කිරීම අත්‍යවශ්‍ය වන අතර, දේශීය ගුවන් යානා SARPS ප්‍රමිතීන් වලට අනුකූල වීම සහ සහතික කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින් මධ්‍යකලපුව අභ්‍යන්තර ගුවන් තොටුපළෙහි බලපත්‍රය විගණනයක් සිදු කර අලුත් කරන ලදී.

නිරීක්ෂණ කටයුතු

අවදානම් මත පදනම් වූ ප්‍රවේශයක් සලකා බලමින් නිරීක්ෂණ කටයුතු සැලසුම් කර ඇත. නිරීක්ෂණ කටයුතුවලට බලපෑ සිදුවීම් හේතුවෙන්, එම අංශය විසින් අනුමත කරන ලද නිරීක්ෂණ සැලැස්ම 2022 සතුටුදායක මට්ටමකට සිදු කරන ලද්දේ රට තුළ ඇති සිවිල් ගුවන් යානාවල ආරක්ෂාවට අනතුරක් නොවන පරිදි ය.

අනුමත කිරීම්

- BIA හි ටර්මිනල් 2 ව්‍යාපෘතිය්

BIA නව 2 මගී පර්යන්තය ව්‍යාපෘතිය ආරම්භ කළේ වසරකට අමතර මගීන් මිලියන 9ක් හැසිරවීම සඳහාය. සෑම සංවර්ධන අදියරකදීම, කොන්ත්‍රාත්කරු සහ ක්‍රියාකරු විසින් ආරක්ෂිත තක්සේරු කිරීම් සිදු කළ යුතු අතර ඒවා සමාලෝචනය සහ අනුමත කිරීමේ අරමුණු සඳහා CAASL වෙත ඉදිරිපත් කළ යුතුය. රෙගුලාසිවලට අනුකූල වීම සහ ආරක්ෂිත ගුවන් ගමන් සහතික කිරීම සඳහා එවැනි තක්සේරු කිරීම් 2022 ඇතුළත සමාලෝචනයෙන් පසුව අනුමත කර ඇත.

- BIA හි ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධතිය වැඩිදියුණු කිරීම.

BIA තුළ දැනට පවතින ධාරිතා වැඩිදියුණු කිරීම්වලට අනුකූල වන පරිදි කාර්යක්ෂම සහ ආරක්ෂිත ඉන්ධන සැපයුමක් සැපයීම සඳහා CEYPETCO නව ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධතියක් ස්ථාපනය කිරීමට පියවර ගෙන ඇත.

ගගන යාත්‍රාංගන අංශය විසින් ඉන්ධන හයිඩ්‍රන්ට් පද්ධති ස්ථාපනය කිරීමේ අදියරයන් සඳහා ආරක්ෂිත තක්සේරු සමාලෝචනය කිරීමෙන් ගුවන් තොටුපලේ ආරක්ෂිත ගුවන් යානා ක්‍රියාකරණය සහතික කරයි.

- JIA ජාත්‍යන්තර ක්‍රියාකරණය නැවත ආරම්භ කිරීම.

CAASL හි අදාළ සියලුම අංශවල සහභාගීත්වය ඇතිව, JIA හි පසු විගණන විගණනයක් සිදු කරන ලද අතර 2022 දෙසැම්බර් මාසයේදී ජාත්‍යන්තර ක්‍රියාකරණය නැවත ආරම්භ කිරීම සඳහා අවශ්‍යතා සපුරාලීම සහතික කරන ලදී.

රෙගුලාසි

ෆ්ලෝට් ප්ලේන් ගුවන් ගමන් සංචාරක ආකර්ෂණය වැඩි වශයෙන් ලබා ඇති අතර, රට අභ්‍යන්තරය තුල සංචාරකයින්ට විවිධ ගමනාන්ත වෙත ගමන් කිරීමට ඉඩ සලසයි. ජලයේ ඇති ගගන යාත්‍රාංගන නියාමනය කිරීමට අවශ්‍ය රෙගුලාසි සඳහා ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කිරීම CAASL කටයුතු සලස්වමින් පවතී. ඇමුණුම 14 හි 9 වන සංස්කරණය ෂක්ධ සහ ජාතික ක්‍රියාත්මක වන IS 30 විසින් ප්‍රකාශයට පත් කරන ලද අතර, ඇමුණුම 14 හි නව සංස්කරණයේ සංශෝධන ඇතුළත් කිරීම සඳහා සංශෝධනය කර ඇත. ගගන යාත්‍රාංගන සහතික කිරීම සඳහා වන ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීම - IS 37 වන අතර, ගගන යාත්‍රාංගන සහතික කිරීම සඳහා අවශ්‍යතා එහි ඇතුළත් වන පරිදි සංශෝධනය කර ප්‍රකාශයට පත් කරන ලදී.

බාධක රහිත අවකාශ කළමනාකරණය (OLS)

ගගන යාත්‍රාංගන අංශය විසින් දිවයිනේ ගුවන් තොටුපළ අවට ඇති බාධකයන්, සීමාවන්ට අනුකූලද යන්න පරීක්ෂා කිරීම සඳහා ගොඩනැගිලි, ව්‍යුහයන්, විදුලි සංදේශ කුළුණු, සුළං ටර්බයින සහ විදුලිබල බෙදාහැරීමේ මාර්ගවල යෙදීම් ඇගයීමට ලක් කර ඇත.

ගුවන් සන්තරණ සේවා (ANS) අංශය

ගුවන් සන්තරණ සේවා අධීක්ෂණය සඳහා ANS නියාමන රාමුව යාවත්කාලීන කිරීම

ගුවන් සන්තරණ සේවා අංශයේ මූලික වගකීම වන්නේ ICAO විසින් අනුගමනය කරන ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පිළිවෙත් (SARPs) ක්‍රියාත්මක කිරීමයි. මෙම නිර්දේශිත පිළිවෙත් ඇමුණුම 2, 3, 4, 5, 10, 11, 12 සහ 15 හි අඩංගු වේ. ඒ අනුව, ගුවන් සංචාලන සේවා විධිමත් කිරීම සඳහා අදාළ ICAO ඇමුණුම්වල නවතම අනුවාදයට අනුකූල වන පරිදි ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් පහක් යාවත්කාලීන කරන ලදී.

ගගන නාවික සේවා නියාමන ශාඛාව

විගණන සහ නිරීක්ෂණ කටයුතු

සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් (DGCA) විසින් අනුමත කරන ලද NSA නිරීක්ෂණ සැලැස්ම ට අනුව ගුවන් සන්තරණ සේවා අංශය විසින් අබණ්ඩව ගුවන්සේවා කර්මාන්තය පිළිබඳ නිරීක්ෂණ සිදු කරන ලදී. ශ්‍රී ලංකාව තුළ ගුවන් සන්තරණ සේවා සැපයීමේදී ආරක්ෂිත අධීක්ෂණ පද්ධතියේ සඵලතාවය සහතික කිරීම සඳහා නියමිත පරීක්ෂණ අනූ හතක් (97) සිදු කරන ලදී.

ගුවන් සන්තරණ සේවා අංශය බණ්ඩාරනායක ජාත්‍යන්තර, කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපළ රත්මලාන සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළවල ගුවන් යානා සහතික කිරීම අලුත් කිරීමේ විගණනයට සහභාගී විය.

ATC සිමියුලේටර පරීක්ෂණ සහ ශ්‍රේණිගත කිරීම් ඇගයීම්

ගුවන් සන්තරණ සේවා අංශය විසින් ගුවන් ගමන් පාලන සේවාව සැපයීමේ දී වැඩිදියුණු සහ ස්ථාවර නිපුණතාවයක් සහතික කිරීම සඳහා ගුවන් ගමන් පාලකයින් පිළිබඳ ATC සිමියුලේටර පරීක්ෂණ හයක් (06) සහ ශ්‍රේණිගත කිරීම් ඇගයීම් තිස් නවයක් (39) සිදු කරන ලදී.

විමර්ශන

ගුවන් සන්තරණ සේවා අංශය විසින් ගුවන් ගමනාගමන කළමනාකරණය සම්බන්ධ සිදුවීම් සහ සන්නිවේදන සන්තරණ සහ නිරීක්ෂණ (CNS) සම්බන්ධ සිදුවීම් අවම කිරීම, අසාර්ථකවීම සහ නැවත ඇතිවීම අවම කිරීම සඳහා පරීක්ෂණ දෙකක් (02) සිදු කළේය.

ගුවන් ගමන් බලපත්‍ර/ගොඩබෑමේ නිෂ්කාශන

ගුවන් සන්තරණ අංශය ශ්‍රී ලංකා භූමියට ඉහළින් පියාසර කිරීම සඳහා නියමිත කාලසටහන්ගත නොවූ ගුවන් යානා 991 ක් සඳහා අනුමැතිය ලබා දුන් අතර ශ්‍රී ලංකාවට ගොඩබෑම සඳහා අවසර 383 ක් ලබා දුන්නේය. එමෙන්ම Aerial Work Operations සඳහා අනුමැතීන් පනස් තුනක් (53) ද ලබා දෙන ලදී. ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපළ වෙත රාජ්‍ය තාන්ත්‍රික ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීම සහ ශ්‍රී ලංකා භූමියට ඉහළින් පියාසර කිරීමට යෝජනා කළ ගුවන් ගමන්, ගුවන් සන්තරණ සේවා අංශය විදේශ කටයුතු අමාත්‍යාංශය සමඟ සම්බන්ධීකරණය ද කළේය.

AIP සංශෝධන, AIP අතිරේක, ගුවන් තොරතුරු චක්‍රලේඛ (AIC) සහ NOTAM

AIP සංශෝධන දෙකක් (02), AIP අතිරේක හතක් (07) සහ ගුවන් තොරතුරු චක්‍රලේඛ හතරක් (04) නිකුත් කරන ලද අතර මෙහෙයුම් ක්‍රියාකාරකම් පිළිබඳ NOTAM හාරසිය දහසයක් (416) පරීක්ෂාවට ලක් කර නිකුත් කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

ගුවන් සන්තරණ සේවා සම්බන්ධයෙන් ආරක්ෂිත තක්සේරු කිරීම් පැවැත්වීම

පහත සඳහන් ආරක්ෂක සමාලෝචන සිදු කරන ලද අතර නව ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කරන ලදී

කොළඹ FIR තුළ 50NM දේශාංශ වෙන් කිරීම ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද ආරක්ෂණ තක්සේරුව සමාලෝචනය කරන ලද අතර කොළඹ FIR හි R කාණ්ඩයේ ගුවන් සීමාව තුළ 50NM කල්පවත්නා වෙන් කිරීමේ අවම යෙදුම සඳහා අනුමැතිය ලබා දෙන ලදී.

- මාලේ සහ කොළඹ TMA අතර 30NM අවම යෙදුම සම්බන්ධයෙන් සිදු කරන ලද ආරක්ෂිත තක්සේරුව සමාලෝචනය කරන ලදී.

ශ්‍රී ලංකා ගුවන් සන්තරණ සැලැස්ම (SLANP) සංවර්ධනය කිරීම

DGCA විසින් අනුමැතිය සහිතව ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ එක්ව SLANP සංවර්ධනය කරන ලද අතර, එය CAASL වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

ANS පුහුණුවීම් සහ රැස්වීම්

ANS ආශ්‍රිත නියාමන කාර්යයන් ඉටු කිරීම සඳහා ප්‍රමාණවත් පුහුණු කාර්ය මණ්ඩලයක් සංවර්ධනය කිරීම සහතික කිරීමට, ගුවන් සන්තරණ සේවා අංශයේ නිලධාරීන්ට ඔවුන්ගේ වෘත්තීය නිපුණතා ශක්තිමත් කරගැනීමට සහ දැනුම පුළුල් කරගැනීම සඳහා එම විෂය කරුණුවලට අදාළ පුහුණු තිස් හතරක් (34) සඳහා නිරාවරණය වන ලදී. ගුවන් සන්තරණ සේවා අංශයේ නිලධාරීන් ICAO සහ විෂය කරුණු සම්බන්ධ අනෙකුත් රැස්වීම්වලට ද සහභාගී වූහ.

කොළඹ පියාසැරි තොරතුරු කලාපය තුළ සෙවීම් සහ මුදාගැනීමේ (SAR) සේවා

CAASL විසින් ජාතික ගුවන් සෙවීම් සහ මුදාගැනීමේ සැලැස්මක් (NASARP) පිහිටුවීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. NASARP හි පළමු අදියර ජාතික ගුවන් සෙවීම් සහ මුදාගැනීමේ කමිටුවේ (NASC) අවසරය ලැබීමෙන් අවසන් කරන ලදී.

NASARP හි අවසන් කරන ලද පළමු සංස්කරණය පාර්ශවකරුවන් විසිදෙනෙකු (20) අතර බෙදා හරින ලදී.

ANS සැපයුම් වලට අදාළ නියාමන රාමුවක් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ බලාත්මක කිරීම සඳහා මාර්ගෝපදේශයන් සංවර්ධනය කිරීම.

ANS පරීක්ෂක අත්පොතෙහි 3 වන සංස්කරණය 2022 සැප්තැම්බර් 12 දින නිකුත් කරන ලදී.

ආයතනික කටයුතු සහ කාර්යාල කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ දායකත්වය.

නිරන්තර යොමු කිරීම් සහ සමාලෝචනයන් හරහා, CAASL හි කාර්යාල අත්පොතෙහි පිරික්සුම් ලැයිස්තු, මාර්ගෝපදේශනයන් සහ ANS පරිච්ඡේදයන් යාවත්කාලීන කර ඇත.



පියාසර නිරුපද්‍රතතා නියාමන ශාඛාව



පියසර නිරුපද්‍රුතතා නියාමන ශාඛාව

පුහුණු සංවිධාන සහ පුද්ගල බලපත්‍ර අංශය

මෙම වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා සමාලෝචනයට ලක්වන කාලසීමාව තුළ පුහුණු ආයතන සහ පුද්ගල බලපත්‍ර අංශයේ කාර්ය සාධනය පහත පරිදි වේ.

- දැනට පවතින ගුවන් යානා කාර්ය මණ්ඩල බලපත්‍ර පිරික්සුම් ලැයිස්තු සංශෝධනය කර පවතින බලපත්‍ර පද්ධතියට එකතු කරන ලදී.
- වර්ග ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂක (TRE) රේෆරෙෂර් පුහුණුව, සැහැල්ලු උපදේශක පරීක්ෂක (FIE) රේෆරෙෂර් පුහුණුව සහ වර්ග ශ්‍රේණිගත කිරීමේ උපදේශක (TRI) පුහුණුව, IS 072 ට අනුව CAASL හි මෙම අංශයෙන් සිදු කරන ලදී.
- වර්ග ශ්‍රේණිගත කිරීමේ පරීක්ෂක (TRE) රේෆරෙෂර් පුහුණුව, සැහැල්ලු උපදේශක පරීක්ෂක (FIE) රේෆරෙෂර් පුහුණුව සහ අවසරයන් පිලිබඳ පුහුණුව, IS 072 අනුව නිකුත් කර ඇත.
- එක් සාමාන්‍ය ගුවන් පරීක්ෂකවරයකු අවශ්‍ය පුහුණුව සම්පූර්ණ කල අතර, අවසරය ලබා දෙන ලදී.
- IS 072 ට අනුකූලව ඔජබ කුසලතා පරීක්ෂණ පෝරමය සකස් කිරීම.
- ICAO ඇමුණුම 1 - 178 සංශෝධනවලට අනුව කාඩ්පත් බලපත්‍රය මුද්‍රණය කිරීම 2022 දෙසැම්බර් 7 වන දින ආරම්භ කරන ලදී.
- IS 072 ට අනුකූලව පියාසර කාර්ය මණ්ඩලය සඳහා සංඛ්‍යාලේඛනවල දත්ත සමුදා ආකෘතිය සංශෝධනය කරන ලදී.
- IS 66 හි අවශ්‍යතා අනුව AML අයදුම්පත්‍රය බලපත්‍ර පද්ධතියට ඇතුළත් කිරීම ආරම්භ කිරීම.
- ශ්‍රී ලංකා ගුවන්සේවා විද්‍යාලය සඳහා සටන් මෙහෙයුම් නිලධාරී/ඩිස්පැචර් පුහුණු පාඨමාලාව අනුමත කිරීම.
- පියාසර මෙහෙයුම් නිලධාරී/ඩිස්පැචර් පුහුණු පාසල සඳහා සහතික කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම.
- AML සෘජු පාඨමාලා අනුමත කිරීම් විදේශීය පුහුණු සංවිධාන විසින් පවත්වනු ලබන ගුවන් යානා වර්ග ශ්‍රේණිගත කිරීම සඳහා ඔවුන්ගේ සත්‍යාපනයෙන් පසුව ලබා දෙන ලදී.
- ATC 052 පාඨමාලා න්‍යාය විභාග, ගුවන් මෙහෙයුම් නිලධාරී/ඩිස්පැචර් විභාග, නියමු, AFI න්‍යාය සහ viva සහ ELPC චෙක්පත් විභාග අංශයේදී පවත්වන ලදී.
- ගුවන් යානා නඩත්තු විභාගය දෙවරක් BMICH හිදී සාර්ථකව පවත්වන ලදී.
- විභාග අංශයේදී ප්‍රශ්න බැංකු යාවත්කාලීන කරන ලදී.
- CAP සහ SAAQ සම්පූර්ණ කිරීම.
- ඇමුණුම 1 හි සංශෝධනයට අනුj IS 50, IS 68 වැනි දැනට පවතින IS යාවත්කාලීන කිරීම සම්පූර්ණ කරන ලදී.
- සකුරායි ගුවන් සේවයේ පියාසර මෙහෙයුම් අත්හිටුවීම.

ගුවන් යානා මෙහෙයුම් අංශය

ගොඩබිම හැසිරවීම් සහ සේවා සපයන්නන්ගේ සහතිකය

- 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 31 (k) වගන්තියට අනුව ගොඩබිම් හසුරුවන්නන් සහතික කිරීම අනිවාර්ය අවශ්‍යතාවයක් වූ අතර එය කල් පැන ඇත. ගොඩබිම් හැසිරවීමේ බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා රෙගුලාසි සහ මාර්ගෝපදේශයන් හඳුන්වා දීමෙන් මෙය නිවැරදි කරන ලදී. ඉන් අනතුරුව, පුළුල් විගණනයකින් පසු ශ්‍රී ලංකන් ගුවන් සමාගම ගොඩබිම් හසුරුවන්නෙකු ලෙස සහතික කර, ගොඩබිම් හැසිරවීමේ බලපත්‍රය ශ්‍රී ලන්කන් ගුවන් සමාගම් වෙත ප්‍රදානය කරන ලදී.

නියාමක සංවර්ධනය

මෙහෙයුම් අංශය අනතුරුදායක භාණ්ඩ සඳහා 2010 අංක 14 සිවිල් ගුවන්සේවා පනතේ 78 වැනි වගන්තිය යටතේ රෙගුලාසි සකස් කර ඇති අතර මෙම ලේඛනය ඇගයීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත.

ගුවන් ක්‍රියාකරු සහතික (AOC)

- ලක්වින් ගුවන් සේවය (Lakwin Aviation) වෙත ගුවන් ක්‍රියාකරු සහතිකයක් පිරිනමන ලදී.

ගුවන් ක්‍රියාකරු සහතිකය ලබා ගැනීම සඳහා DP Aviation වෙතින් අභිප්‍රාය ලිපියක් ලැබී ඇති අතර එය සමාලෝචනය වෙමින් පවතී.

පහත AOC අයදුම්පත් සමාලෝචනය වෙමින් පවතී;

- ඕපන් ස්කයිස් (Openskies)
- ෆ්ලයි ලංකා ඒෂියා (Fly Lankan Asia (Pvt) Ltd')
- රෙඩ් බර්ඩ් එවියේෂන් (Red Bird Aviation (Pvt) Ltd.)

- ස්පාර්ක් එයාර් (Spark Air)
- ඕරා එයාර්ලයින්ස් (Aura Airlines (Pvt) Ltd.)
- එයාර් කලම්බෝ (Air Colombo)

2022 වර්ෂය සඳහා පහත සඳහන් ගුවන්සේවා හය (06) සඳහා මෙහෙයුම් අංශය මඟින් ගුවන් ක්‍රියාකරු සහතික අලුත් කරන ලදී.

- ශ්‍රී ලන්කන් ගුවන් සේවය (Sri Lankan Airlines (Pvt) Limited)
- ෆිට්ස් එවියේෂන් (Fits Aviation (Pvt) Limited)
- සෙනොක් එවියේෂන් (Senok Aviation (Pvt) Limited)
- සැෆ්රන් එවියේෂන් (Saffron Aviation (Pvt) Limited)
- IWS එවියේෂන් (IWS Aviation (Pvt) Limited)
- ෆ්ලයි සදර්න් (Fly Southern (Pvt) Limited)

විදේශ ගුවන් ක්‍රියාකරු සහතික

මෙහෙයුම් අංශය මඟින් නිකුත් කරන ලද විදේශ ගුවන් ක්‍රියාකරු සහතික හතළිස් දෙකක් (42) ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක වන ගුවන්සේවා සඳහා අලුත් කරන ලදී. 2022 දී ආරම්භක විදේශ ගුවන් ක්‍රියාකරු සහතික හතරක් (04) නිකුත් කරන ලදී. නව විදේශ ගුවන් ක්‍රියාකරුවන් වන්නේ;

- මයි ඉන්ඩෝ එයාර්ලයින්ස් (My Indo Airlines)
- විස් එයාර් (Wizz Air)
- තායි ස්මයිල් එයාර්වේස් (Thai Smile Airways)
- එලායන්ස් එයාර් (Alliance Air)

අන්තරායකර භාණ්ඩ ප්‍රවාහනය

ගුවන් යානා මෙහෙයුම් අංශය විසින් 2022 වර්ෂය සඳහා අන්තරායකර භාණ්ඩ බලපත්‍ර දාහතක් (17) අලුත් කරන ලදී. අනතුරුදායක භාණ්ඩ බලපත්‍ර සඳහා මූලික අයදුම්පත් පහක් (5) ගුවන් යානා මෙහෙයුම් අංශය වෙත ලැබී ඇති අතර ඒවා ඇගයීම් ක්‍රියාවලිය යටතේ පවතී;

- ඕමාන් එයාර් (Oman Air)
- ෆ්ලයි දුබායි (Fly Dubai)
- තායි එයාර්වේස් (Thai Airways)
- තායි ස්මයිල් එයාර්වේස් (Thai Smile Airways)
- මයි ඉන්ඩෝ එයාර්ලයින්ස් (My Indo Airlines)

කාර්ය මණ්ඩල සාමාජික සහතික

ගුවන් යානා මෙහෙයුම් අංශය මඟින් කාර්ය මණ්ඩල සාමාජික සහතික 1225ක් අලුත් කර නිකුත් කරන ලදී.

ගොඩබිමි ආධාරක සේවා බලපත්‍රය

- ස්ථාවර පාදක ක්‍රියාකරු (FBO) බලපත්‍ර දාහතක් (17) අලුත් කරන ලදී.
- ආරම්භක FBO බලපත්‍ර දෙකක් (02) නිකුත් කරන ලදී.

නම් කරන ලද චෙක් නියමු අධීක්ෂණය/නියමු ප්‍රවීණතා පරීක්ෂාව

- ගුවන් කාර්ය මණ්ඩල සාමාජිකයින් හත් (07) සඳහා නම් කරන ලද චෙක් නියමු අනුමැතිය අලුත් කරන ලද අතර 2022 වර්ෂය සඳහා එක් (01) මූලික අනුමැතියක් ලබා දෙන ලදී.
- 2022 දී සිදු කිරීමට නියමිත නියමු ප්‍රවීණතා පරීක්ෂණ (PPC) සඳහා අනුමැතිය හැට දෙකක් (62) ලබා දෙන ලදී.

නම් කරන ලද ගුවන් මෙහෙයුම් පරීක්ෂකවරුන්

නියාමන කාර්යයන් සහ නිරීක්ෂණ කටයුතු සිදුකිරීමට අවශ්‍ය වූ විට හෝ ඒ වෙනුවෙන් යම් නියාමන රාජකාරි සහ කාර්යයන් ඉටු කිරීමට අධිකාරිය විසින් පවරා ඇති බලතල සහිත නම් කරන ලද ගුවන් මෙහෙයුම් පරීක්ෂකවරුන්, දක්ෂ FOI හි හිඟය හේතුවෙන් සේවයේ යොදවා ඇත. එවැනි නම් කරන ලද ගුවන් මෙහෙයුම් පරීක්ෂකවරුන් හය දෙනෙකුගෙන් යුත් (06) අධිකාරියේ නියෝජිත කණ්ඩායම 2022 දී අලුත් කරන ලදී.

නිරීක්ෂණ කටයුතු

ඵලදායී ආරක්ෂක අධීක්ෂණ පද්ධතියක් සහතික කිරීම සඳහා අනුමත නිරීක්ෂණ සැලැස්මට අනුව CAASL නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා දේශීය සහ විදේශීය ගුවන් ක්‍රියාකරුවන් පිලිබඳ අඛණ්ඩ නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

නිරීක්ෂණ ක්‍රියාකාරකම් අතරට ප්‍රධාන මූලික විගණන, බෑවුම් පරීක්ෂාව, පුහුණු නිරීක්ෂණ, අන්තරායකර භාණ්ඩ ක්‍රියාකරුවන්, අන්තරායකර භාණ්ඩ හසුරුවන්නන්, අන්තරායකර භාණ්ඩ තොග, මාර්ග පරීක්ෂාව, සිමියුලේටර් පරීක්ෂණය, නම් කරන ලද චෙක් නියමු සහ ගොඩබිමි හැසිරවීමේ පරීක්ෂණය ඇතුළත් විය. මීට අමතරව මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ, යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ මඩකලපුව ජාත්‍යන්තර ගුවන්තොටුපළ පරීක්ෂණ 2022 සඳහා සිදු කරන ලදී.

ගුවන්යානා ලියාපදිංචි සහ ගුවන් යෝග්‍යතා අංශය

නියාමක සංවර්ධනය

2022 දී, ජාතිකත්ව ලකුණු සහ ලියාපදිංචිය පිළිබඳ රෙගුලාසි නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ අවසන් වෙමින් පවතී.

ඉන්ධන සහ ලිහිසි තෙල් සේවා සපයන්නන්ගේ සහතික කිරීම පිළිබඳ නියාමනය සහ ඇමුණුම 16 වෙළුම III සඳහා ප්‍රමිතිය ක්‍රියාත්මක කිරීම - ගුවන් යානා කාබන් ඩයොක්සයිඩ් විමෝචනය කෙටුම්පත් කිරීමේ අදියර යටතේ පවතී.

වර්ෂය තුළ පහත සඳහන් සහතික කිරීමේ ක්‍රියාකාරකම් අංශය විසින් පවත්වන ලදී.

ගුවන් යානා වල ගුවන් යෝග්‍යතාවය

2022 වර්ෂයේ දෙසැම්බර් අවසානය දක්වා ගුවන් යෝග්‍යතාවය පිළිබඳ මූලික සහතික 04ක් නිකුත් කර ඇති අතර ගුවන් යෝග්‍යතා සහතික 45ක් අලුත් කර ඇත.

අනුමත නඩත්තු සංවිධාන (AMO)

එක් මූලික නඩත්තු සංවිධාන (විදේශීය) සහතිකයක් නිකුත් කරන ලදී. වාර්ෂික විගණනය පැවැත්වීමෙන් පසු නඩත්තු සංවිධාන (දේශීය) සහතික 10 ක් අලුත් කරන ලද අතර FAMO (විදේශීය) සහතික 60 ක් අලුත් කරන ලදී. ලංකා බනිජ තෙල් නීතිගත සංස්ථාව සඳහා RMA, BIA, MRIA සහ JAF හි විශේෂ AMO අනුමත කිරීම් 04ක් ලබා දී ඇත.

ශ්‍රී ලංකන් ගුවන් සේවයේ නඩත්තු පහසුකම පිළිබඳව පුළුල් විගණනයක් සිදු කරන ලදී.

ගුවන් යානා ලියාපදිංචි කිරීම්

2022 දෙසැම්බර් අවසානය දක්වා නව ගුවන් යානා 04ක් ලියාපදිංචි කර ඇති අතර 67ක් අලුත් කර ඇත. සමාලෝචිත කාලසීමාව තුළ ශ්‍රී ලංකා ගුවන් බලඇණියේ මුළු ගුවන් යානා 02ක් ලියාපදිංචිය ඉවත් කර ඇති අතර ගුවන් යෝග්‍යතා පිළිබඳ අපනයන සහතික 01ක් නිකුත් කරන ලදී.

නඩත්තු පුහුණු සංවිධාන (MTO)

වාර්ෂික විගණනය පැවැත්වීමෙන් පසු AMTO සහතික 02 ක් අලුත් කරන ලදී.

අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධාන (CAMO)

වාර්ෂික විගණනය කිරීමෙන් පසු CAMO සහතික 08 ක් නිකුත් කරන ලදී.

බලාත්මක කිරීම්

Cessna 4R-FAA සහ 4R-EXP වල ලියාපදිංචිය ඉවත් කරන ලදී.



ගුවන්සේවා ආරක්ෂක නියාමන ශාඛාව



ගුවන්සේවා ආරක්ෂක නියාමන ශාඛාව

ගුවන්සේවා ආරක්ෂක අංශය

ගුවන්සේවා ආරක්ෂක අංශය විසින් 2022 දී ගුවන් සුරක්ෂිතතා අංශය නියෝජනය කරන සිවිල් ගුවන්සේවා නියාමන වර්ධනයන් සඳහා පහත ආරක්ෂක විධාන තුන (03) නිකුත් කිරීම මගින් ගුවන් සුරක්ෂිතතා කටයුතු සම්බන්ධයෙන් ආරක්ෂක පාර්ශවකරුවන් යොමු කිරීම සඳහා දායක විය.

1. තර්ජන මට්ටම දැනුම්දීම
2. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළෙන් ආරම්භ වූ ජපානයට සෘජු සහ සංක්‍රමණ ගුවන් ගමන් සඳහා පමණක් පාලන ආරක්ෂක පියවරයන් වැඩිදියුණු කිරීම (සැප්තැම්බර් 25 සිට 29 දක්වා කාලය තුළ).
3. අභ්‍යන්තර ගුවන් යානා ක්‍රියාකරුවන්ගේ ආරක්ෂක වැඩසටහන (ක්‍රියාත්මක වන දිනය- 01/02/2023)

තවද, ජාතික මට්ටමේ ගුවන්සේවා ආරක්ෂක මිණුම් සලකුණු ලේඛන පිළිබඳ වාර්ෂික සමාලෝචන සිදු කරන ලද අතර, සංශෝධනය කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන එම ලේඛන යාවත්කාලීන කිරීමට සහ 2023 දී ප්‍රකාශයට පත් කිරීමට සැලසුම් කරන ලදී.

- ජාතික සිවිල් ගුවන්සේවා සුරක්ෂිතතා වැඩසටහන (NCASP)
- ජාතික සිවිල් ගුවන්සේවා තත්ව පාලන වැඩසටහන (NCAQCP)
- ජාතික සිවිල් ගුවන්සේවා පුහුණු වැඩසටහන (NCATP)
- ජාතික සිවිල් ගුවන්සේවා ආරක්ෂක පිරික්සුම් සහතික කිරීමේ වැඩසටහන (NCASSCP)

සිදු කරන ලද සහතික කිරීමේ ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් තොටුපලවල ගුවන්සේවා ආරක්ෂක සේවා සපයන්නා නැවත සහතික කිරීම

ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් තොටුපලවල ගුවන්සේවා ආරක්ෂක සේවා සැපයීම සහ නඩත්තු කිරීම සඳහා සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් (DGCA) විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් සහිත ගුවන්සේවා ආරක්ෂක සේවා සපයන්නෙකු පත් කිරීම නියාමන අවශ්‍යතාවයකි.

ගුවන්සේවා ආරක්ෂක පරීක්ෂක කාර්යාලය විසින් සිදු කරන ලද නැවත සහතික කිරීමේ විගණනය සාර්ථකව නිම කිරීමෙන් පසු, සිවිල් ගුවන්සේවා



ගුවන් යාත්‍රාංගන සහතික කිරීම්

2022 දී යාපනය සහ මඩකලපුව ගුවන් යාත්‍රාංගන සහතික අලුත් කිරීමට අංශ පරීක්ෂක කාර්යාලය දායක වූ අතර, ගුවන් යානා ක්‍රියාකරු විසින් AVSEC නියාමන අවශ්‍යතා සඳහා අනුකූල වීම සහතික කිරීම සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළේ මෙහෙයුම් නැවත ආරම්භ කිරීම මෙම වසරේ සිදු විය.

ගුවන් මෙහෙයුම්කරු සහතිකය

දේශීය ගුවන් යානා ක්‍රියාකරුවන් සඳහා නිර්දේශ 03 ක් සහ විදේශීය ගුවන් යානා ක්‍රියාකරුවන් සඳහා නිර්දේශ 09 ක්, ඔවුන්ගේ ගුවන් ක්‍රියාකරු සහතික/විදේශ ගුවන් මෙහෙයුම්කරු සහතික නිකුත් කිරීම/අලුත් කිරීම සඳහා ඔවුන්ගේ ගුවන් යානා ක්‍රියාකරු ආරක්ෂක වැඩසටහන් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඔවුන්ගේ මූලික සේවා ආරක්ෂක බලපත්‍රයේ දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූල වීම සතුටුදායක ලෙස පෙන්නුම් කිරීම මත ගුවන්සේවා ආරක්ෂක සේවා සපයන්නාගේ බලපත්‍රය අලුත් කිරීමට ගුවන් තොටුපළ සහ ගුවන් තොටුපල හා ගුවන්සේවා ශ්‍රී ලංකා (AASL) වෙත නිකුත් කරනු ලැබුවේය.

2022 දෙසැම්බර් 09 වන දින කටුනායක, CAASL මූලස්ථානයේ පැවති 78 වැනි ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා දින සැමරුම් උත්සවයේදී CAASL විසින් ශ්‍රී ලංකා ගුවන් තොටුපළ සහ ගුවන්සේවා (AASL) වෙත අලුත් කරන ලද ගුවන්සේවා ආරක්ෂක සේවා සපයන්නාගේ බලපත්‍රය ප්‍රදානය කරන ලදී.



මෙන්ම, ඔවුන්ගේ මෑත කාලීන මෙහෙයුම් වාර්තා සමාලෝචනය කිරීමෙන් පසුව සිදු කරන ලදී.

ගුවන් ආරක්ෂක පුද්ගල සහතිකය

ගුවන් තොටුපළේ ගුවන් ආරක්ෂක නිලධාරීන් සහ ගුවන් යානා ක්‍රියාකරුවන් සහතික කිරීම/නැවත සහතික කිරීම රටෙහි අර්බුදකාරී තත්ත්වය තුළ පවා යම් ප්‍රමාණයකට පියාසර නිරුපද්‍රතා නියාමන අංශය මඟින් 2022 වසර පුරා අඛණ්ඩව සිදු කරන ලදී.

වසර පුරාවට ගුවන්සේවා ආරක්ෂක කළමනාකරුවන් 19 දෙනෙකු, ගුවන් ආරක්ෂක උපදේශකවරුන් 19 දෙනෙකු සහ ගුවන්සේවා ආරක්ෂක පරීක්ෂකවරුන් 747 දෙනෙකු සහතික කර ඇත.

පියාසර නිරුපද්‍රතතා නියාමන අංශය

ගුවන් ආරක්ෂක පිරික්සුම් උපකරණ සහතිකය

ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ආරක්ෂක පිරික්සුම් උපකරණ 08 ක් සහතික කිරීම/නැවත සහතික කිරීම, 2022 වර්ෂය තුළ සහතික කිරීමේ ක්‍රියාවලියේදී සම්පූර්ණ කරන ලදී.

ගුවන් යානා ආරක්ෂක පරීක්ෂාව/සෝදිසි කිරීමට Fits Air වෙත අනුමැතිය ලබා දීම

ඔවුන්ගේ භාණ්ඩ තොග සඳහා ගුවන් යානා ආරක්ෂක පරීක්ෂාව/සෝදිසි කිරීමට Fits Air වෙත අනුමැතිය ලබා දීම.

රට තුළ ඇති වූ අර්බුදකාරී තත්ත්වය තුළ පවා, සියලුම නිලධාරීන්ගේ සහාය ඇතිව, රටේ ගුවන් ආරක්ෂක අධීක්ෂණ පද්ධතිය ලබා දී ඇති ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගෙන යාම සඳහා පියාසර නිරුපද්‍රතතා නියාමන අංශයේ පරීක්ෂකවරයා කැපවීමෙන් තම යුතුකම ඉටු කළේය.

AVSEC පරීක්ෂණ 49 ක්, AVSEC පරීක්ෂණ 03 ක් සහ විගණන 03 ක් ගුවන් ආරක්ෂක සේවා සපයන්නන් සම්බන්ධයෙන් පියාසර නිරුපද්‍රතතා නියාමන අංශයේ පරීක්ෂක විසින් සිදු කරන ලදී. MRIA හි සිදු කරන ලද ගුවන්සේවා ආරක්ෂක විගණනයක් ඇතුළුව 2022 දී අනුමත කරන ලද නිරීක්ෂණ සැලැස්මට අනුව මෙය සිදු කරන ලදී.

ඊට අමතරව, පියාසර නිරුපද්‍රතතා නියාමන අංශයේ පරීක්ෂකවරයා විසින් අවදානම් පදනම් කරගත් පරීක්ෂණ 02 ක්, කාලසටහන්ගත් නොවූ ගුවන් යානා මෙහෙයුම් පිළිබඳ පරීක්ෂණ 04 ක් සහ Fits Air හි මංගල මගී ගුවන් ගමන් මෙහෙයුම පිළිබඳ පුළුල් පරීක්ෂණයක්ද සිදු කර ඇත. තවද, ගුවන් යානා සඳහා භූමිය හැසිරවීමේ විධිවිධාන, පහසුකම්/සේවා සඳහා බලපත්‍ර නිකුත් කිරීම සඳහා AVSEC අංශය ආවරණය වන පරිදි ශ්‍රී ලංකන් ගුවන් සේවයේ මූලික සහතික කිරීමේ විගණනයෙහි ද පරීක්ෂක මණ්ඩලය නිරත විය.

ඒ හා සමානව, AVSEC අංශය අදාළ AVSEC නියාමන අවශ්‍යතා සඳහා අනුකූල නොවන ක්‍රියාකරුවන්ට එරෙහිව බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, එවැනි නොගැලපීම් සම්බන්ධයෙන් ක්‍රියාකරුවන් විසින් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ සත්‍යාපනය කිරීම සඳහා මෙම අංශය පසු විපරම් ක්‍රියාකාරකම් කිහිපයක් ද සිදු කරන ලදී. තවද, AVSEC අංශය 2022 වර්ෂය තුළ පහත සඳහන් කාර්යයන්හිද නිරත විය.

විශ්ව සුරක්ෂිතතා විගණන වැඩසටහන - ශ්‍රී ලංකාවේ අබණ්ඩ අධීක්ෂණ ප්‍රවේශය (USAP-CMA) විගණනය

2022 ICAO-CMA විගණන කාලසටහනට අනුකූලව, ICAO ඇමුණුම 17 ප්‍රමිතීන් සහ ඇමුණුම 9 හි ආරක්ෂාව සම්බන්ධ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකාව අනුකූල වීමේ මට්ටම තීරණය කිරීම සඳහා 2022 මැයි 18 සිට 27 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාව විගණනය කිරීමට සැලසුම් කරන ලදී. එබැවින් 2021 වර්ෂයේ අවසාන කාර්තුව තුළදී, ICAO වෙත රාජ්‍ය වගකීම් ක්‍රියාකාරී සැලැස්මක් සමඟින් ඉටුකරමින් මෙම අංශය විගණනයට මුහුණ දීමට සූදානම්ව සිටි නමුත්, සැලසුම් කළ විගණන කාලසීමාව තුළ රට තුළ පැවති නොවැළැක්විය හැකි තත්ත්වයන් හේතුවෙන් එය කල් දමන ලදී. 2023 ICAO-CMA විගණන කාලසටහනට අනුව, ශ්‍රී ලංකාව 2023 වසරේ පළමු භාගය තුළ විගණනය කරනු ලැබේ.

ජාතික සිවිල් ගුවන්සේවා සුරක්ෂිතතා කමිටුව (NCASC)

NCASC රැස්වීම් සෑම දින දර්ශන වර්ෂයකම අවම වශයෙන් දෙවරක්වත් පැවැත්විය යුතු බැවින්, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් NCASC රැස්වීම් දෙකක් (02) 2022 දී සාර්ථකව කැඳවන ලදී. ජාතික සිවිල් ගුවන්සේවා ආරක්ෂණ වැඩසටහනේ විවිධ අංශ ක්‍රියාත්මක කිරීමට අදාළ හෝ වගකිව යුතු රජයේ දෙපාර්තමේන්තු, ආයතන සහ රාජ්‍ය ආයතන, ගුවන් තොටුපල සහ ගුවන් යානා ක්‍රියාකරුවන්, ගුවන් ගමනාගමන සේවා සපයන්නන් සහ අනෙකුත් ආයතන අතර ආරක්ෂක කටයුතු සම්බන්ධීකරණය කිරීමේ අරමුණින් මෙය සිදු කෙරේ.

සිවිල් ගුවන්සේවා තර්ජන තක්සේරු කමිටුව

2022 වර්ෂය තුළ රට තුළ ඇති වූ තත්වය මධ්‍යයේ වුවද කමිටු රැස්වීම් සාර්ථකව කැඳවන ලදී. මෙම කමිටුවේ පරමාර්ථය වන්නේ සිවිල් ගුවන් සේවයට ඇති තර්ජනය අඛණ්ඩව තක්සේරු කර ජාතික බුද්ධි අංශයේ ප්‍රධානියා (CNI) වෙත වාර්තා කිරීම වන අතර ඒ අනුව තර්ජන මට්ටමට සරිලන පරිදි සුදුසු ගුවන් ආරක්ෂණ පාලන ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා පවතින තර්ජන මට්ටම පිළිබඳව DGCA වෙත උපදෙස් දෙනු ලැබේ.

කමිටු තක්සේරුවලට ප්‍රායෝගික ගුවන් තොටුපළ යටිතල පහසුකම් අවස්ථාවන් ඇතුළත් කිරීම සඳහා, තර්ජන තක්සේරුවේ ප්‍රතිඵල අවසන් කිරීමට පෙර, කමිටුව 2022 දෙසැම්බර් 15 - 16 දිනවල මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි (MRIA) සංචාරයක් කළේය. ICAO RCS (අවදානම් සන්දර්භය ප්‍රකාශය) මත පදනම්ව සමාලෝචනය කරන ලද තර්ජන තොරතුරුවල ප්‍රතිඵල සමඟින්, ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා මෙහෙයුම් සඳහා ඇති තර්ජනයන් පිළිබඳව 2022 දෙසැම්බර් මාසයේදී කෂෂ වෙත දැනුම් දෙන ලදී.

ගුවන් යානා තුලට ආයුධ රැගෙන යාම සඳහා අනුමැතිය ලබා දීම

ශ්‍රී ලංකාවේ ගුවන් සීමාව තුළ සහ ශ්‍රී ලංකාව තුළ ගුවන් තොටුපළ වෙත / සිට යුදෝපකරණ රැගෙන යාම සඳහා අනුමැතිය DGCA වෙත පැවරී ඇති අතර එම ඉල්ලීම් රාජ්‍ය සහ පෞද්ගලික සංවිධාන මෙන්ම පුද්ගලයන් විසින් කරනු ලැබේ. මෙම සන්දර්භය තුළ, 2022 වර්ෂය තුළ යුදෝපකරණ ගුවන්යානා තුලට රැගෙන යාම සඳහා අනුමැතීන් 36 ක් ලබා දී ඇත.

අධිකරණ සහ පරිපාලන පාලිත මගීන්ගේ ගුවන් ප්‍රවාහනය

2022 වර්ෂය තුළ අධිකරණ සහ පරිපාලනමය පාලිත මගීන් ශ්‍රී ලංකාව අභ්‍යන්තරයේ මෙන්ම පිටතට ගුවන් මගින් ප්‍රවාහනය සඳහා නිර්දේශ 134ක් ලබා දෙන ලදී.

ගුවන් සමාගම්වල කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා ගුවන් තොටුපල ප්‍රවේශ බලපත්‍ර නිකුත් කිරීම සඳහා වන නිර්දේශයන්

ගුවන්සේවා සේවකයින්ට ගුවන් තොටුපළවල රාජකාරී ඉටු කිරීම සඳහා ගුවන් තොටුපළ ප්‍රවේශ බලපත්‍ර නිකුත් කිරීම සඳහා නිර්දේශ 297 ක් ලබා දී ඇති අතර, ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපළවල AVSEC සහ AVSEC නොවන නිරීක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා විදේශීය ගුවන් සමාගම් සඳහා නිර්දේශ 12 සහ 05 ක් ලබා දී ඇත.

CAASL කාර්ය මණ්ඩලය සඳහා ගුවන් තොටුපළ ප්‍රවේශ බලපත්‍ර සකස් කිරීම

CAASL කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ගුවන් තොටුපළ ප්‍රවේශ බලපත්‍ර නිකුත් කිරීම සඳහා නිර්දේශ ලබා දීම සඳහා මෙම අංශය අඛණ්ඩව පරිපාලනය කරන ලදී. දින අවසරපත් පනස් දෙකක් (52) සහ ස්ථිර/තාවකාලික ප්‍රවේශ බලපත්‍ර සඳහා නිර්දේශයන්ද නිකුත් කරන ලදී.

ගුවන්සේවා කර්මාන්තයේ පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා දායකත්වය ලබා දීම

AASL AVSEC තත්ත්ව පාලකවරුන්ගේ සහතික කිරීමේ අවශ්‍යතා සපුරාලීම සඳහා අංශයේ පරීක්ෂක විසින් එක් (01) පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

කටුනායක CAASL ප්‍රධාන කාර්යාලයේ ඒකාබද්ධ ආරක්ෂක පද්ධතිය කළමනාකරණය කිරීම

CAASL ප්‍රධාන කාර්යාල පරිශ්‍රය තුළ භෞතික ආරක්ෂණ සේවා, ඉලෙක්ට්‍රොනික ප්‍රවේශ පාලන පද්ධතිය සහ සංවෘත-පරිපථ රූපවාහිනී (CCTV) පද්ධතිය, එහි කාර්ය මණ්ඩලය, ගනුදෙනුකරුවන් සඳහා ආරක්ෂිත පරිසරයක් ස්ථාපිත කිරීම සඳහා සහ එහි දේපළ ආරක්ෂා කිරීම සඳහා මෙම අංශය අඛණ්ඩව පරිපාලනය කරන ලදී.



ආයතනික කළමනාකරණ ශාඛාව



ආයතනික කළමනාකරණ ශාඛාව

ගුවන් ප්‍රවාහන සහ ආර්ථික නියාමන අංශය

ජාත්‍යන්තර ගුවන් සමාගම් විසින් සිදු කරන ලද මෙහෙයුම්

ගෝලීය COVID-19 වසංගතය හේතුවෙන් ගුවන්සේවා කර්මාන්තය වඩාත් බලපෑමට ලක් වූ කර්මාන්ත වලින් එකක් වන අතර, 2020 සහ 2021 වර්ෂවල ගුවන්සේවා දර්ශක තියුනු පහත වැටීමකට ලක් වූ අතර, එය 2022 අවසන් වන විටද යම් ප්‍රමාණයකට දැකගත හැකි විය. 2019 දී කොවිඩ් වසංගතයට පෙර සිටම රටවල් වසා දැමීම සහ විවිධ ආකාරයේ සීමාවන් පැනවීම හේතුවෙන් ලොව පුරා ගුවන්සේවා සාමාන්‍ය වශයෙන් ක්‍රියාකාරිත්වය අවම වූ අතර, මෙම තත්ත්වය ලංකාවටද ඒ ආකාරයෙන්ම බලපෑවේය. චීනය සම්පූර්ණයෙන් වසා දැමීම හේතුවෙන් ආසියානු කලාපයේ මගී ගුවන් ගමන් ඉතා පහළ මට්ටමකට වැටුණු අතර, කොවිඩ් තත්වය තුළ, චීනයේ ඉහළ ක්‍රියාකරණ ධාරිතාව හේතුවෙන් ආසියානු කලාපය ලොව විශාලතම මගී ප්‍රවාහන කලාපය ලෙස පෙරමුණ ගත්තේය. කෙසේ වෙතත්, 2022 අවසානයේ සිය දේශසීමා විවෘත කිරීමට චීනය තීරණය කිරීමත් සමඟ, මෙම ක්‍රියාකාරිත්වය 2023 දී වැඩි වනු ඇතැයි අපේක්ෂා කළ හැකිය.

ශ්‍රී ලංකාවේ තත්ත්වය සලකා බැලීමේදී වසංගත තත්වයට අමතරව රට මුහුණ දී තිබූ ආර්ථික හා දේශපාලන අස්ථාවරත්වය ද 2022 වසරේ ගුවන් ගමන් අඩුවීමට හේතු වී ඇති බව කිව හැක. විදේශ විනිමය සම්බන්ධ ගැටලු නිසා ගුවන් සමාගම්වල ආදායම් මූලස්ථානයට යැවීම ප්‍රමාද වුන අතර, වසරේ මැද භාගයේ ඇති වූ දේශපාලන අස්ථාවරත්වය සහ කැළඹිලි සහිත තත්ත්වයන් ගුවන් මෙහෙයුම්වල කාර්ය සාධනයට ද බලපෑවේය. එමෙන්ම වසරේ කෙටි කාලයක් තුළ අත්විඳින ලද ගුවන් යානා ඉන්ධන හිඟය නිසා ගුවන් සමාගම්වලට ඉන්ධන ටැංකි සපයාගැනීමට සිදු වූයේ ඔවුන්ගේම ස්ථානවලින් වන අතර, පූර්ව වසංගත තත්ත්වය හා සසඳන විට 2022 දී සමස්ත මෙහෙයුම් පරිමාව 50% කින් පමණ අඩු විය.

මගී මෙහෙයුම්

2022 වන විට විදේශීය ගුවන් සේවාවන් 24ක් ශ්‍රී ලංකාව තුලට අබණ්ඩව මෙහෙයුම් සිදු කර ඇත. මීට අමතරව, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සහ Fits Aviation ගුවන් සමාගම් ද ජාත්‍යන්තර මෙහෙයුම් සඳහා දායක වී ඇත. මැද පෙරදිග පදනම් කරගත් ගුවන් සේවාවන්, විශේෂයෙන් එමිරේට්ස්, කටාර්, එටිහාඩ්, ඕමාන් එයාර්, එයාර් ඇරබියා සහ ගල්ෆ් එයාර් යන ගුවන් සේවාවන් වසර පුරා ක්‍රියාත්මක විය. ෆ්ලයි ඩුබායි ගුවන් සේවය තම මෙහෙයුම් කඩින් කඩ නතර කළ නමුත් වසර අවසානයේ මාලදිවයින හරහා නැවත මෙහෙයුම් ආරම්භ කළේය. ඕමානයේ සිට ක්‍රියාත්මක වන සලාම් එයාර් ද යළි මෙහෙයුම් ආරම්භ කළේය. කුවේට් සිට ක්‍රියාත්මක වන කුවේට් එයාර්වේස් මෙම වසරේද ක්‍රියාත්මක නොවූ අතර කුවේට් සිට ක්‍රියාත්මක වන ජසීරා එයාර්ලයින්ස් කුවේට් සහ කොළඹ අතර සබඳතාව විදේශීය ගුවන් සමාගමක් ලෙස පවත්වාගෙන ගියේය. සවුදියා සහ සවුදි අරේබියන් ගුවන් සේවාවන්ද 2022 වසර තුළ කොළඹට ක්‍රියාත්මක නොවීය.

කසකස්තානයේ සිට ක්‍රියාත්මක වන එයාර් ඇස්ටානා 2022 වසරේ පළමු කාර්තුවේදී මෙහෙයුම් ආරම්භ කළ අතර 2022 අග භාගයේදී නැවත මෙහෙයුම් ආරම්භ කිරීමට නියමිතව වූ තිබූ නමුත් මෙහෙයුම් ආරම්භ කලේ නැත. නැගෙනහිර යුරෝපය ශ්‍රී ලංකාවට සම්බන්ධ කරමින් එරෝෆ්ලොට් ගුවන් සේවය මැයි මස අවසානය දක්වා ක්‍රියාත්මක වූ නමුත් ගුවන් සමාගමේ ගුවන් යානා ද්විත්ව ලියාපදිංචිය සහ බදු දීම සම්බන්ධ නීතිමය ගැටළු හේතුවෙන් එම ගුවන් සමාගම විසින් මෙහෙයුම් නවතා දමන ලදී. කෙසේ වෙතත්, මෙම අධිකාරිය සහ රුසියානු බලධාරීන් අතර පැවති සාකච්ඡා හේතුවෙන් ඔක්තෝම්බර් මාසයේ සිට එරෝෆ්ලොට් ගුවන්සේවය නැවත මෙරට මෙහෙයුම් ආරම්භ කරන ලදී.

Edelweiss සහ Air France යුරෝපයේ සිට නැවත මෙහෙයුම් ආරම්භ කළ අතර මෙය 2022 දී ශ්‍රී ලංකාවේ ගුවන්සේවා කර්මාන්තයේ ප්‍රවර්ධනයට ධනාත්මක බවක් එක් කල අතර, තුර්කි ගුවන් සේවය ද වසර පුරා සිය මෙහෙයුම් දිගටම කරගෙන ගිය නමුත් මෙහෙයුම් හේතූන් මත අගෝස්තු මාසයේදී ගුවන් ගමන් කිහිපයක් පමණක් අවලංගු කරන ලදී. වෝර්සෝ සහ කොළඹ අතර සංචාරකයින්ට සම්බන්ධතා සලසමින් පෙර වසරවල ක්‍රියාත්මක වූ LOT Polish Airlines සමාලෝචිත වර්ෂය තුළ මෙහෙයුම් ආරම්භ කළේ නැත.

2020 ට පෙර දිනපතා ක්‍රියාත්මක වූ සිංගප්පූරු ගුවන් සේවය මගී ඉල්ලුම අඩුවීම හේතුවෙන් සිය මෙහෙයුම් සතියකට දින 4 දක්වා අඩු කළේය. සිංගප්පූරුවේ සිට ක්‍රියාත්මක වූ සිල්ක් එයාර් මේ වසරේද ක්‍රියාත්මක වුයේ නැත. Cathay Pacific ගුවන් සේවය 2022 දී මගී මෙහෙයුම් ක්‍රියාත්මක නොකළේ පැවති කොවිඩ් තත්වය මත චීනය වසා දැමීම හේතුවෙන් මගී ඉල්ලුමේ හිඟකම හේතුවෙනි. මැලේසියානු ගුවන් සේවය ද අඩු ධාරිතාවයකින් ක්‍රියාත්මක විය. තායි ගුවන් සේවය මගී මෙහෙයුම් ක්‍රියාත්මක නොකළ නමුත් එහි අනුබද්ධිත සමාගමක් වන තායි ස්මයිල්ස් ගුවන් සේවය තාවකාලිකව අවසන් කිරීමට පෙර වසර තුළ මාස කිහිපයක් ගුවන් ගමන් ක්‍රියාත්මක කළේය. China Eastern ගුවන් සේවය වසර මැද සිට අඩු සංඛ්‍යාතයකින් ශ්‍රී ලංකාවට සිය මෙහෙයුම් දිගටම කරගෙන ගියේය. චීනයේ සිට ක්‍රියාත්මක වූ China Southern සහ Chongqing ගුවන් සේවයන්, ඔවුන්ගේ රට තුළ COVID-19 සම්බන්ධ සීමා කිරීම් හේතුවෙන් වසර පුරා ක්‍රියාත්මක නොවීය. මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ මගී මෙහෙයුම් අඩුවීමට දැඩි ලෙස බලපෑවේය. නැගෙනහිර ආසියාතික රටවලින් ක්‍රියාත්මක වූ AirAsia X, Malindo, Korean Air, Thai Lion, Thai Airways iy Sri Wijaya වැනි ගුවන්

සමාගම් 2022 දී ක්‍රියාත්මක වූයේ නැත. AirAsia මැලේසියාවේ සිට ක්‍රියාත්මක විය.

ශ්‍රී ලංකාවේ මගී ගමනාගමනයෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් ඉන්දියාව පදනම් කරගත් අතර 2020 ට පෙර ඉන්දියාවෙන් ගුවන්සේවා කිහිපයක් ක්‍රියාත්මක වූ නමුත් 2022 දී ක්‍රියාත්මක වූයේ එයාර් ඉන්දියා සහ ඉන්ඩිගෝ ගුවන් සේවයන් පමණි. එම මෙහෙයුම් ද සංඛ්‍යාවෙන් අඩු විය. මේ වසරේ දෙසැම්බර් මාසයේදී සිදුවූ වැදගත්ම සිදුවීමක් වන්නේ ඉන්දීය ගුවන් සමාගමක් වන Alliance Air විසින් යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළ වෙත ගුවන්සේවා නැවත ආරම්භ කිරීමයි. කලාපීය ගුවන්සේවා ජාලය පුළුල් කිරීමට මෙය හොඳ ආරම්භයක් බව පැහැදිලිය. 2022 වර්ෂයේදී ගුවන්සේවා 24ක් පමණ ක්‍රියාත්මක වූ අතර ශ්‍රී ලංකන් ගුවන් සේවය සහ Fits Air සමඟ එම විදේශ ගුවන්සේවා 2019 වසරට සාපේක්ෂව මුළු මගී මෙහෙයුම් සංඛ්‍යාවෙන් 50%ක අඩුවීමක් පෙන්නුම් කළේය. 2022 වසරේ සිදු වූ තවත් විශේෂ සිදුවීමක් ලෙස ඔක්තෝම්බර් මාසයේ සිට Fits Air මගින් ජාත්‍යන්තර මගී ගුවන් ගමන් ආරම්භ කිරීම සැලකිය හැකිය. ඔවුන් සතියකට තුන් වතාවක් ඩුබායි සහ මාලේ වෙත ගුවන් ගමන් ආරම්භ කළහ. පෞද්ගලික සමාගමක් ශ්‍රී ලංකාවෙන් ජාත්‍යන්තර මගී මෙහෙයුම් ආරම්භ කළ පළමු අවස්ථාව එය විය. වසර ගණනාවක් තිස්සේ Fits Air විවිධ ගමනාන්ත වෙත ජාත්‍යන්තර මෙහෙයුම් මෙන්ම දේශීය මගී මෙහෙයුම් ද සිදු කර ඇත. මෙම ගුවන් සේවය පෙර Expo Air නමින් හැඳින්වුනි.

ගුවන් භාණ්ඩ මෙහෙයුම්

COVID-19 කාලපරිච්ඡේදය තුළ ගෝලීය මෙහෙයුම් සලකා බැලීමේදී, ගුවන් භාණ්ඩ ප්‍රවාහනයේ කැපී පෙනෙන වර්ධනයක් ගෝලීය වශයෙන් ඇති වූ අතර, එම කාලය තුළ ශ්‍රී ලංකාවේ ගුවන් භාණ්ඩ ප්‍රවාහනය ද ඉතා ඉහළ මට්ටමකට ළඟා විය. 2022 දී භාණ්ඩ ප්‍රවාහන ගුවන්සේවා කිහිපයක් ක්‍රියාත්මක වූ අතර එය ආර්ථිකයට විශාල දායකත්වයක් ලබා දීමට සමත් විය. තුර්කි ගුවන් සේවය, කටාර් එයාර්වේස්, එමිරේට්ස්, තායි එයාර්වේස්, එටිහාඩ්, මයි ඉන්ඩෝ සහ කැතේ පැසිෆික් යන ගුවන් සේවාවන් නියමිත භාණ්ඩ ප්‍රවාහන මෙහෙයුම් සඳහා සම්බන්ධ විය. ගුවන් භාණ්ඩ ප්‍රවාහනය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව විවෘත අහස් ප්‍රතිපත්තියක් පවත්වාගෙන යන අතර මේ නිසා විවිධ ගමනාන්ත හරහා ශ්‍රී ලංකාවට පැමිණීමට ඉහත ගුවන් සමාගම්වලට හැකි විය. ඒ අනුව පාකිස්තානය, ඉන්දියාව, මාලදිවයින සහ තවත් බොහෝ ගමනාන්ත හරහා මෙහෙයුම් සිදු කරන ලද අතර, මෙම පුළුල් වූ ජාලය ජාත්‍යන්තර ප්‍රවාහන ජාලයට ශ්‍රී ලංකාවද ඇතුලත් කළේය. කටාර් ගුවන් සේවය මාලදිවයින සහ කොළඹ අතර ක්‍රියාත්මක වූයේ භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා මගී ගුවන් යානයක් භාවිතා කරමිනි. මීට අමතරව, Astral Air, Ethiopian Air, Maximus Air, Sichuan Air වැනි ගුවන් සමාගම් සහ තවත් කිහිපයක් තාවකාලික භාණ්ඩ ප්‍රවාහන මෙහෙයුම් ක්‍රියාත්මක කළහ.

වරලත් ගුවන් ගමන් මෙහෙයුම්

ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වාර්ෂිකව ඩොලර් බිලියන පහක දායකත්වයක් සපයන සංචාරක කර්මාන්තයට ගුවන්සේවා මෙහෙයුම් සෘජුවම සම්බන්ධ වේ. සංචාරකයින් බහුතරයක් පැමිණෙන්නේ වරලත් ගුවන් ගමන් මගිනි. 2022 වසරේ ගුවන් සමාගම් කිහිපයක් විසින් ක්‍රියාත්මක කරන ලද වරලත් ගුවන් ගමන් සැලකිය යුතු ප්‍රමාණයක් දක්නට ලැබුණි. රුසියාවේ සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ වෙත සංචාරකයින් රැගෙන ඒම සඳහා Azur Air ගුවන් සේවය කුලී පදනම මත ක්‍රියාත්මක විය. මීට අමතරව, 2022 අවසානයේ තවත් රුසියානු ගුවන් සමාගමක් වන Redwings මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ වෙත මෙහෙයුම් ආරම්භ කළේය. නියමිත වරලත් ගුවන් ගමන් මෙහෙයුම් වලට අමතරව මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ හරහා ශ්‍රී ලංකාවට සංචාරක පැමිණීම් විශාල ප්‍රමාණයක් ලබා දෙමින් තාවකාලික වරලත් ගුවන් ගමන් මෙහෙයුම් විශාල ප්‍රමාණයක්ද ක්‍රියාත්මක විය.

නව ක්‍රියාකරුවන් සහ අත්හිටුවීම්

මෙම වසර තුළ ශ්‍රී ලංකාව තුලට නව ගුවන්සේවා මෙහෙයුම් ආරම්භ කිරීමට ඇති උනන්දුව අඩු බව පෙන්වී යන නමුත්, වසරේ මැද භාගයේදී තායි ස්මයිල්ස් ගුවන් සමාගම තායිලන්තයෙන් නව ගුවන් ගමන් ආරම්භ කළ අතර එය තායිලන්තය සහ ශ්‍රී ලංකාව අතර මගී ගමනාගමනයට විශාල රුකුලක් විය. කෙසේ වෙතත්, මෙම ගුවන් සමාගම වසර තුළ ශ්‍රී ලංකාව වෙත සිය මෙහෙයුම් නතර කළේය. My Indo ගුවන් සේවය ද ඉන්දුනීසියාවේ සිට නව භාණ්ඩ ගුවන් ගමන් දියත් කළේය. රුසියාවේ සිට Red Wings ගුවන් සේවය මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ වෙත වරලත් ගුවන් ගමන් ආරම්භ කළේය. එය සංචාරක කර්මාන්තයට බෙහෙවින් ඉවහල් විය. Alliance Air මේ වසරේ යාපනය ගුවන් තොටුපළ වෙත නියමිත ගුවන් ගමන් නැවත ආරම්භ කළේය. පැවති වසංගත තත්ත්වය සහ රටේ අනෙකුත් ආර්ථික හා දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් බොහෝ විදේශීය ගුවන් සමාගම් ශ්‍රී ලංකාව වෙත සිය මෙහෙයුම් නවතා දැමීය. ගෝලීය වශයෙන් ද ගුවන් සමාගම් තවමත් පශ්චාත් කොවිඩ් ප්‍රතිසාධන මාදිලියේ සිටී.

අභ්‍යන්තර මෙහෙයුම්

ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ගුවන් තොටුපලවල ගුවන් මෙහෙයුම් 2020 ට පෙර සිදු කරන ලදී. මෙයට මුහුදු ගුවන් යානා මෙහෙයුම් සහ හෙලිකොප්ටර් මෙහෙයුම් ඇතුළත් විය. 2022 වසරේ මුල් භාගයේදී, දේශීය වශයෙන් බොහෝ කාලසටහන්ගත ගුවන් ගමන් නොතිබුණත්, වසර අවසානය වන විට, Fits Air සහ Cinnamon Air විසින් මෙහෙයවනු ලබන කාලසටහන්ගත ගුවන් ගමන් තිබුණි.

නියමිත මෙහෙයුම් වලට අමතරව Fixed-wing මෙහෙයුම් සහ හෙලිකොප්ටර් මෙහෙයුම් යන දෙකම වසර පුරා වරලත් පදනමක් මත සිදු කරන ලදී.

කාල සීමා සම්බන්ධීකරණය

ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමයේ (IATA) කාල සීමා සම්බන්ධීකරණය මාර්ගෝපදේශයන් (Worldwide Slot Guidelines) වලට අනුව ශ්‍රී ලංකාවේ ගුවන් තොටුපළවල කාල සීමා සම්බන්ධීකරණය කෙරේ. දැනට කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ මෙහෙයුම් ධාරිතාව මත 3 වැනි මට්ටමේ ගුවන් තොටුපළක් ලෙස පිළිගෙන ඇති අතර ඒ සඳහා ස්ලොට් සම්බන්ධීකාරකවරයකු පත් කර ඇත. ශ්‍රී ලංකාවේ කාල සීමා සම්බන්ධීකරණ කළමනාකරණයේ වගකීම සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත පැවරී ඇති අතර දැනට කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ස්ලොට් සම්බන්ධීකරණය සඳහා ශ්‍රී ලංකන් ගුවන් සේවයේ කාලසටහන් සැලසුම් අංශය පත් කර ඇත. ස්ලොට් කමිටුව විසින් මෙහෙයවනු ලබන සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අධීක්ෂණය යටතේ ඔවුන් කටයුතු කරයි.

මත්තල සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළවල් 1 වන මට්ටම වන අතර ඒවා සම්බන්ධීකරණය අවශ්‍ය නොවේ. කෙසේ වෙතත්, ගුවන් තොටුපළ සහ ගුවන්සේවා ශ්‍රී ලංකා (AASL) විසින් මත්තල ගුවන් තොටුපළ සඳහා ස්ලොට් සම්බන්ධීකාරකවරයෙකු පත් කර ඇත. යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ස්ලොට් සම්බන්ධීකරණය මෙම අංශය විසින්ම සිදු කරයි.

2022 හිමිහාන සහ ශීත සෘතු 22/23 වාරයන් සඳහා මෙම වසර සඳහා ස්ලොට් කමිටු රැස්වීම් දෙකක් පවත්වන ලදී. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ කාල සීමා සම්බන්ධීකරණ පමණක් සලකා බලන ලදී. 2022 හිමිහානය සඳහා කාල සීමා සම්බන්ධීකරණය කිරීමේදී ස්ලොට් අනුමැතිය ලබා දීමට පෙර ගුවන් තොටුපලේ දැනට පවතින නවීකරණ කටයුතු සහ ඉන්ධන සැපයුම් හයිඩ්‍රන්ට් වල වර්ධනයන්ල සලකා බලන ලදී.

ආයතනික කළමනාකරණ ශාඛාව

2022/23 ශීත සෘතුව සඳහා ඉදිකිරීම් කටයුතු හේතුවෙන් යම් යම් බාධා ඇති වූ අතර ගුවන් තොටුපළේ සමහර ප්‍රදේශ ක්‍රියාත්මක නොවීම හේතුවෙන් ප්‍රමාදයන් ඇති විය. ඒ අනුව, 2022/23 ශීත සෘතුව සඳහා කාල සීමා සම්බන්ධීකරණයෙහි සුළු අඩුවීමක් සිදු වූ නමුත්, ගුවන් සමාගම්වල මෙහෙයුම් 2020 ට පෙර පැවති තත්ත්වයට පැමිණ නොතිබීම නිසා එය එතරම් බාධාවක් නොවීය.

චෙක්-ඉන් කවුන්ටර අවශ්‍ය නිසා සහ ගුවන් තොටුපළේ ධාරිතාව අඩුවීම කාල සීමා සම්බන්ධීකරණයට බාධාවක් වී ඇති අතර ගුවන් තොටුපළ නවීකරණයත් සමඟ මෙම තත්ත්වයට විසඳුම් ලැබෙනු ඇත.

ගුවන් සමාගම් බලපත්‍ර සහ විදේශ ගුවන් සමාගම් බලපත්‍ර

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සියලුම ගුවන් සමාගම්වලට ඔවුන්ගේ මෙහෙයුම්වල තාක්ෂණික නිපුණතාවය සනාථ කරන ගුවන් මෙහෙයුම් සහතිකය (Air Operator Certificate) තිබිය යුතුය. ඒ හා සමානව, ගුවන් සමාගම්වලට ඔවුන්ගේ වාණිජ කටයුතු සිදු කිරීමට අවශ්‍ය අවසර ලබා ගැනීමට බලපත්‍රයක් අවශ්‍ය වේ. නියමිත මගී සේවා සඳහා ගුවන් බලපත්‍රයක් නිකුත් කරනු ලබන අතර වරලත් මෙහෙයුම් සඳහා වරලත් බලපත්‍රයක් නිකුත් කෙරේ. පුද්ගලික අරමුණු සඳහා භාවිතා කරන ගුවන් යානා පුද්ගලික ගුවන් ගමන් බලපත්‍රයක් සමඟ නිකුත් කෙරේ.

වසර තුළදී ශ්‍රී ලංකන් ගුවන් සේවය, Saffron Air (Cinnamon Air),සහ ෆිට්ස් Air යන සමාගම්වල ගුවන් බලපත්‍ර අලුත් කරන ලදී. නව ගුවන් බලපත්‍ර නිකුත් කර නැත. අලුත් කරන ලද වරලත් ගුවන් සේවාවන් වූයේ ශ්‍රී ලංකන් ගුවන් සේවය, Fits Air, Saffron Air (Cinnamon Air), IWS Aviation සහ Lakwin Aviation ය.

2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතට අනුව සියලුම විදේශීය ගුවන් සමාගම් තම තාක්ෂණික නිපුණතාවය සනාථ කිරීම සඳහා විදේශ ගුවන්සේවා සහතිකය (FAOC) සහ ඔවුන්ගේ වාණිජ නිපුණතාවය සනාථ කිරීම සඳහා විදේශ ගුවන්සේවා බලපත්‍රය (FAL) ලබා ගත යුතුය. සමාලෝචිත වර්ෂය තුළ සියලුම FAOC දරන්නන් සඳහා FAL නිකුත් කිරීමට මෙම අංශය කටයුතු කළේය.

සංචාරක නියෝජිතයන්ගේ බලපත්‍ර

ගුවන් ප්‍රවාහන සපයන්නන්ගේ (මගී) බලපත්‍රය (සංචාරක නියෝජිත බලපත්‍රය) නියාමනය කිරීම, 1992 අංක 55 දරන ගුවන් සන්තරණ පනතේ විධිවිධාන සහ 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනත මගින් මගීන්, භාණ්ඩ ප්‍රවාහනය සහ තැපැල් මගින් ගුවන් මගින් ප්‍රවාහනය කිරීමට අවසර ලැබේ. ශ්‍රී ලංකාව තුළ එවැනි ව්‍යාපාර පවත්වාගෙන යාමට ගුවන් ප්‍රවාහන සැපයුම්කරුවන්ගේ (මගී) බලපත්‍රය අනිවාර්ය අවශ්‍යතාවයකි. නියෝජිතායතනයේ ප්‍රකාශිත ප්‍රාග්ධනය/ප්‍රාග්ධන දායකත්වය මත පදනම්ව A කාණ්ඩය සහ B කාණ්ඩය ලෙස බලපත්‍ර කාණ්ඩ දෙකක් ඇති අතර බලපත්‍රය වාර්ෂිකව අලුත් කළ හැකිය.

සමාලෝචිත වර්ෂය තුළ A කාණ්ඩයේ නියෝජිතයින් 37 ක් සහ B කාණ්ඩයේ නියෝජිතයින් 02 ක් සඳහා නව බලපත්‍ර 39 ක් නිකුත් කරන ලදී. A කාණ්ඩයේ බලපත්‍ර 383ක් සමඟ බලපත්‍ර 403ක් අලුත් කරන ලදී. නියෝජිතයින් සැලකිය යුතු ප්‍රමාණයක් තම බලපත්‍ර අලුත් කර නොමැති අතර විවිධ හේතූන් මත සිය මෙහෙයුම් නවතා ඇත. B කාණ්ඩයේ නියෝජිතයින් සැලකිය යුතු ප්‍රමාණයක් ඔවුන්ගේ බලපත්‍රය A කාණ්ඩයට උසස් කර ඇත. මාර්ගගත රැස්වීම් හරහා ගුවන් ප්‍රවාහන සපයන්නන් සඳහා 2022 හි ඇගයීම් 46ක් පවත්වන ලදී.

වගුව 01: ගුවන් ප්‍රවාහන සැපයුම්කරුවන්ගේ (මගී) බලපත්‍රය 2021 සහ 2022 නිකුත් කිරීම

ගුවන් ප්‍රවාහන සැපයුම්කරුවන්ගේ බලපත්‍රය								
මාසය	මුල් නිකුතුව				අලුත් කිරීම			
	A කණ්ඩායම		B කණ්ඩායම		A කණ්ඩායම		A කණ්ඩායම	
	2021	2022	2021	2022	2021	2022	2021	2022
ජනවාරි	3	5	-	1	24	45	-	5
පෙබරවාරි	2	-	-	-	38	41	1	1
මාර්තු	2	2	-	1	46	48	-	1
අප්‍රේල්	3	2	-	-	27	22	1	1
මැයි	-	1	-	-	-	12	-	-
ජූනි	-	-	-	-	-	10	-	1
ජූලි	5	-	-	-	14	-	3	-
අගෝස්තු	-	3	-	-	5	46	-	3
සැප්තැම්බර්	-	9	-	-	24	30	1	-
ඔක්තෝම්බර්	2	2	-	-	41	38	1	1
නොවැම්බර්	5	6	-	-	17	44	-	1
දෙසැම්බර්	3	7	1	-	37	47	3	6
මුළු එකතුව	25	37	1	2	273	383	10	20



රූපය 01: ගුවන් ප්‍රවාහන සැපයුම්කරුවන්ගේ (මගී) බලපත්‍රය 2021 සහ 2022 මූලික නිකුත් කිරීම



රූපය 02: ගුවන් ප්‍රවාහන සැපයුම්කරුවන්ගේ (මඟී) බලපත්‍රය 2021 සහ 2022 අලුත් කිරීම

විගමිකයන් සහ රැකියා කරනු ලබන/ඉගෙනුම් ලබන ශ්‍රී ලාංකික සිසුන් වෙත වීසා නිර්දේශයන්

ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ ප්‍රකාරව සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබා දෙන ලද උපදෙස් අනුව, ශ්‍රී ලංකාව සඳහා රැකියා අවසරපත/පදිංචිවීමේ වීසා ලබා ගැනීම සඳහා දේශීය ගුවන් සමාගමක සේවය කරනු ලබන සියලුම විගමිකයන්, සිවිල් ගුවන් සේවයෙන් අනුමැතිය ලබා ගත යුතුය.

ගුවන් පුහුණුව සඳහා ශ්‍රී ලංකාවට ඇතුළු වන සියලුම සිසුන්ට, ප්‍රවේශ වීසා, පදිංචි වීසා සහ පදිංචි වීසා බලපත්‍රය අලුත් කිරීම සඳහා CAASL වෙතින් වීසා නිර්දේශ ලිපි ලබා ගත යුතුය. රේඛීය අමාත්‍යාංශය හරහා ගුවන්සේවා කර්මාන්තය සඳහා එවැනි ඉල්ලීම් CAASL නිර්දේශ කරයි.

මෙම අංශය මඟින් කර්මාන්තය සඳහා විදේශීය තාක්ෂණික සහ තාක්ෂණික නොවන විදේශගත කාර්ය මණ්ඩලය ඇතුළුව වීසා නිර්දේශ 86 ක් නිකුත් කර ඇති අතර, වසර තුළ විදේශීය සිසුන් සඳහා වීසා නිර්දේශ 282 ක් නිකුත් කර ඇත.

සංචාරක නියෝජිතයන්ට සහ ගුවන් සමාගම්වලට එරෙහිව පාරිභෝගික පැමිණිලි

ගුවන් ප්‍රවාහන සේවා භාවිතා කරන මඟීන් සාමාන්‍යයෙන් ප්‍රසන්න අත්දැකීමක් ලබන නමුත්, සුවිශේෂී දුර්ලභ අවස්ථාවන්හිදී මඟීන් අපහසුතාවයට පත් විය හැකිය. එවැනි මඟීන්ට සංචාරක නියෝජිතයින්ට, ගුවන් සමාගම්වලට සහ ගුවන් තොටුපලවලට එරෙහිව, අධිකාරියට පැමිණිලි කිරීමේ හැකියාව ඇත. CAASL එම පාර්ශ්ව දෙක අතර මැදිහත් වී විසඳුමක් කරා යොමු කරයි.

වර්ෂය තුළ මඟීන්ගෙන් පැමිණිලි 48ක් ලැබී ඇති අතර වසර අවසානයේදී 34ක් විසඳා අවසන් කිරීමට මෙම අංශය සමත් විය. ඉතිරි පැමිණිලි මෙම අංශය විසින් විමර්ශනය කරමින් සිටින අතර, ධනාත්මක ප්‍රතිඵල අපේක්ෂා කෙරේ.

2022 දී 29 වැනි COSCAP-SA මෙහෙයුම් කමිටු රැස්වීමේ සත්කාරකත්වය

මෙහෙයුම් ආරක්ෂාව සහ අඛණ්ඩ ගුවන් යෝග්‍යතා වැඩසටහන - දකුණු ආසියාව (COSCAPS-SA) 29 වැනි පාලන කමිටුරැස්වීම කොළඹදී සාර්ථකව පැවැත්විණි. මෙම සංවිධානය දකුණු ආසියානු කලාපයේ සිවිල් ගුවන් සේවාවල ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පිහිටුවන ලද අතර, මාර්තු 29 සිට 31 දක්වා දින තුනක් කොළඹ හිල්ටන් හෝටල් පරිශ්‍රයේදී මෙම රැස්වීම පැවැත්වුණු අතර එය ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් සංවිධානය කර තිබුණි.

COSCAP-SA 1997 දී ආරම්භ කරන ලද අතර දකුණු ආසියානු කලාපයේ සිවිල් ගුවන්සේවා සුරක්ෂිත කිරීම සඳහා බොහෝ පියවරයන් ගෙන ඇත. සංවිධානයේ සාමාජිකයින්ට අමතරව, බෝයිං (Boeing), ෆෙඩරල් ගුවන්සේවා පරිපාලනය (FAA), එයාර් බස් (Airbus), යුරෝපීය සංගමයේ ගුවන්සේවා ආරක්ෂණ ඒජන්සිය (EASA) සහ බ්‍රිතාන්‍ය (CAA-UK) සහ ප්‍රංශය (DGCA-France) හි සිවිල් ගුවන්සේවා අධිකාරියේ නියෝජිතයන් ද මෙම රැස්වීමට සහභාගී විය.

විවිධ පාර්ශ්වකරුවන් නියෝජනය කරමින් නියෝජිතයින් 60 දෙනෙකු පමණ මෙම රැස්වීමට සහභාගී වී සිටි අතර, Covid-19 වසංගතයෙන් පසු ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්සේවා ක්ෂේත්‍රයේ පැවති පළමු ජාත්‍යන්තර සමුළුව වන මෙම රැස්වීම පැවැත්වීමේ වරප්‍රසාදය ශ්‍රී ලංකාවට හිමි විය.

ICAO හි ප්‍රාදේශීය අධ්‍යක්ෂවරයා 2022 අප්‍රේල් 1 වන දින CAASL ප්‍රධාන කාර්යාලයට පැමිණීම

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ (ICAO) ආසියා පැසිෆික් කලාපීය කාර්යාලයේ කලාපීය අධ්‍යක්ෂ Tao ඒ මහතා 2022 අප්‍රේල් 1 වන දින ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) වෙත පැමිණියේය.

ICAO හි ප්‍රාදේශීය අධ්‍යක්ෂවරයෙකු කටුනායක නව CAASL මූලස්ථානය වෙත පැමිණි පළමු අවස්ථාව මෙය විය. ඔහු ආසියා පැසිෆික් කලාපය සඳහා ඔහුගේ කාර්යභාරය සහ දැක්ම පිළිබඳව කාර්ය මණ්ඩල සාමාජිකයින් ඇමතූ අතර, ඔහුගේ පැමිණීම අපගේ කාර්ය මණ්ඩලයට ආශ්වාදයක් සහ දිරිගැන්වීමක් විය.

මානව සම්පත් සහ දේපල කළමනාකරණ අංශය

ආයතනික ප්‍රතිසංස්කරණ සහ කාර්ය මණ්ඩලය

සේවකයින්ගේ කාණ්ඩ ලෙස 31.12.2022



රූපය 01 - 2022.12.31 දින දක්වා සේවක කාණ්ඩ

ආයතනික කළමනාකරණ ශාඛාව

ප්‍රධාන වශයෙන්ම දක්ෂ හා විශ්වාසනීය ගුවන් ආරක්ෂණ නියාමකයෙකු වීමේ පරමාර්ථය මත පදනම්ව, CAASL හි බඳවා ගැනීමේ ක්‍රියාවලිය දැඩි සහ ඉහළ පරිණාමය වී ඇත. එමඟින් එක් එක් සේවකයා CAASL වෙත ඇතුළු වන්නේ අපේක්ෂිත ප්‍රතිඵලය, සහජ හැකියාවන් ප්‍රශස්ත කිරීම සඳහා ක්‍රියාත්මක කරන ක්‍රම සහ පද්ධති පිළිබඳ පැහැදිලි අදහසක් ඇතිවයි.

රූප සටහන 01 හි දැක්වෙන පරිදි, සමාලෝචිත වර්ෂය අවසන් වන විට, CAASL කාර්ය මණ්ඩලය අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු සහ ප්‍රධාන විධායක නිලධාරියෙකු, ප්‍රධාන විධායක නිලධාරි හැර ජ්‍යෙෂ්ඨ කළමනාකරුගේ රැකියා කාණ්ඩයේ නිලධාරීන් දෙදෙනෙකු (2) ගෙන්, ජ්‍යෙෂ්ඨ කළමණාකරුගේ රැකියා කාණ්ඩයේ අටදෙනෙකු (8) සහ කළමනාකරු කාණ්ඩයේ විසිතුන් දෙනෙකුගෙන් (23) සමන්විත වේ.

වත්මන් සංඛ්‍යාලේඛනවලට අනුව, බලාත්මක කිරීම්/මෙහෙයුම්/ දීර්ඝ කිරීම යන කාණ්ඩයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් හතළිස් තුනක් (43) සේවයේ යොදවා ඇති අතර කාර්ය මණ්ඩල සාමාජිකයින් හත් (7) කනිෂ්ඨ කළමනාකරු යටතේ වර්ගීකරණය කර ඇත. තවද, කාර්ය මණ්ඩල සාමාජිකයින් පස් දෙනෙකු (5) කළමනාකරණ සහකාර - තාක්ෂණික ලෙස සේවයේ යොදවා ඇති අතර, පනස් දෙනෙකු (50) ක් කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන ලෙස සේවයේ යොදවා ඇත. ප්‍රාථමික මට්ටම යටතේ - නිපුණතා සහ ප්‍රාථමික මට්ටම - නුපුහුණු, යන කාණ්ඩ සඳහා පිළිවෙලින් කාර්ය මණ්ඩල සාමාජිකයින් දහසය දෙනෙකු (16) සහ දහහත් දෙනෙකු (17) සේවයේ යොදවා ඇත. තවද, එම කාලය තුළ සේවක පිරිවැටුම 2.33%ක් ලෙස සටහන් වී ඇත.

සේවක සුබසාධන

සේවකයින්ගේ යහපැවැත්ම අධිකාරියේ ප්‍රමුඛතාවයක් වන අතර, 2022 දී, CAASL විසින් සේවකයින්ගේ යහපැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වන පුළුල් පරාසයක සුබසාධන පහසුකම් සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී.

වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සේවකයන්ට සහ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයන්ට වටිනා ප්‍රතිලාභ ලබා දෙන සුබසාධන පහසුකමක් වේ. මෙම වසරේ සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පීවිල්සී හි සහාය ඇතිව අමතර ප්‍රතිලාභයක් වශයෙන් ගෘහස්ථ වෛද්‍ය පහසුකම් කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දෙමාපියන්ට ලබා දීමට රුපියල් 175,000.00ක් වෙන් කර ඇත.

වර්ෂය තුළ බාහිර රෝහී ප්‍රතිලාභ යටතේ හිමිකම් 739ක් ඉදිරිපත් කර ඇති අතර එය 2022 ජනවාරි සිට 2022 දෙසැම්බර් දක්වා රක්ෂණ ඔප්පු කාලය සඳහා රුපියල් 9,487,041 විය. එමෙන්ම, එම කාලසීමාව තුළදී රුපියල් 1,043,441 ක වෛද්‍ය රක්ෂණ නේවාසික ප්‍රතිකාර හිමිකම් 12 ක් ද සේවකයන්ට ප්‍රදානය කර ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සහාය ඇතිව සියලුම සේවකයින්ගේ සෞඛ්‍ය, ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය සහතික කරමින්, අහිතකර තත්ත්වයන්ට මුහුණදීමේ හැකියාව තවදුරටත් ආවරණය කිරීම සඳහා හදිසි අනතුරු රක්ෂණ හිමිකමක් මෙන්ම, CAASL පරීක්ෂකවරුන් සඳහා අතිරේක විශේෂ ආවරණයක් සහිතව හදිසි අනතුරු රක්ෂණ ප්‍රතිපත්තිය ස්ථාපිත කර ඇත.

අධිකාරිය විසින් ස්ථාපිත කරන ලද මාණ්ඩලික ණය වැඩසටහන මගින් කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සැලකිය යුතු මූල්‍ය ආධාර ද ලබා දෙයි. CAASL හි කාර්ය මණ්ඩල සාමාජිකයින් සුභසාධන පියවරක් ලෙස එහි කාර්ය මණ්ඩලයට ණය පහසුකම් සලසා දී ඇති අතර 2022 වසර තුළදී සේවකයින් 38 දෙනෙකු සඳහා ආපදා ණය ලෙස රුපියල් 17,231,638.00 ක මුදලක් ප්‍රදානය කරන ලදී. මේ හැර රු. 9,099,000.00 ක් මෝටර් රථ මිලදී ගැනීම සඳහා ණය වශයෙන් ලබා දී ඇති අතර, අධිකාරිය විසින් කාර්ය මණ්ඩලයේ අට (8) දෙනෙකුට පුෂ් බයිසිකල් මිලදී ගැනීමට සමාලෝචිත වර්ෂයේ රු. 60,000.00ක් ලබා දී ඇත.

කාර්ය මණ්ඩල සාමාජිකයින් හැට හතර දෙනෙකු (64) සඳහා වර්ෂය තුළ උත්සව අත්තිකාරම් ලෙස නිකුත් කර ඇති මුදල රු. 960,000.00 වන අතර, මීට අමතරව, රු. 472,260.00 ක ණය මුදලක් මාසයක වැටුප් ණය ලෙස නිකුත් කර ඇත. CAASL හි මඩකලපු බංගලාව කාර්ය මණ්ඩලයට සාධාරණ මිලකට සුබසාධන පහසුකමක් ලෙස පිරිනමා ඇත. කාර්ය මණ්ඩල සාමාජිකයින් තිස් දෙදෙනෙකු (32) මෙම කාලය තුළ මෙම පහසුකම භාවිතා කර ඇත. තවද, සුබසාධන පහසුකම් තන්ත්‍රය වැඩිදියුණු කරමින් අධිකාරිය සිය කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සුපුරුදු පරිදි දුම්රිය වරෙන්තු ලබා දී ඇත.

පුහුණු කිරීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු, රැස්වීම්, සමුළු සහ පරීක්ෂණ

CAASL ආයතනය මානව ප්‍රාග්ධන සංවර්ධනය සඳහා අඛණ්ඩව ආයෝජනය කළ අතර අධිකාරියේ අනාගත සාර්ථකත්වය සඳහා අවශ්‍ය නිපුණතා සහ දැනුම සේවකයින් විසින් වර්ධනය කර ගැනීම සහතික කිරීම සඳහා එහි දැක්ම වටා ඵලදායී ශ්‍රම බලකායක් නිර්මාණය කළේය. රුපියල්. 2,772,773.87 දේශීය හා ජාත්‍යන්තරව පවත්වනු ලබන මානව සම්පත් සංවර්ධන වැඩසටහන් සඳහා වැය කර ඇත. සමාලෝචනයට භාජනය වන කාල සීමාව තුළ, මානව කුසලතා වර්ධනය කිරීම සහ උපයෝගී කර ගැනීම අරමුණු කර ගනිමින් විකල්ප පුහුණු මාර්ග හරහා ළඟා වීම ඉලක්කය වූ බැවින්, සබැඳි පහසුකම් හරහා සේවකයින්ට පුළුල් පරාසයක පුහුණුවීම් ලබා දෙන ලදී. එබැවින්, 2022 තුළ කාර්ය මණ්ඩල සාමාජිකයින් අසූ හතර දෙනෙකු (84) සඳහා මාර්ගගත පුහුණු සැසි හැත්තෑ එකක් (71) පිරිනමා ඇත.

ගුවන්සේවා කර්මාන්තයේ ගතික ස්වභාවය එහි වෘත්තිකයන්ට වඩාත්ම යාවත්කාලීන කුසලතා සහ නිපුණතා ලබා ගැනීමට අභියෝග කරයි. එබැවින්, සමාලෝචිත කාල සීමාව තුළ දේශීය/ ගෘහස්ථ හා විදේශීය පුහුණුවීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු, රැස්වීම් සහ පරීක්ෂණ විසි හතක් (27) පවත්වා ඇති අතර මේ සම්බන්ධ නවතම ප්‍රවණතා පිළිබඳ අවශ්‍ය යාවත්කාලීන දැනුම ලබා ගැනීම සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් දෙසිය දහදෙනෙකු (210) පුහුණු කර ඇත. කාර්ය මණ්ඩලයේ පොදු පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඇති අතර "පුහුණුකරු පුහුණු කරන්න" යන මාතෘකාව යටතේ කළමනාකරුවන්ගේ කාර්ය මණ්ඩල කාණ්ඩය සඳහා විශේෂ පුහුණුවක් ලබා දී ඇත. එපමනක් නොව, කථා කිරීමේ කුසලතා සහ නිපුණතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් බලාත්මක කිරීම්/මෙහෙයුම්/ ව්‍යාප්ති සහ කනිෂ්ඨ කළමනාකරු යන කාණ්ඩවල සේවකයින්ට "කථන ශිල්ප" වැඩසටහන හඳුන්වා දී ඇත. ටෝස්ට්මාස්ටර්ස් ක්ලබ් (Toastmasters Club) හි මැදිහත්වීමෙන් මෙම වැඩසටහන යටතේ කාර්ය මණ්ඩලයෙහි පනස් දෙනෙකු (50) පුහුණු කර ඇත.



රූපය 2 - මානව සම්පත් සංවර්ධන වැඩසටහන් සඳහා දරන ලද පිරිවැය - 2022



රූපය 3 - 2022 දී මානව සම්පත් සංවර්ධන වැඩසටහන් ගණන

දේපල කළමනාකරණ කටයුතු

HRPM අංශයේ ආයතනික කටයුතු සහ දේපල කළමනාකරණ ඒකකය පහසුකම් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කළමනාකරණය කිරීම තුළින් අධිකාරියේ ප්‍රමුඛ අරමුණ සඳහා අඛණ්ඩව දායක වේ. පහසුකම් සැපයීම හරහා බාධාවකින් තොරව වැඩ කිරීමේ ක්‍රියාවලියක් පවත්වා ගැනීම සඳහා මෙම අංශය අනෙකුත් අංශ වෙත විවිධාංගීකරණය වූ සේවා පැතිකඩක් තවදුරටත් සපයයි.

සමාලෝචිත වර්ෂය තුළ ඉන්ධන අර්බුදය හේතුවෙන් ශ්‍රී ලංකා රජය විසින් පනවන ලද සීමා කිරීම් හේතුවෙන් අධිකාරියේ නිත්‍ය ක්‍රියාකාරිත්වයට බලපෑම් එල්ල විය. කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ශාරීරිකව තම රැකියා ස්ථාන වෙත යාමට නොහැකි වුවද, බහුතරයක් නිවසේ රැඳී සිටිමින් තම සේවය දිගටම කරගෙන ගියේය.

2016/07/01 දිනැති 1973/78 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධානවලට අනුව, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ, ඒ ආශ්‍රිත දේපළ, මඩකලපුව ගුවන් තොටුපළ, රත්මලාන ගුවන් තොටුපළ ඇතුළුව CAASL වෙත පවරා ඇති හඳුනාගත් දේපළ පිළිබඳ පරිපාලන ලේඛන කටයුතු CAASL විසින් ආරම්භ කර ඇත. තවද, නම් කරන ලද නිලධාරියා (දේපල) බඳවා ගැනීම මෙම කටයුතුවල ප්‍රගතිය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත.

ඒ හා සමානව, (2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ පනතේ තුන්වන උපලේඛනයේ දක්වා ඇති) පහත සඳහන් ගුවන් සේවය හා සම්බන්ධ ස්ථාන සහ ඒවාට අදාළ ඉඩම් පැවරීමේ ක්‍රියාවලිය 2022 තුළ ආරම්භ කර ඇත.

1. රත්මලාන කඳවල පාරේ පිහිටි සිවිල් ගුවන්සේවා පුහුණු මධ්‍යස්ථානය, එහි ඇති ගොඩනැගිලි සහ ව්‍යුහයන්, සහ ඊට අදාළ ඉඩම.

2. රත්මලාන අත්තිඩිය ගුවන් සන්නිවේදන සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය, එහි ඇති ගොඩනැගිලි සහ ව්‍යුහයන්, සහ ඊට අදාළ ඉඩම.

3. ගම්පහ, මඩම්පැල්ලෙහි පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සඳහා වන ගුවන්විදුලි නාවික ආධාර, එහි ඇති ගොඩනැගිලි සහ ව්‍යුහයන්, සහ ඊට අදාළ ඉඩම.

4. ගම්පහ පමුණුගම, කැපුංගොඩ පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ධාවන පථය සඳහා රේඩියෝ නාවික ආධාරකය, එහි ඇති ගොඩනැගිලි සහ ව්‍යුහයන්, සහ ඊට අදාළ ඉඩම.

5. පිදුරුතලාගල කන්දේ පිහිටි රේඩාර් මධ්‍යස්ථානය, එහි ඇති ගොඩනැගිලි සහ ව්‍යුහයන්, සහ ඊට අදාළ ඉඩම.

6. නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිදුරුතලාගල ප්‍රදේශයේ පිහිටි ගුවන්සේවා කාර්ය මණ්ඩලය සඳහා නිවාඩු බංගලා ඉදිකර ඇති ඉඩම, සහ එහි ව්‍යුහයන්.

මූල්‍ය සහ ආදායම් කළමනාකරණ අංශය

අරමුණු සහ කාර්යයන්

අධිකාරියේ සියලුම අධීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් මූල්‍ය කළමනාකරණ අංශය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

ඒ අනුව, CAASL හි මූල්‍ය සහ ආදායම්වල උපායමාර්ගික අරමුණු ඵලදායී අයුරින් කළමනාකරණය කරනු ලැබේ.

මූල්‍ය සහ ආදායම් කළමනාකරණ අංශයේ ප්‍රධාන කාර්යයන්:

- ආදායම් එකතු කිරීම සහ වියදම් කළමනාකරණය.
- මූල්‍ය පුරෝකථනය සහ වැඩසටහන් අයවැයකරණය.
- අරමුදල් කළමනාකරණය.
- මූල්‍ය වාර්තාකරණය.
- බඩුතොග කළමනාකරණය.
- වාහන සංචිතය කළමනාකරණය.

අපගමන බද්ද එකතු කිරීම සහ බෙදා හැරීම

2003 අංක 25 දරන මූල්‍ය පනතට අනුව, ගුවන් සමාගම්වලින් මගී අපගමන බදු එකතු කිරීම සහ එම එකතුව නිසි පරිදි අදාළ ආයතන සඳහා බෙදාදීමේ බලය සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් හා ප්‍රධාන විධායක නිලධාරී වරයාවෙත පැවරී ඇත. අධිකාරිය වෙනුවෙන් මූල්‍ය හා ආදායම් කළමනාකරණ අංශය මෙම රාජකාරිය ඉටු කරනු ලැබේ.

2022 වසරේ මගීන් 1,710,287ක් මගී අපගමන බදු ගෙවා ඇති අතර පහත සඳහන් මුදල් පහත ආයතන වෙත බෙදා දී ඇත.

ආයතනය	මුදල (රු. මිලියන)
මහා භාණ්ඩාගාරය	22ල249
ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (පුද්ගලික) සමාගම	4ල771
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	2ල385
ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය	183

අංශයේ කාර්ය සාධනය

- වාර්ෂික අයවැය/ අධිකාරියේ මූල්‍ය බලතල පැවරීම / වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

2022 වාර්ෂික අයවැය වාර්තා, අධිකාරියේ මූල්‍ය බලතල පැවරීමේ වාර්තා, 2021 මූල්‍ය වර්ෂයේ මූල්‍ය වාර්තා නියමිත දිනට පෙර සම්පූර්ණ කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු ඉදිරිපත් කරන ලදී.

- **ආදායම් එකතු කිරීම**

පහත සඳහන් ආදායම් මූලාශ්‍රවලින් ආදායම් එකතු කර ඇත.

- විදේශ විකුණුම් අධිකාරය
- අපගමන බද්දේ සේවා ගාස්තුව
- නියාමන සේවාවලින් ලැබෙන ආදායම
- කාර්ය මණ්ඩල ණය සහ අරමුදල් කළමනාකරණයෙන් ලැබෙන පොලී ආදායම
- වෙනත් මෙහෙයුම් නොවන ආදායම්

සිවිල් ගුවන්සේවා අධිකාරිය පහත ක්‍රම වලින් ගෙවීම් භාර ගනී.

- ප්‍රධාන කාර්යාලයේ ගෙවීම් කවුන්ටරයට කරන මුදල්/චෙක්පත් ගෙවීම්
- ක්‍රෙඩිට්/ඩෙබිට් කාඩ්පත් භාවිතයෙන් මාර්ගගත ගෙවීම්
- ලංකා QR ක්‍රමය
- අපගමන බදු එකතු කිරීමේ ගිණුම් ලෙස ක්‍රියාත්මක වන බැංකු ගිණුම් වෙත සෘජු තැන්පතු

- **ඒකාබද්ධ අරමුදල වෙත යවන මුදල්**

ජාතික ආර්ථිකය දියුණු කිරීම සහ රාජ්‍ය ආදායම ශක්තිමත් කිරීම සඳහා 2022 වසරේදී රුපියල් මිලියන 1,000 ක් ඒකාබද්ධ අරමුදලට පැවරිණි.

- **බදු පියවීම**

ආදායම් බද්ද, එකතු කළ අගය මත බද්ද සහ මුද්දර ගාස්තු නියමිත දිනට පියවා ඇත.

- **අරමුදල් කළමනාකරණය**

කෙටි කාලීන ඉතුරුම් සහ දිගු කාලීන ඉතුරුම් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කිරීම සඳහා අධිකාරිය මහජන බැංකුව සහ ලංකා බැංකුව සමඟ අරමුදල් කළමනාකරණ ගිණුම්

ආයතනික කළමනාකරණ ශාඛාව

පවත්වාගෙන යයි.

සිවිල් ගුවන්සේවා අධිකාරියෙහි මූල්‍ය කාර්ය සාධනය - 2022















රුපියල් මිලියන
4,268
පිරිවැටුම



රුපියල් මිලියන
2,743
බදු ගෙවීමෙන් පසු ශුද්ධ ලාභය



රුපියල් මිලියන
9,572
මුළු වත්කම්



රුපියල් මිලියන
6,494
මුළු ප්‍රාග්ධනය සහ සංචිත

CAASL හි තාක්ෂණික කාර්ය සාධනය පිළිබඳ සාරාංශය 2022

රෙගුලාසි/දැනුම්දීම්/නීති ගණන	2022	2021
ගුවන් යානා මෙහෙයුම්	4	2
ගුවන් යානා ලියාපදිංචි කිරීම සහ ගුවන් යෝග්‍යතාව	-	1
ගගන යාත්‍රාංගන	3	2
ගුවන් නාවික සේවා	5	5
පියාසර නිරුපද්‍රතතාව	3	6
ගුවන් වෛද්‍ය සේවා	3	14

සංවිධාන/පුද්ගලයින් පිළිබඳ මූලික සහතිකය	2022	2021
ගුවන්සේවා (විදේශීය)	4	9
නඩත්තු සංවිධාන	1	3
ගුවන් නියමුවන්	201	192
ගුවන් ගමනාගමන පාලක	20	-
ගුවන් යානා නඩත්තු බලපත්‍ර දරන්නන්	30	32
ගුවන් මෙහෙයුම් නිලධාරීන් (ගුවන් ගමන් පිටත් කරන්නන්)	0	1
පියාසර උපදේශකවරු	7	-
සහකාර පියාසර උපදේශකවරු	-	6
බිම් උපදේශකයන්	25	15
කැබින් කාර්ය මණ්ඩල සාමාජිකයින්	7	6

සහතික ලත් සංවිධාන/පුද්ගලයින් නිරීක්ෂණය	2022	2021
බෑවුම් පරීක්ෂණ - මෙහෙයුම්	10	3
සිමියුලේටර් පරීක්ෂණ	3	3
මාර්ග පරීක්ෂණ	6	1
අන්තරායකර භාණ්ඩ පරීක්ෂණ	15	12
ප්‍රධාන මූලික පරීක්ෂණ/උපදේශක නිරීක්ෂණ	6	8
නම් කරන ලද චෙක් නියමුවන් (DCP අධීක්ෂණ)	5	16
බෑවුම් පරීක්ෂණ - ගුවන් යෝග්‍යතාව	15	-
ගුවන් යානා නඩත්තු සංවිධානයේ පරීක්ෂණ	22	10
අනුමත නඩත්තු පුහුණු සංවිධානයේ පරීක්ෂණ	11	1
අබණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධානය (CAMO) පරීක්ෂණ	10	8
පියාසර පුහුණු පාසල් පරීක්ෂණ	13	8
ගගන යාත්‍රාංගන පරීක්ෂණ	31	29
ATM පරීක්ෂණ	36	30
AIM පරීක්ෂණ	12	9
SMS පරීක්ෂණ	15	-
CNS පරීක්ෂණ	26	21
සිතියම් සහ ප්‍රස්ථාර පරීක්ෂණ	3	3
ANS අහඹු පරීක්ෂණ	2	-
SKED නොවන පියාසැරි පරීක්ෂණ	5	-
ගුවන්සේවා ආරක්ෂක නිරීක්ෂණ ක්‍රියාකාරකම් පැවැත්වීම (පරීක්ෂණ, විගණන, සමීක්ෂණ, පරීක්ෂා කිරීම්)	75	52

අවසන් විගණනය	2022	2021
ගුවන්සේවා ආරක්ෂාව	3	-

ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 2022

මෙහෙයවීම සහ කළමනාකරණය	2022	2021
අධිකාරි රැස්වීම්	9	9
විගණන කමිටු රැස්වීම්	4	3
කාර්ය මණ්ඩල කමිටු රැස්වීම්	2	2
කර්මාන්ත උපදේශක රැස්වීම්	39	68
බාහිර, සංවිධානය පත්කිරීම/පෞද්ගලික	135	137
NGAP ශ්‍රී ලංකා කමිටු රැස්වීම්	8	15

නෛතික කටයුතු සහ බලාත්මක කිරීම (LA&E)	2022	2021
නිකුත් කරන ලද/සමාලෝචනය කරන ලද/සංශෝධිත අනුබද්ධ නීති	22	13
ගිවිසුම් / අවබෝධතා ගිවිසුම	30	26
නීතිපති දෙපාර්තමේන්තුවෙහි/නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවෙහි සහභාගී වූ උපදේශන සංඛ්‍යාව	18	11
නෛතික කරුණු සම්බන්ධයෙන් CAASL/DGCA වෙත නීති උපදෙස් ලබා දීම	110	103
උසාවියේ පෙනී සිටීම්	31	22
සකස් කරන ලද නෛතික ලියකියවිලි	9	8
සමාලෝචනය කරන ලද CAASL ලියකියවිලි ගණන	9	7

ගුවන්සේවා ආරක්ෂණය (AVSEC)	2022	2021
සමාලෝචන/සංශෝධන - NCASP සහ අනුබද්ධ ලේඛන	13	-
ඇගයීම්/සමාලෝචන - දේශීය ගුවන් සමාගම්/ගුවන්තොටුපළ ක්‍රියාකරු ගුවන්සේවා ආරක්ෂණ වැඩසටහන	5	10
ඇගයීම්/සමාලෝචන - විදේශීය ගුවන් සමාගම් ක්‍රියාකරු ගුවන්සේවා ආරක්ෂණ වැඩසටහන	9	17
ඇගයීම්/සමාලෝචන - ගුවන්සේවා ආරක්ෂණ පුහුණු වැඩසටහන/අධ්‍යයන පරාසය	2	7
ගුවන්සේවා ආරක්ෂක නිරීක්ෂණ ක්‍රියාකාරක පැවැත්වීම (පරීක්ෂණ, විගණන, සමීක්ෂණ, පරීක්ෂණ)	75	52
ගුවන්සේවා ආරක්ෂක කළමනාකරුවන් සහතික කිරීම සහ නැවත සහතික කිරීම	19	20
ගුවන්සේවා ආරක්ෂක උපදේශකයන් සහතික කිරීම සහ නැවත සහතික කිරීම	19	14
ගුවන්සේවා ආරක්ෂක පිරික්සුම්කරුවන් සහතික කිරීම සහ නැවත සහතික කිරීම	747	648
ගුවන් යානයක් තුළ/භාණ්ඩ රඳවනයන් මත ආයුධ රැගෙන යාම සඳහා අනුමැතිය	36	47
ගුවන්තොටුපළ ප්‍රවේශ බලපත්‍ර නිකුත් කිරීම සඳහා නිර්දේශ කිරීම	297	191
ගුවන්සේවා ආරක්ෂක පුහුණුව/දේශන/ඉදිරිපත් කිරීම් පැවැත්වීම	1	6
රාජ්‍ය සහ අනෙකුත් ආයතන සඳහා විශේෂඥ සේවා සැපයීම	1	-

පරිසර, පර්යේෂණ සහ ව්‍යාපෘති (ERP)	2022	2021
ජාත්‍යන්තර ගුවන් සමාගම් සංඛ්‍යාන වාර්තා	322	317
අභ්‍යන්තර ගුවන් සමාගම් සංඛ්‍යාන වාර්තා	47	48
යවන ලද ICAO වාර්තා කිරීමේ පෝරම	52	51
CAASL ක්‍රියාකාරකම් හි කාර්යසාධන සංඛ්‍යාන වාර්තා	239	214
CAASL හි රාජ්‍ය ආයතන/සාමාන්‍ය ප්‍රජාව/අනෙකුත් අංශ සඳහා සංඛ්‍යාලේඛන විධිවිධාන	22	20
නිකුත් කල ලංසු/RFP (යෝජනා සඳහා ඉල්ලීම)	18	40
ප්‍රදානය කරන ලද ගිවිසුම්	66	53
සකස් කරන ලද CAASL මණ්ඩල පත්‍රිකා	3	2
CAASL වැඩමුළු/උත්සව/වැඩසටහන්/විශේෂ දිනයන් සඳහා පරිපාලනමය සහය	4	3
රැස්වීම්/පුහුණුවීම්/සම්මන්ත්‍රණ/වැඩමුළු (ගුවන්සේවා) සංවිධානය කිරීම සඳහා පරිපාලනමය සහය	1	1

ගුවන් සන්තරණ සේවා (ANS)	2022	2021
පවත්වන ATM පරීක්ෂණ	36	30
පවත්වන AIM පරීක්ෂණ	12	9
පවත්වන SMS පරීක්ෂණ	15	-
පවත්වන CNS පරීක්ෂණ	26	21
පවත්වන ලද සිතියම් සහ ප්‍රස්ථාර පරීක්ෂණ	3	3
අහඹු ANS පරීක්ෂණ	2	-
කාලසටහන්ගත නොවන පියාසැරි පරීක්ෂණ (Non-SKED)	5	-
NOTAM නිකුතුව සඳහා අනුමැතීන්	416	579
නිකුත් කරන AIP අතිරේකය	7	3
AIP සංශෝධනය	2	1
නිකුත් කරන ලද AIC ගණන	4	4
අනුමත කරන ලද ගුවන් කාර්යයන් ගණන	53	41
නිකුත් කරන ලද ගොඩබෑමේ නිෂ්කාශන	383	551
නිකුත් කරන ලද ගුවන් පියාසැරි නිෂ්කාශන	991	584
කාලසටහන්ගත නොකළ පියාසැරි අනුමත කිරීම් ගණන	1,374	1,135
යවන ලද AFTN	813	478
ලද AFTN	4,250	3,850
ගොඩබෑමේ සහ වාහන නැවැත්වීමේ ගාස්තුවලින් නිදහස් කිරීම් ගණන	6	12
රාජ්‍ය තාන්ත්‍රික පියාසැරිය (ගොඩබෑම) සඳහා විරෝධතා නොමැති සටහන් ගණන	73	153
රාජ්‍ය තාන්ත්‍රික පියාසැරිය (ඉහළින් පියාසර කිරීම) සඳහා විරෝධතා නොමැති සටහන් ගණන	93	57
කොළඹ පියාසර තොරතුරු කලාපයට ඉහළින් පියාසර කරන ගුවන්යානා සංඛ්‍යාව	24,177	9,757

ගුවන් යාත්‍රාංගන සහ පහසුකම් සැලසීම	2022	2021
අනුමත කල කුළුණු ගණන	**209**	343
උස් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අනුමැතිය	**122**	172
ගොඩබිම් ගුවන්තොටුපළ සහතිකය - අලුත් කිරීම්	**4**	1
සිදු කරන ලද ගුවන් යාත්‍රාංගන නිරීක්ෂණ	**31**	29
ගුවන්සේවා පුහුණුව සහ පුද්ගල බලපත්‍ර	**2022**	**2021**
ශිෂ්‍ය නියමු බලපත්‍ර (SPL) (නිකුත් කිරීම + අලුත් කිරීම්)	**145**	211
පෞද්ගලික නියමු බලපත්‍ර (PPL) (නිකුත් කිරීම + අලුත් කිරීම්)	**124**	173
වාණිජ නියමු බලපත්‍ර (CPL) (නිකුත් කිරීම + අලුත් කිරීම්)	**174**	306
ගුවන් ප්‍රවාහන නියමු බලපත්‍ර (ATPL) (නිකුත් කිරීම + අලුත් කිරීම්)	**293**	448
ගුවන් ගමන් පාලක බලපත්‍ර (ATC) (නිකුත් කිරීම + අලුත් කිරීම්)	**45**	54
ගුවන්යානා නඩත්තු ඉංජිනේරු බලපත්‍ර (නිකුත් කිරීම + අලුත් කිරීම්)	**-**	2
ගුවන්යානා නඩත්තු බලපත්‍ර (නිකුත් කිරීම + අලුත් කිරීම්)	**60**	81
ගුවන්යානා නඩත්තු බලපත්‍ර - ශ්‍රේණිගත කිරීම් වර්ග (නිකුත් කිරීම්)	**107**	36
ගුවන්යානා නඩත්තු බලපත්‍ර - කාණ්ඩ (නිකුත් කිරීම්)	**12**	1
ගුවන්යානා මැදිරි කාර්ය මණ්ඩල සහතිකය (නිකුත් කිරීම + අලුත් කිරීම්)	**253**	176
පියාසර මෙහෙයුම් නිලධාරි බලපත්‍ර (නිකුත් කිරීම + අලුත් කිරීම්)	**-**	1
PPL, CPL සහ ATPL නිකුත් කිරීම් සඳහා ගුවන්යානා වර්ග ශ්‍රේණිගත කිරීම	**66**	67
සහකාර පියාසර උපදේශක (AFI) සහ පියාසර උපදේශක (FI) ශ්‍රේණිගත කිරීම (නිකුත් කිරීම + අලුත් කිරීම්)	**7**	9
පියාසර පාසල් බලපත්‍ර (නිකුත් කිරීම + අලුත් කිරීම්)	**9**	9
භූමි උපදේශක බලපත්‍ර (නිකුත් කිරීම + අලුත් කිරීම්)	**-**	3
භූමි උපදේශක අනුමැතීන් (නිකුත් කිරීම + අලුත් කිරීම්)	**25**	19
ගුවන් ගමන් පාලක ශ්‍රේණිගත කිරීම (නිකුත් කිරීම්+ අලුත් කිරීම්)	**106**	120
NIB නිෂ්කාශන නිකුත් කිරීම	**56**	114
PPL විභාගය (ප්‍රශ්න පත් ගණන)	**493**	463
AML විභාගය (පරීක්ෂණ ගණන)	**2**	1
AML විභාගය (ප්‍රශ්න පත් ගණන)	**1,440**	1ල114
ATPL (A) විභාග	**101**	33
ATPL (A) භාර දුන් ප්‍රශ්න පත් ගණන	**1,375**	737
ATPL (H) විභාග	**9**	1
ATPL (H) විභාගය ප්‍රශ්න පත් ගණන)	**27**	6
ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පරීක්ෂාව (ELPC)	**140**	124

ගුවන් යානා මෙහෙයුම්	2022	2021
විශේෂ මෙහෙයුම්	**-**	41
විදේශ ගුවන් ක්‍රියාකරු සහතිකය - පළමු නිකුත් කිරීම	**4**	9
විදේශ ගුවන් ක්‍රියාකරු සහතිකය - අලුත් කිරීම	**42**	29
අන්තරායකර භාණ්ඩ ප්‍රවාහන බලපත්‍ර - පළමු නිකුත් කිරීම	**5**	-
අන්තරායකර භාණ්ඩ ප්‍රවාහන බලපත්‍ර - අලුත් කිරීම	**17**	12
DCP - පළමු නිකුත් කිරීම	**1**	5
DCP - අලුත් කිරීම	**7**	17
ජාත්‍යන්තර ගුවන් ක්‍රියාකරු සහතිකය - අලුත් කිරීම	**3**	1
සිමියුලේටර් අලුත් කිරීම	**3**	3
PPC අවසරය	**62**	87
සිදු කරන ලද නිරීක්ෂණ කටයුතු	**45**	31
ලියාපදිංචි ඩ්‍රෝන - දේශීය හිමිකරුවන්	**1,091**	857
ලියාපදිංචි ඩ්‍රෝන - විදේශීය හිමිකරුවන්	**1,526**	171

ප්‍රධාන කාර්ය සාධන දර්ශකය 2022

ගුවන්යානා ලියාපදිංචිය සහ ගුවන් යෝග්‍යතාව (AR&AW)	2022	2021
සිදු කරන ලද නිරීක්ෂණ කටයුතු (බෑවුම්, විගණනය)	98	81
ගුවන්යානාවන්හි ගුවන් යෝග්‍යතා සහතිකය - පළමු නිකුත් කිරීම	1	4
ගුවන්යානාවන්හි ගුවන් යෝග්‍යතා සහතිකය - අලුත් කිරීම	45	54
ගුවන්යානා ලියාපදිංචි කිරීමේ සහතිකය - පළමු නිකුත් කිරීම	1	3
ගුවන්යානා ලියාපදිංචි කිරීමේ සහතිකය - අලුත් කිරීම	55	69
නඩත්තු සංවිධානය (දේශීය) - අලුත් කිරීම	18	10
නඩත්තු සංවිධානය (විදේශීය) - පළමු නිකුත් කිරීම	1	3
නඩත්තු සංවිධානය (විදේශීය) - අලුත් කිරීම	56	55
නඩත්තු පුහුණු සංවිධානය - අලුත් කිරීම	1	3
අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධානය - පළමු නිකුත් කිරීම	6	-
අඛණ්ඩ ගුවන් යෝග්‍යතා කළමනාකරණ සංවිධානය - අලුත් කිරීම	5	5
ගුවන්සේවා සිදුවීම් පිළිබඳ විමර්ශන	298	164

ගුවන් ප්‍රවාහනය සහ ආර්ථික නියාමනය (ATER)	2022	2021
අභ්‍යන්තර ගුවන් ගමන් කාලසටහන් අනුමත කිරීම්	55	44
ගුවන් ප්‍රවාහන සේවා සැපයුම්කරුවන් සඳහා සිදු කරන ලද ඇගයීම්	46	29
ජාත්‍යන්තර ගුවන් ගමන් කාලසටහන් අනුමත කිරීම්	492	1,093
විදේශ තාක්ෂණික/තාක්ෂණික නොවන විශේෂඥ කාර්ය මණ්ඩලය සඳහා වීසා බලපත් නිර්දේශ	86	71
ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් සේවය සඳහා වරලත් බලපත්	7	7
ශ්‍රී ලංකාවේ ලියාපදිංචි ගුවන් සමාගම සඳහා ගුවන් බලපත්	2	5
වරලත් බලපත් - ජාත්‍යන්තර මෙහෙයුම්	2	-
වරලත් බලපත් - අභ්‍යන්තර නිත්‍ය මෙහෙයුම්	8	2
ගුවන් ප්‍රවාහන සැපයුම්කරුගේ බලපත්‍ර	442	309
විදේශ ගුවන් බලපත්‍ර	6	-

මානව සම්පත් සහ දේපළ කළමනාකරණය (HRPM)	2022	2021
කාර්ය මණ්ඩල බඳවා ගැනීම්	1	8
මුළු කාර්ය මණ්ඩලය (ස්ථිර සේවක සංඛ්‍යාව)	172	176
පහසුකම් සලසන ලද විදේශ පුහුණුවීම්/සම්මන්ත්‍රණ/වැඩමුළු	7	-
පහසුකම් සලසන ලද විදේශ රැස්වීම් / සම්මන්ත්‍රණ / සමුළු	4	2
පහසුකම් සලසන ලද විදේශ පරීක්ෂණ	8	1
පහසුකම් සලසන ලද දේශීය පුහුණුවීම්/සම්මන්ත්‍රණ/වැඩමුළු	1	4
පහසුකම් සලසන ලද දේශීය අභ්‍යන්තර පුහුණු වැඩසටහන් (උපදෙස් ඇතුළුව)	11	8
පහසුකම් සලසන ලද මාර්ගගත පුහුණුව/ සම්මන්ත්‍රණ/වැඩමුළු	18	53
පහසුකම් සලසන ලද මාර්ගගත රැස්වීම්/සම්මන්ත්‍රණ	2	5
කාර්ය මණ්ඩල ණය පහසුකම්	72	47

තත්ව සහ අභ්‍යන්තර විගණනය (Q&IA)	2022	2021
සිදු කරන ලද විගණන	94	80
ඉදිරිපත් කළ නිගමන	86	110

ගුවන්සේවා ආරක්ෂණ අධීක්ෂණය	2022	2021
වාර්තා වූ සිදුවීම් (බරපතළ/සුළු)	6	12
වාර්තා වූ අනතුරු	-	1
වාර්තා වූ සිදුවීම්	321	226
මගීන්ට හෝ ගුවන් කාර්ය මණ්ඩලයට සිදු වූ බරපතළ තුවාල	-	1
මගීන්ට හෝ කාර්ය මණ්ඩලයට ඇති වූ සුළු තුවාල	2	3
සකසන ලද නව මාර්ගෝපදේශයන්	2	1
පවතින මාර්ගෝපදේශ සංශෝධනය කිරීම්	2	8
සකසන ලද නව ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් (IS)	-	2
පවතින ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් (IS) සංශෝධනය කිරීම්	-	2
බලපත්‍රලාභීන් සම්බන්ධයෙන් වන අනතුරු/සිදුවීම් සත්‍යාපනය	106	39

ගුවන් වෛද්‍ය සේවා (AMS)	2022	2021
වෛද්‍ය පරීක්ෂණ	1,348	1,353

තොරතුරු තාක්ෂණය (IT)	2022	2021
මිලදී ගත් නව තොරතුරු තාක්ෂණ උපකරණ පිළිබඳ සිදු කරන ලද තක්සේරු කිරීම්	2	14
ප්‍රවේශ වී සහ බෙදා හැර ඇති ICAO ලේඛන	1,085	720

සිවිල් ගුවන්සේවා ප්‍රවර්ධනය සහ මාධ්‍ය	2022	2021
ගුවන්සර සඟරාව පළ කිරීම	-	1
CADEC වැඩසටහන පැවැත්වීම	5	-
පාසල් සිසුන් සඳහා පවත්වන ලද වැඩමුළු	2	-
විශේෂ ක්‍රියාකාරකම් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	1	9
රූපවාහිනී වැඩසටහන්	21	38

2022 වර්ෂයේ ගුවන් ගමන් පිළිබඳ සාරාංශය

	2022	2021	වර්ධනය
ජාත්‍යන්තර ගුවන් ගමන්			
මගීන්			
ඇතුළු වූ	**2,878,370**	708,076	307%
පිට වූ	**2,624,169**	792,002	231%
මාර්ගස්ථ	**881,226**	196,553	348%
ගුවන් භාණ්ඩ (මෙට්‍රික් ටොන්)			
දේශීය	**63,612**	72,676	-12%
ජාත්‍යන්තර	**103,357**	111,463	-7%
ගුවන්යානා සංචලන			
කාලසටහන්ගත ගුවන් ගමන්	**35,917**	18,738	92%
කුලී ගුවන් ගමන්	**1,682**	2,269	-26%
මෙහෙයුම් සිදු කරන ලද ගුවන් සමාගම් සංඛ්‍යාව			
නියමිත සේවා	**30**	32	-6%
කුලී	**25**	37	-32%
සියලු ගුවන් භාණ්ඩ	**4**	4	-
අභ්‍යන්තර ගුවන් ගමන්			
ප්‍රවාහනය කරන ලද මගීන්	**6,519**	5,406	21%
ගුවන්යානා සංචලන	**1,539**	1,093	41%
මෙහෙයුම් සිදු කරන ලද ගුවන් සමාගම් සංඛ්‍යාව	**5**	5	-
කාලසටහන්ගත ගුවන් ගමන්	**2**	2	-
කුලී ගුවන් ගමන්	**3**	3	-



මූල්‍ය ප්‍රකාශන 2022

විස්තීර්ණ ආදායම් පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		2022	2021
	සටහන	රු.	රු.
ආදායම			
මෙහෙයුම් ආදායම	23	**3,685,224,914**	993,344,282
මෙහෙයුම් නොවන ආදායම	23	**583,077,759**	134,905,424
		4,268,302,673	1,128,249,706
වියදම			
කාර්ය මණ්ඩල වියදම්	24	**457,965,055**	356,754,794
රැස්වීම්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු	25	**7,507,808**	2,292,036
පුහුණු කිරීම් සඳහා වියදම්	26	**1,474,290**	4,617,621
පරිපාලන සහ වෙනත් වියදම්	27	**260,886,367**	195,510,215
ක්ෂය වීම්	29	**137,374,730**	139,863,363
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම	30	**15,314,716**	8,590,685
වත්කම පාවිච්චි කිරීමේ හිමිකම් සඳහා ක්ෂය	31	**21,034**	21,034
		880,544,000	707,649,748
බදු පෙර ලාභය		**3,387,758,673**	420,599,958
ආදායම් බදු වියදම්	28	**644,515,000**	90,701,569
වර්ෂය සඳහා ලාභය		**2,743,243,673**	329,898,389
වෙනත් විස්තීර්ණ ආදායම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් නැවත මිණුම් කිරීමෙන් ජනිත ලාභය / (අලාභය)		**53,276,761**	(12,908,854)
නැවත ඇගයීමේ අතිරික්තය		**113,812,525**	-
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		**2,910.332,959**	316,989,535

පිටු අංක 72 සිට පිටු අංක 91 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අනිවාර්ය අංගයකි.

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2022 රු.	2021 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම			
දේපළ, පිරියත සහ උපකරණ	29	**2,233,315,801**	2,231,885,553
අස්පෘශ්‍ය වත්කම්	30	**11,929,326**	27,244,041
වත්කම පාවිච්චි කිරීමේ හිමිකම	31	**315,505**	336,539
නොනිමි වැඩ - ප්‍රාග්ධනය	32	**460,920,979**	469,622,198
ස්ථාවර තැන්පතු - කාර්ය මණ්ඩල සුභසාධනය සහ සමාජ ආරක්ෂණ අරමුදල		**142,337**	135,269
විලම්භිත බදු - වත්කම්		**15,596,177**	15,596,177
මුළු ජංගම නොවන වත්කම්		**2,722,220,125**	2,744,819,777
ජංගම වත්කම්			
තොග		**9,789,941**	5,624,206
වෙළඳ ලැබිය යුතු දෑ	33	**293,915,448**	126,228,278
කාර්ය මණ්ඩල ණය	34	**55,980,902**	79,172,733
මූල්‍ය වත්කම්	35	**3,352,854,505**	1,394,337,537
අත්තිකාරම්, පෙර ගෙවුම්, වෙනත් ලැබිය යුතු දෑ	36	**545,422,389**	557,517,473
මුදල් සහ මුදල් සමාන දෑ	37	**2,592,346,695**	1,748,236,749
මුළු ජංගම වත්කම්		**6,850,309,880**	3,911,116,976
මුළු වත්කම්		**9,572,530,005**	6,655,936,753
හිමිකම් සහ වගකීම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
රජයේ ප්‍රදාන	38	**554,889,603**	558,598,755
රඳවාගත් ඉපැයුම්	39	**5,826,217,782**	4,029,697,346
නැවත ඇගයීමේ අතිරික්තය	40	**113,812,525**	-
මුළු ප්‍රාග්ධනය සහ සංචිත		**6,494,919,909**	4,588,296,103
වගකීම්			
වත්මන් නොවන වගකීම්			
කල් දැමූ බදු වගකීම්	41	**63,470,341**	37,265,104
බදු වගකීම	42	**307,013**	329,501
ප්‍රතිපාදන සහ අනෙකුත් වගකීම්	43	**72,495,410**	61,267,822
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම	44	**21,196,052**	66,185,597
මුළු ජංගම නොවන වගකීම්		**157,468,816**	165,048,024
වත්මන් වගකීම්			
වෙළඳ ගෙවිය යුතු	45	**2,372,386,756**	1,654,555,238
වෙනත් ගෙවිය යුතු	46	**65,701,955**	74,744,483
ආදායම් බදු වගකීම්	47	**482,052,569**	173,292,905
මුළු වත්මන් වගකීම්		**2,920,141,280**	1,902,592,626
සම්පූර්ණ කොටස් සහ වගකීම්		**9,572,530,005**	6,655,936,753

පිටු අංක 72 සිට පිටු අංක 91 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අනිවාර්ය අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන මගින් 2022.12.31 දිනට අධිකාරියේ මූල්‍ය තත්වය පිළිබඳ සත්‍ය සහ සාධාරණ දර්ශනයක් ලබා දේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර අත්සන් කරන ලදී.

මංජුලා එන්. වික්‍රමනායක
අධ්‍යක්ෂ - මූල්‍ය හා ආදායම් කළමනාකරණ

පී.ඒ. ජයකාන්ත
සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් සහ
ප්‍රධාන විධායක නිලධාරී

පී.එස්.විතානගේ
සභාපති

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය
2023 පෙබරවාරි 27

ස්කන්ධ වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

	රජයේ ආධාර	නැවත ඇගයීමේ අතිරික්තය	රඳවාගත් ඉපැයුම්	මුළු එකතුව
2021 ජනවාරි 1 වැනි දිනට ශේෂය	562,818,117		3,762,707,811	4,325,525,928
කාලය සඳහා ලාභය	-		329,898,390	329,898,389
ඒකාබද්ධ අරමුදලට මාරුවීම්	-		(50,000,000)	(50,000,000)
වසර සඳහා අස්පෘශ්‍ය කිරීම	(4,219,362)		-	(4,219,362)
විශ්‍රාම ප්‍රතිලාභය නැවත මැනීම	-		(12,908,854)	(12,908,854)
2021 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය	558,598,755	-	4,029,697,348	4,588,296,103
කාලය සඳහා ලාභය	-	-	2,743,243,673	2,743,243,673
වත්කම් නැවත තක්සේරු කිරීම	-	113,812,525	-	113,812,525
වසර සඳහා අස්පෘශ්‍ය කිරීම	(3,709,152)	-	-	(3,709,152)
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් නැවත මැනීම	-	-	53,276,761	53,276,761
ඒකාබද්ධ අරමුදල් මාරු කිරීම්	-	-	(1,000,000,000)	(1,000,000,000)
2022 දෙසැම්බර් 31 වැනි දිනට ශේෂය	554,889,603	113,812,525	5,826,217,782	6,494,919,909

පිටු අංක 72 සිට පිටු අංක 91 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අනිවාර්ය අංගයකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් මුදල් ප්‍රවාහය			
බදු අය කිරීමට පෙර සාමාන්‍ය ක්‍රියාකාරකම් වෙතින් ලද ලාභය/(අලාභය)		**3,387,758,674**	420,599,959
ගැලපුම්			
ක්ෂය වීම්	29	**137,374,730**	139,863,363
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම	30	**15,314,716**	8,590,685
වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම් සඳහා ක්ෂය වියදම්	31	**21,034**	21,034
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම	38	**(3,709,152)**	(4,219,362)
ආයෝජන වෙතින් ලද පොලී ආදායම	23	**(541,714,111)**	(120,997,733)
දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද (ලාභය)/අලාභය		**3,550**	243,984
කල්බදු වගකීම්හි මූල්‍ය පිරිවැය	41	**4,296**	2,946
නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් සඳහා ප්‍රතිපාදන	43	**12,250,981**	8,350,858
කාරක ප්‍රාග්ධනයෙහි වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/(අලාභය)		**3,007,304,717**	452,455,734
තොගයෙහි වැඩිවීම		**(4,165,735)**	1,339,500
වෙළඳ ලැබිය යුතු දෑහි (වැඩිවීම)/අඩුවීම	33	**(167,687,169)**	592,723,776
කාර්ය මණ්ඩල ණයවල (වැඩිවීම)/අඩුවීම	34	**(9,687,605)**	15,403,383
අත්තිකාරම්/පෙරගෙවීම්/වෙනත් ලැබිය යුතු දෑ හි (වැඩිවීම)/අඩුවීම	36	**(2,994,691)**	(17,447,387)
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ හි වැඩිවීම	44/45	**708,788,990**	(642,510,113)
මෙහෙයුම්වලින් ජනිත මුදල්		**3,531,558,507**	401,964,894
ගෙවන ලද නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය (පාරිතෝෂිකය)	44	**(3,963,765)**	(5,159,109)
ගෙවන ලද ආදායම් බදු	46	**(309,550,100)**	(39,772,423)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් ලද ශුද්ධ මුදල්		**3,218,044,642**	357,033,363
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් වූ මුදල් ප්‍රවාහ			
දේපළ, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම	29	**(25,086,196)**	(62,565,451)
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම	30	**-**	(31,753,401)
ප්‍රාග්ධනය අඩුවීම/(වැඩිවීම) කරගෙන යන	32	**8,701,220**	(4,828,122)
වෙනත් ආයෝජන ඉවත් කර ගැනීම/(අත්පත් කර ගැනීම)	35	**(2,070,348,167)**	(171,880,262)
ලද පොලිය		**701,514,519**	86,634,742
දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල්		**90,193**	103,051
හදිසි අනතුරු විමර්ශන අරමුදලේ වැඩි වීම/(අඩුවීම).		**(1,055,481)**	-
බැංකු සහතිකයේ අඩුවීම		**12,276,000**	(32,812,815)
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යොදවන ලද ශුද්ධ මුදල		**(1,373,907,913)**	(217,102,258)
මූල්‍ය ක්‍රියාකාරකම් වෙතින් වූ මුදල් ප්‍රවාහ			
ථිකාබද්ධ අරමුදල වෙත දායකත්වය-		**(1,000,000,000)**	(50,000,000)
කල්බදු පදනමින් ගත් වීරවිල ඉඩම සඳහා ගෙවීම	42	**(26,784)**	(26,784)
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යොදවන ලද ශුද්ධ මුදල		**(1,000,026,784)**	(50,026,784)
මුදල් සහ මුදල් සමාන දෑහි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		**844,109,945**	89,904,320
වර්ෂය ආරම්භයේ මුදල් සහ මුදල් සමාන දෑ	37	**1,748,236,749**	1,658,332,429
වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් සමාන දෑ	37	**2,592,346,694**	1,748,236,749

පිටු අංක 72 සිට පිටු අංක 91 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අනිවාර්ය අංගයකි.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1. ආයතනික තොරතුරු

1.1 පොදු තොරතුරු

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ ලියාපදිංචි කාර්යාලය නොමැ 152/1, මිනුවන්ගොඩ පාර, කටුනායක හි පිහිටා ඇත.

1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වාභාවය

2020 දෙසැම්බර් 27 දිනැති 2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරිය පනත යටතේ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පිහිටුවන ලදී. එහි ක්‍රියාවලිය ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ සිවිල් ගුවන් සේවයේ විධිමත්භාවය මෙන්ම ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ 2002 අංක 34 දරන පනත සහ 2010 අංක 14 දරන පනතෙහි ව්‍යවස්ථාදායක නියෝග යටතේ, ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය විසින් අනුගමනය කරන ලද අදාළ ජාත්‍යන්තර ප්‍රමිති සහ නිර්දේශිත පිළිවෙත්වලට අනුකූලව පරිසරය වෙත එහි බලපෑම පාලනය කරමින් ව්‍යවස්ථාපිත මණ්ඩලයකට අනුව කටයුතු කරනු ලබයි.

1.3 නිකුත් කිරීම සඳහා අවසර ලබා දුන් දිනය

2022 පෙබරවාරි 24 වැනිදා සිවිල් ගුවන්සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට අවසර ලබා දී ඇත.

සාමාන්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති

2. පිළියෙල කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

2021 දෙසැම්බර් 31 වන දිනට සහ එදිනෙන් අවසන් වසරට අධිකාරියේ මූල්‍ය තත්ව ප්‍රකාශය, ලාභ හෝ අලාභ ප්‍රකාශය සහ අනෙකුත් විස්තීර්ණ ආදායම, හිමිකම් වෙනස් වීම, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ සටහන් ඇතුළත් සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති ("මූල්‍ය ප්‍රකාශ"), සංසන්දනාත්මක තොරතුරු සමඟින්, ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිති මණ්ඩලයෙන් නිකුත් කර ඇති පරිදි, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති දක්වනු ලබන ("IFRS") ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFR) (LKAS) අනුව සකස් කර ඇත. ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ කළමනාකරණය මූල්‍ය ප්‍රකාශ සැකසීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම දරනු ලබයි.

2.2 මිනුම් පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත සකස් කර ඇති අතර, මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමින් මනිනු ලැබේ.

2.3 ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල්

අධිකාරියේ ක්‍රියාකාරී මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල් ලෙස හඳුනා ගැනෙන අතර, මූල්‍ය ප්‍රකාශ ද ශ්‍රී ලංකා රුපියල් මඟින් නිරූපණය කරනු ලබයි.

2.4 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට ඇති හැකියාව කළමනාකරණය විසින් තක්සේරු කරනු ලබයි. අධිකාරියට එහි නීත්‍යනුකූල කටයුතු ඉටු කිරීමට සහ ඉදිරි අනාගතයේ දී මෙහෙයුම් හි පැවැත්ම පවත්වා ගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවට කළමනාකරණය සතුව සාධාරණ බලාපොරොත්තුවක් පවතී. අනාගතය පිළිබඳ පවතින තොරතුරු සලකා බලන කල්හි ඈවර කිරීමකට හෝ මෙහෙයුම් නැවැත්වීමට අවශ්‍ය යැයි අධිකාරිය විසින් අපේක්ෂා කරනු නොලබයි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ දී අධිකාරිය විසින් අඛණ්ඩ පැවැත්මේ පදනම යොදා ගනු ලබයි.

2.5 සැලකිය යුතු ගිණුම්කරණ තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම සඳහා කළමනාකරණය විසින් ආදායම්, වියදම්, වත්කම්, සහ වගකීම්වල ප්‍රමාණයට බලපාන තීන්දු, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම සහ වාර්තා කරනු ලබන දිනයට අවිනිශ්චිත වගකීම් අනාවරණය කළ යුතුය. කෙසේ වෙතත් මෙම උපකල්පන සහ ඇස්තමේන්තුවල අවිනිශ්චිතතාව ප්‍රතිඵලයන් සඳහා බලපානු ඇත. ඉදිරියේ දී බලපෑ හැකි වත්කම් හෝ වගකීම්වල ධාරණ අගයේ ද්‍රව්‍යාත්මක වෙනස්කම් සිදු කිරීමට එය බලපානු ඇත.

තීන්දු

ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීම සඳහා සම්බන්ධ වීම

ඇස්තමේන්තු සහ උපකල්පන

ඉදිරි මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ වගකීම් හි ධාරණ අගයේ ද්‍රව්‍යමය ගැලපීමක් ඇති කිරීමේ සැලකිය යුතු අවදානමක් ඇති, අනාගතය පිළිබඳ ප්‍රධාන උපකල්පන සහ වාර්තා කරන දිනයේ ඇස්තමේන්තු අවිනිශ්චිතතාවයේ අනෙකුත් ප්‍රධාන මූලාශ්‍ර පහතින් සාකච්ඡා කෙරේ.

(අ) මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම

මූල්‍ය තත්ව ප්‍රකාශයේ දක්වා ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකම සහ වාර්තාගත මූල්‍ය වගකීම්, ක්‍රියාකාරී වෙළඳපොළෙන් ඇති විය නොහැකි විට, වට්ටම් කළ මුදල් ප්‍රවාහ ආකෘතිය සහ/හෝ ගණිතමය ආකෘති භාවිතය ඇතුළත් විවිධ තක්සේරු ක්‍රම භාවිත කර ඒවා තීරණය කරනු ලැබේ. මෙම ආකෘතීන් සඳහා යෙදවුම් හැකි අවස්ථාවල දී නිරීක්ෂණය කළ හැකි වෙළඳපළ දත්තවලින් ඇති වන අතර, නිරීක්ෂණය කළ හැකි වෙළඳපළ දත්ත නොමැති විට, සාධාරණ වටිනාකම් ස්ථාපිත කිරීම සඳහා විනිශ්චයක් අවශ්‍ය වේ.

මෙම සාධකවල උපකල්පන වෙනස්කම්, වාර්තා කළ මූල්‍ය වත්කම්වල සාධාරණ වටිනාකම සඳහා බලපෑ හැකිය. භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන සඳහන් අගයේ දක්වා ඇති අතර පෙර වසරේ දී ඒවායේ වියදම මත දක්වා ඇත.

ශේෂ පත්‍රයේ දිනට මූල්‍ය වත්කම්වල වටිනාකම (Carrying Value) (භාණ්ඩාගාර බිල්පත්) රු. 3,474,976,963/- (2021 රු. 1,404,628,796/-)

(ආ) නිර්වචිත ප්‍රතිලාභ බැඳියාවන් පිළිබඳ තක්සේරුව

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) හි මිනුම් රීතියකට අනුව නිර්වචිත ප්‍රතිලාභ බැඳියාවන් පිළිබඳ තක්සේරුවේ පිරිවැය ගණනය කරනු ලබයි.

ශේෂ පත්‍රයේ දිනට නිර්වචිත ප්‍රතිලාභ බැඳියාවන්හි වටිනාකම රු. 21,196,052 (2021 රු. 66,185,597/-) කි.

ඇ) සාධාරණ වටිනාකම

සාධාරණ වටිනාකම යනු, දැනුවත් පිරිස සහ කිසිඳු බලකිරීමක් නොමැතිව කැමැත්තෙන් සිටින පාර්ශ්වයන් අතර දුරස්ථභාවයකින් ගනුදෙනු කිරීම මඟින් එකඟවන, සැලකිලිමත් වනු ලබන අගයයි. මූල්‍ය උපකරණයක් මුලින් හඳුනා ගත් විට, එහි සාධාරණ වටිනාකම සාමාන්‍යයෙන් ගෙවූ හෝ ලැබුණු සලකා බැලීමේ වටිනාකම වේ. මූලික හඳුනාගැනීමෙන් පසුව, සක්‍රීය වෙළඳපොළක ගෙන හැර දක්වන මූල්‍ය වත්කමක සාධාරණ වටිනාකම සාමාන්‍යයෙන් ලංසු මිල වන අතර, සක්‍රීය වෙළඳපොළක ගෙන හැර දක්වන මූල්‍ය වගකීමක් සඳහා සාධාරණ වටිනාකම සාමාන්‍යයෙන් විකුණුම් සඳහා ඉදිරිපත් කරන මිල නම් වේ. මුදල් සමාන දෑ වැනි මූල්‍ය උපකරණ, සහ කෙටි කාලයක් පවතින කෙටි කාලීන ආයෝජන සඳහා, මෙම උපකරණවල ධාරණ අගය (Carrying Value) සාධාරණ වටිනාකමට ආසන්න වේ.

ඈ) ආදායම් බද්ද

අධිකාරිය ආදායම් බදු සඳහා යටත් වන අතර, ආදායම් බදු සඳහා සමස්ත විධිවිධාන නිශ්චය කිරීම සඳහා සැලකිය යුතු තීන්දු අවශ්‍ය වේ

වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

3. මූල්‍ය වත්කම්

අධිකාරිය එහි මූල්‍ය වත්කම් පහත කොටස් දෙකට වර්ග කොට දක්වයි: ණය සහ ලැබිය යුතු දෑ, කල් පිරෙන තෙක් තබා ඇති සහ විකුණුම් සඳහා යොදා ගත හැකි. මූලික හඳුනාගැනීමේ දී කළමනාකරණය විසින් වර්ගීකරණය තීරණය කරනු ලබන අතර ආයෝජන ලබා ගන්නා ලද අරමුණ මත රඳා පවතී.

3.1 වර්ගීකරණය

(අ) ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු, සක්‍රීය වෙළඳපොළක සඳහන් කර නොමැති, ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ඇති විය නොහැකි මූල්‍ය වත්කමකි. සාමාන්‍ය ගනුදෙනුවලින් ඇති වන ලැබිය යුතු මුදල් ද මෙම කාණ්ඩයේ වර්ගීකරණය කර ඇති අතර හානිකරණ සඳහා සමාලෝචනය කෙරේ.

(ආ) කල් පිරෙන තෙක් තබා ඇති මූල්‍ය වත්කම්

කල් පිරෙන තෙක් තබා ඇති ආයෝජන යනු, ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ඇති විය නොහැකි මූල්‍ය වත්කම් වන අතර, අධිකාරියේ කළමනාකාරිත්වයට ධනාත්මක චේතනාවක් ඇති ස්ථාවර කල්පිරීම් සහ පහත දෑ හැර කල්පිරීම පවතින දෑ වේ.

- මූලික හඳුනා ගැනීම් මත අධිකාරිය ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකම ලෙස නම් කරයි; හෝ
- විකුණුම් සඳහා යොදා ගත හැකි යනුවෙන් අධිකාරිය නම් කරයි; සහ
- ණය සහ ලැබිය යුතු දෑ යන්නෙහි අර්ථය සපුරාලන,

කල් පිරෙන තෙක් තබා ඇති ආයෝජනවල පොලී, ආදායම් ප්‍රකාශයෙහි දක්වා ඇති අතර, 'ආයෝජන ආදායම්' ලෙස වාර්තා කොට ඇත.

(ඇ) විකුණුම් සඳහා යොදා ගත හැකි මූල්‍ය වත්කම්

විකුණුම් සඳහා යොදා ගත හැකි ආයෝජන යනු අනිශ්චිත කාල සීමාවකට තබා ගැනීමට අදහස් කරනු ලබන මූල්‍ය වත්කම් වේ. ද්‍රවශීලිතාවයේ අවශ්‍යතාව මත විකිණීම හෝ පොලි අනුපාත, හුවමාරු අනුපාත මත වෙනස් කරනු ලබන හෝ ද්‍රවශීලිතාවයේ මිල හෝ ණය සහ ලැබිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර නොමැති, කල් පිරෙන තෙක් තබා ඇති ආයෝජන හෝ ලාභ හෝ අලාභ තුළින් සාධාරණ වටිනාකම මත මූල්‍ය වත්කම් වේ.

3.2 හඳුනා ගැනීම සහ මිනුම් කිරීම

මූල්‍ය වත්කම් මූලිකව සාධාරණ වටිනාකමකින් හඳුනාගෙන ඇති අතර, සියලුම මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමකින් රැගෙන නොයන අවස්ථාවක, ඒවා අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය වේ. ලාභ හෝ අලාභ තුළින් සාධාරණ වටිනාකමකින් ගෙන යන මූල්‍ය වත්කම්, මූලිකව සාධාරණ වටිනාකමින් හඳුනාගෙන ඇති අතර, ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශයේ වියදම් කෙරේ. මූල්‍ය වත්කම් ඔවුන්ගෙන් මුදල් ප්‍රවාහ ලබා ගැනීමේ අයිතිය කල් ඉකුත් වූ විට හෝ ඒවා මාරු කර ඇති විට ඒවා හඳුනා ගැනීමෙන් බැහැර කරනු ලබන අතර, අධිකාරිය විසින් හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ වාසි සැලකිය යුතු ලෙස පවරා ඇත. විකුණුම් සඳහා යොදා ගත හැකි මූල්‍ය වත්කම් පසුව සාධාරණ වටිනාකමින් ගෙන යනු ලැබේ. ඵලදායී පොලී ක්‍රමය භාවිතා කරමින් ණය සහ ලැබිය යුතු මුදල් සහ කල්පිරීමට නියමිත මූල්‍ය වත්කම් ක්‍රමක්ෂයගත පිරිවැයක් යටතේ ගෙන යනු ලැබේ.

කල්පිරීමට නියමිත ලෙස වර්ගීකරණය කරනු ලබන මූල්‍ය සහ මූල්‍ය නොවන සුරැකුම්හි සාධාරණ වටිනාකමෙහි වෙනස්කම්, වෙනත් විස්තීරණ ආදායම්හි හඳුනා ගැනේ.

විකුණුම් සඳහා යොදා ගත හැකි හෝ හානිකරණ ලෙස සුරැකුම් වර්ගීකරණය කරන විට, වෙනත් විස්තීරණ ආදායම්හි හඳුනා ගනු ලබන සමුච්චිත සාධාරණ අගයේ වෙනස්කම්, මූල්‍ය වත්කම්හි ආදායම් ප්‍රකාශයේ හඳුනා ගත් ශුද්ධ ලාභ/අලාභ ලෙස ඇතුළත් කොට ඇත.

විකුණුම් සඳහා යොදා ගත හැකි සුරැකුම්හි පොලිය ඵලදායී පොලී ක්‍රමය භාවිත කොට ගණනය කර ඇති අතර, ආදායම් ප්‍රකාශයේ දී හඳුනා ගැනේ.

3.3 සාධාරණ වටිනාකම හඳුනාගැනීම

ණය සහ අත්තිකාරම්හි සාධාරණ වටිනාකම මෙන්ම බැංකු වෙත වගකීම් සහ ගනුදෙනුකරුවන්, ගිවිස ගෙන එකඟ වූ මූල්‍ය ප්‍රවාහ, බැර තත්වය, ද්‍රවශීලිතාව සහ වියදම් වර්තමාන අගය ආකෘතිය යොදා ගෙන හඳුනා ගනු ලබයි.

ධාරණ අගයෙන් (Carrying Value), වෙළඳ ලැබිය යුතු දෑ සහ ගෙවිය යුතු දෑ සඳහා හානිකරණ ප්‍රතිපාදන අඩු කළ පසු ඒවායේ සාධාරණ අගයට ආසන්න අගයක් ලැබෙන බව උපකල්පනය කෙරේ.

3.4 හඳුනා ගැනීමෙන් බැහැර කිරීම

මූල්‍ය වත්කමක් (හෝ මූල්‍ය වත්කමක කොටසක් හෝ සමූහයෙන් කොටසක සමාන මූල්‍ය වත්කමක් යොදා ගත හැකි විටක) හඳුනා ගැනීමෙන් බැහැර කරනු ලබන්නේ,

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

- කල් ඉකුත් වූ වත්කම්වලින් මූල්‍ය ප්‍රවාහ යොදා ගැනීමේ අයිතිය.

- වත්කම්වලින් මූල්‍ය ප්‍රවාහ යොදා ගැනීමේ අයිතිය අධිකාරිය විසින් පවරා ඇත හෝ 'ගනුදෙනු සැලැස්මක් සඳහා එකඟවීම යටතේ තෙවන පාර්ශ්වයක් වෙත ද්‍රව්‍යාත්මක ප්‍රමාදයකින් තොරව සම්පූර්ණයෙන් ලැබිය යුතු මූල්‍ය ප්‍රවාහ ගෙවීමේ වගකීම උපකල්පනය කරනු ලැබේ.

(අ) අධිකාරිය වත්කමේ අවදානම් සහ වාසි සියල්ල සෘහෙන පරිදි පවරා ඇත. හෝ

(ආ) අධිකාරිය වත්කමේ අවදානම් සහ වාසි සියල්ල සෘහෙන ලෙස පවරා හෝ රඳවා ගෙන නොමැති නමුත් වත්කම් පාලනය පවරා ඇත.

අධිකාරිය එහි වත්කමකින් මූල්‍ය ප්‍රවාහ ලැබීමේ අයිතිය පවරා ඇති විටක හෝ 'ගනුදෙනු සැලැස්මක් සඳහා එකඟවීමකට යොමු වූ විටක සහ වත්කමේ අවදානම් සහ වාසි සියල්ල සෘහෙන ලෙස පවරා හෝ රඳවා ගෙන නොමැති හෝ එහි පාලනය පවරා නැති විටක, අධිකාරියේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට වත්කම් හඳුනාගෙන ඇත. මෙහිදී, අධිකාරිය මූල්‍ය ප්‍රකාශන - 2021 හවුල් වගකීමක් ලෙස ද හඳුනා ගැනේ. පවරන ලද වත්කම සහ හවුල් වගකීම අධිකාරිය රඳවා ගත් අයිතීන් සහ වගකීම් පෙන්නුම් කිරීම මත ගණනය කරනු ලබයි. පැවරූ වත්කම පිළිබඳ ඇපකරයක ස්වරූපය ගන්නා අඛණ්ඩ මැදිහත්වීම වත්කම්වල මුල් රැගෙන යන මුදලට වඩා අඩුවෙන් මනිනු ලබන අතර අධිකාරියට ආපසු ගෙවීමට අවශ්‍ය විය හැකි උපරිම සලකා බැලීමේ ප්‍රමාණය මනිනු ලැබේ.

4. දේපළ, පිරියත සහ උපකරණ

4.1 පිරිවැය/ප්‍රත්‍යාගණනය

එදිනෙදා සේවා ව්‍යාපෘතිවලින් සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩු කළ පසු හිමිකරු සතු දේපළ ඇතුළුව දේපළ සහ උපකරණ, ව්‍යාපෘතිහි සටහන් කරනු ලැබේ. උපයන විට ආදේශනය හෝ ප්‍රධාන පිරික්සුම් ව්‍යාපෘති ප්‍රාග්ධනීකරණය කරනු ලබන අතර, භාණ්ඩය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමට සම්භාවිතාවක් තිබේ නම් සහ භාණ්ඩයේ පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිය.

දේපළ සහ උපකරණවල ව්‍යාපෘති යනු අත්කර ගැනීමේ හෝ ගොඩනැංවීමේ ව්‍යාපෘති සහ එහි අපේක්ෂිත භාවිතය සඳහා වත්කම් එහි පවතින තත්වයට ගෙන ඒමට දරන ලද ඕනෑම ව්‍යාපෘතියක්ය. දේපළ සහ උපකරණ ආයිතමයක් පසුව ප්‍රත්‍යාගණනය කළහොත් එවැනි වත්කම් සියල්ලම ප්‍රත්‍යාගණනය කරනු ලැබේ. 2014 වසර සිට බලාත්මක වන පරිදි සෑම අවුරුදු 3-5 කට වරක්ම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිපත්ති අධිකාරිය විසින් වෙනස් කරනු ලබයි. කෙසේ වෙතත් වත්කම්හි සාධාරණ අගය ප්‍රත්‍යාගණනයට යටත් වන විට ධාරණ අගයෙන් (Carrying Value) ද්‍රව්‍යාත්මකව වෙනස් වන විට වැඩිදුර ප්‍රත්‍යාගණනය කරනු ලබයි.

එය ආදායම් ප්‍රකාශයේ පෙර හඳුනාගෙන ඇති එම වත්කමේ ප්‍රත්‍යාගණනය කිරීමේ අඩුවීමක් ප්‍රතිවර්තනය කරන ප්‍රමාණයට හැර, වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට ධාරණ අගයේ ඕනෑම වැඩි වීමක් ප්‍රත්‍යාගණන සංචිතය වෙත සෘජුවම බැර කරනු ලැබේ. එවැනි අවස්ථාවක වැඩි කිරීම ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ. ප්‍රත්‍යාගණන සංචිතයක අතිරික්තයකට එරෙහිව, එම වත්කමේ පෙර අතිරික්තයක් හිලව් කරන ඕනෑම ප්‍රත්‍යාගණනය කිරීමේ හිඟයක් සෘජුවම හිලව් කරනු ලබයි. අතිරික්තය ව්‍යාපෘතියක් ලෙස පිළිගනී. බැහැර කිරීම මත විකුණන ලද වත්කම්වලට අදාළ ඕනෑම ප්‍රත්‍යාගණනය සංචිතයක් රඳවා ගත් ඉපැයීම් වෙත මාරු කරනු ලැබේ.

4.2 ක්ෂය වීම

ක්ෂයවීම් සඳහා වන ප්‍රතිපාදන දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය/තක්සේරුව (වත්කම්වල පිරිවැය/ඇගයීමේ අවශේෂ වටිනාකමෙන් 10% ට අඩු) සරල මාර්ග ක්‍රමය මත ගණනය කෙරේ. ඉඩම් හැර අනෙකුත් සියලුම දේපළ, පිරියත සහ උපකරණ ප්‍රයෝජනවත් ආයු කාලය තුළ එවැනි මුදල් කපා හැරීම සඳහා පහත සඳහන් ප්‍රතිශත මත වාර්ෂිකව ක්ෂය කර ඇත.

ගොඩනැගිලි	6 2/3%
බහාලූම් ව්‍යුහයන්	10%
රථ වාහන	12.5 %
දේපළ, පිරියත සහ උපකරණ	25 %
ලී භාණ්ඩ සහ සවිකිරීම්	25 %
වෙනත් ස්ථිර වත්කම්	25 %

භාවිත කිරීමට ඇති වත්කම් දින සිට සමානුපාතික පදනම මත ලාභ සහ අලාභ හිඟුමට ක්ෂයවීම් අය කර ඇති අතර තනි වත්කම්වල ක්ෂය විය හැකි ප්‍රමාණය තීරණය කිරීමේ දී පිරිවැය/ප්‍රත්‍යාගණන අගයෙන් 10%ක් ඉතිරි අගය ලෙස රඳවාගෙන ඇත.

ක්ෂයවීම් ක්‍රමය, ප්‍රයෝජනවත් ආයු කාලය සහ අවශේෂ අගයන් කළමනාකරණය විසින් එක් එක් වාර්තාකරණ දිනක දී සමාලෝචනය කරනු ලබන අතර, පවතින හොඳම තොරතුරු සහ වත්කම්වල අපේක්ෂිත ආර්ථික කාර්යක්ෂමතාව මත පදනම්ව LKAS 16 විසින් අවශ්‍ය පරිදි අදාළ නම් වෙනස් කරනු ලැබේ. මෙම ඇස්තමේන්තුවල අවිනිශ්චිතා, තාක්ෂණික යල්පැනීම් සඳහා අදාළ වන අතර එය ඇතැම් මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණ උපකරණවල උපයෝගීතාව වෙනස් කරනු ලබයි.

වත්කම් වෙත තක්සේරු කරන ලද ප්‍රයෝජනවත් ආයුකාල පහත පරිදි වේ.

ගොඩනැගිලි	අවුරුදු 15 - 40
බහාලූම් ව්‍යුහයන්	අවුරුදු 5 -10
මෝටර් රථ	අවුරුදු 8 -15
දේපළ, පිරියත සහ උපකරණ	අවුරුදු 4 -10
ලී භාණ්ඩ සහ සවිකිරීම්	අවුරුදු 4 -10
වෙනත් ස්ථිර වත්කම්	අවුරුදු 4 -10

4.3 හඳුනා ගැනීමෙන් බැහැර කිරීම

බැහැර කිරීමේ දී හෝ එය භාවිතයෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට දේපළ සහ උපකරණවල අයිතම හඳුනා ගැනීමෙන් බැහැර කරනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණවල අයිතමයක් හඳුනා නොගැනීමෙන් ඇතිවන ලාභය හෝ අලාභය තීරණය වන්නේ, විකුණුම් ක්‍රියාවලිය සහ වත්කම් ධාරණ අගය

(Carrying Value) අතර වෙනස මඟින් වන අතර එය ආදායම් ප්‍රකාශයෙන් හඳුනා ගනු ලැබේ.

4.4 ස්පෘශ්‍ය වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේ දී, අධිකාරිය විසින් එහි ස්පෘශ්‍ය වත්කම්වල ධාරණ වටිනාකම සමාලෝචනය කරනුයේ එම වත්කම්වල අලාභ හානි සිදුවී ඇති බවට යම් ඇඟවීමක් තිබේද යන්න තීරණය කිරීමටය. එවැනි කිසියම් ඇඟවීමක් තිබේ නම්, හානිකරණ අලාභයේ ප්‍රමාණය (ඇත්නම්) තීරණය කිරීමට වත්කම්වල අයකර ගත හැකි අගය ඇස්තමේන්තු කරනු ලැබේ. තනි වත්කමක අයකර ගත හැකි අගය ඇස්තමේන්තු කිරීමට නොහැකි වූ විට, එම වත්කම අයත් වන මුදල් උත්පාදන ඒකකය සඳහා අයකර ගත හැකි අගය තීරණය කරනු ලැබේ. වෙන් කිරීමේ සාධාරණ සහ ස්ථාවර පදනමක් හඳුනාගත හැකි විට, වත්කම් තනි මුදල් උත්පාදන ඒකක සඳහා ද වෙන් කරනු ලැබේ හෝ එසේ නොමැති නම් සාධාරණ සහ ස්ථාවර වෙන් කිරීමේ පදනමක් හඳුනාගත හැකි කුඩාම මුදල් උත්පාදන ඒකක සමූහයට ඒවා වෙන් කරනු ලැබේ.

වත්කමේ අය කර ගත හැකි අගය යනු වත්කමේ සාධාරණ අගයෙන් වත්කම විකිණීමට දරන පිරිවැය අඩු කළ පසු අගය හා වත්කම දැනට භාවිතා කරන අයුරෙන් ඉපයිය හැකි ආදායම යන දෙකෙන් වැඩි අගය වේ. භාවිතයේ ඇති වටිනාකම තක්සේරු කිරීමේ දී, ඇස්තමේන්තුගත ඉදිරි මුදල් ප්‍රවාහයන් ඒවායේ වර්තමාන වටිනාකමට වට්ටම් කරනු ලබන්නේ බදු වලට පෙර වට්ටම් අනුපාතයක් භාවිත කරමිනි. එය මුදල්වල කාල වටිනාකමෙහි වර්තමාන වෙළඳපල තක්සේරු කිරීම් පිළිබිඹු කරන අතර අනාගත මුදල් ප්‍රවාහයන් ඇස්තමේන්තු කරන වත්කමට විශේෂිත වූ අවදානම් ගලපා නැත.

වත්කමක (හෝ මුදල් උත්පාදන ඒකකයේ) අයකරගත හැකි මුදල, එහි ධාරණ වටිනාකමට Carrying Value වඩා අඩු යැයි ඇස්තමේන්තු කර ඇත්නම්, වත්කමේ (මුදල් උත්පාදන ඒකකය) ධාරණ වටිනාකම එහි ආපසු ලබාගත හැකි වටිනාකමෙන් අඩු කරනු ලැබේ. අදාළ වත්කම නැවත අගය කිරීමේ වටිනාකමින් ගෙන යන්නේ නම් හැර, හානිකරණ අලාභයක් ආදායම් ප්‍රකාශයේ අනතුරුව හඳුනා ගනේ. එවැනි අවස්ථාවක ප්‍රත්‍යාගණනය පාඩුවක් ලෙස හානිකරණ අලාභ හඳුනා ගනේ.

4.5 නොනිමි ප්‍රාග්ධන ක්‍රියාකාරකම්

නොනිමි ප්‍රාග්ධන ක්‍රියාකාරකම් පිරිවැයෙහි දක්වනු ලබයි. මේවා ප්‍රාග්ධනීකරණය අපේක්ෂිත ගොඩනැගිලි සහ පද්ධති සංවර්ධනයන් ඉදිකිරීමේ දී සෘජුවම දරන ලද ප්‍රාග්ධන ආකාරයේ වියදම් වේ.

සම්පූර්ණ කිරීමේ සහතිකය ලද පසු හෝ වත්කම භාවිත කිරීමට හැකි විට මෙම වියදම් CAASL වත්කම් ලේඛනයට යොදා ගනු ලැබේ

4.6 අස්පෘශ්‍ය වත්කම්

පිරිවැය ආකෘතිය අස්පෘශ්‍ය වත්කම් මැනීමේදී යොදා ගනු ලැබේ. තොරතුරු තාක්ෂණ මෘදුකාංග සහ මෙහෙයුම් පද්ධතිවල පිරිවැය (වත්කම්වල පිරිවැයේ අවශේෂ වටිනාකම 10% ට අඩු) මත සෘජු රේඛා පදනම මත ක්‍රමක්ෂය සඳහා ප්‍රතිපාදන ගණනය කෙරේ. ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරාවට එවැනි මුදල් කපා හැරීම සඳහා සියලුම තොරතුරු තාක්ෂණ මෘදුකාංග 50% ක අනුපාතයකින් වාර්ෂිකව ක්ෂය කර ඇත.

අස්පෘශ්‍ය වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කිරීමේ අවශ්‍යතාවය සමඟ වරින් වර සමාලෝචනය කෙරේ. තොරතුරු තාක්ෂණ මෘදුකාංගයේ ප්‍රයෝජනවත් ආයු කාලය පහත පරිදි වේ:

තොරතුරු තාක්ෂණ මෘදුකාංග
අවුරුදු 2- 4

4.7 කල්බදු ගිවිසුම්

4.7.1 වත්කම පාවිච්චි කිරීමේ හිමිකම

අධිකාරිය බදු දීමේ ආරම්භක දිනයේ දී වත්කම පාවිච්චි කිරීමේ හිමිකම හඳුනා ගනී (එනම්, පදනම් වූ වත්කමේ භාවිත කළ හැකි දිනය). වත්කම පාවිච්චි කිරීමේ හිමිකම පිරිවැයෙන් ගණනය කරනු ලැබේ. වත්කම පාවිච්චි කිරීමේ හිමිකම පහත සඳහන් පරිදි කල්බදු කාල සීමාව සහ ඇස්තමේන්තුගත වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය තුළ සරල මාර්ග ක්‍රමය මත ක්ෂය වේ.

වත්කම	ඇස්තමේන්තුගත ආයු කාලය
ඉඩම	අවුරුදු 30 ට වැඩි

4.7.2 කල්බදු වගකීම්

අධිකාරිය විසින් කල්බදු ආරම්භක දිනයේ දී, කල්බදු කාල සීමාව තුළ සිදු කළ යුතු බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම අනුව මනිනු ලබන කල්බදු වගකීම් හඳුනා ගනේ. කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම ගණනය කිරීමේදී, අධිකාරිය විසින් බදු දීම ආරම්භ කරන දිනයේ දී භාණ්ඩාගාර බැඳුම්කර අනුපාතය භාවිත කරනු ලබයි.

5. තොග

සියලුම තොග, පිරිවැය අනුව තක්සේරු කර ඇත. ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කළ ක්‍රමය මත පදනම්ව පිරිවැය තීරණය වේ (FIFO). තොග ස්ථාවර හා පරිභෝජ්‍ය වලින් සමන්විත වේ.

6. අනෙකුත් වත්කම්

අනෙකුත් වත්කම් සඳහා වෙනත් ණය ගැතියන් සහ ලැබිය යුතු, අත්තිකාරම්, තැන්පතු, පෙරගෙවුම්, ලැබිය යුතු බදු ඇතුළත් වේ.

(අ) අත්තිකාරම්, තැන්පතු, පෙරගෙවුම් වියදම්

එක් මූල්‍ය වර්ෂයකට වඩා ප්‍රතිලාභයක් හෝ සම්බන්ධතාවයක් ඇතැයි සැලකෙන වියදම් අත්තිකාරම්, තැන්පතු සහ පෙරගෙවුම් වියදම් ලෙස වර්ග කෙරේ. එවැනි වියදම්, එය අදාළ වන කාල සීමාව තුළ, කාල සීමා පදනම මත කපා හරිනු ලැබේ.

(ආ) වෙනත් ණය ගැතියන්

වෙනත් ණය ගැතියන් අඩු හානිකරණ අලාභය සහිතව හඳුනා ගනේ

(ඇ) ලැබිය යුතු බදු

ලැබිය යුතු බදු, පිරිවැයෙන් හඳුනා ගනේ.

(ඈ) කාර්ය මණ්ඩල පෙරගෙවුම් පිරිවැය

අධිකාරියේ සේවකයින්ට සහනශීලී පොලියට ලබා දී ඇති කාර්ය මණ්ඩල ණය වලින් ඇති වන ශේෂය මෙමඟින් නියෝජනය කරනු ලබයි.

(ඉ) ලැබිය යුතු එකතු කළ අගය මත බද්ද

මෙය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු එකතු

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

කළ අගය මත බදු ආපසු ගෙවීම් නියෝජනය කරයි.

7. මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමානකම් යනු අතේ ඇති මුදල් සහ කෙටි කාලීන බොහෝ ද්‍රවශීල ආයෝජන වලින් සමන්විත වන අතර, ඒවා මුදල්වල ප්‍රකාශ වටිනාකමට පහසුවෙන් පරිවර්තනය කළ හැකි අතර, වටිනාකමේ වෙනස්වීම්වල සුළු අවදානමකට යටත් වේ. කෙටි කාලීන මුදල් බැඳීම් සපුරාලීමේ අරමුණින් මේවා පවත්වනු ලැබේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණ සඳහා, මුදල් සහ මුදල් සමාන දේ, අතැති මුදල් සහ බැංකුවල තැන්පතුවලින් සමන්විත වේ. කෙටි කල්පිරීමක් සහිත ආයෝජන ද මුදල් සමාන ලෙස සලකනු ලැබේ. ඒකාබද්ධ ශේෂ පත්‍රයේ, බැංකු අයිරා වත්මන් වගකීම්වල ණය ගැනීම් තුළ දක්වා ඇත.

8. ප්‍රතිපාදන

පෙර සිදුවීමක් හේතුවෙන් වර්තමානයේ අධිකාරිය සතුව වගකීමක් පවතින්නේ නම් (නෛතික හෝ සම්ප්‍රයුක්ත) ප්‍රතිපාදන හඳුනා ගනු ලැබේ. එය වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇති සම්පත් වල අලාභයක් අවශ්‍ය වේ යැයි පෙන්නුම් කරන අතර වගකීම් ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් සිදු කළ හැකිය. මුදල්වල කාල අගයේ බලපෑම ද්‍රව්‍යාත්මක නම්, පූර්ව බදු අනුපාතයකින් අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමෙන් ප්‍රතිපාදන තීරණය කරනු ලබයි. එය මුදල්වල කාල වටිනාකමෙහි වර්තමාන වෙළඳපල තක්සේරු කිරීම් සහ සුදුසු අවස්ථාවලදී වගකීම්වලට විශේෂිත වූ අවදානම් පිළිබිඹු කරනු ලබයි.

2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 7 (ඌ) වගන්තියට අනුව, ගුවන්යානා අනතුරු සහ සිද්ධීන් පිළිබඳ විමර්ශන ආරම්භ කිරීම සහ සෙවීමට සහ මුදාගැනීමේ කටයුතු සම්පාදනය කිරීමට කටයුතු කිරීමේ බලය, ක්‍රියාකාරිත්වය සහ වගකීම අධිකාරිය වෙත පවරා ඇත. 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ VI පරිච්ඡේදයේ, 53, 54 සහ 55 වගන්තිවල විධිවිධාන මගින් මෙය තවදුරටත් විස්තර කොට ඇත.

ශ්‍රී ලංකාව විශාල සාගර ගුවන් අවකාශයක් ඇති දිවයිනක් ලෙස සහ භූමිය සහ සාගර ගුවන් සීමාව හරහා පියාසර කරනු ලබන වර්ධනය වන ගුවන් පියාසැරි සංචලන සංඛ්‍යාව මෙන්ම, රට තුළට සහ ඉන් පිටත ක්‍රියාත්මක වන බැවින්, ගුවන්යානා අනතුරු විමර්ශන සහ සෙවීමට සහ ගලවා ගැනීමේ මෙහෙයුම්හි කාර්යයන් සපුරාලීම සඳහා ප්‍රමාණවත් සංවිත අරමුදලක් පවත්වා ගැනීමට, CAASL වෙත ඉතා වැදගත් වගකීමක් ඇත.

ගුවන්යානා අනතුරු විමර්ශන සහ සෙවීමට සහ ගලවා ගැනීමේ මෙහෙයුම් සඳහා රුපියල් මිලියන 50 ක මුදලක් සංවිත අරමුදලක් ලෙස වෙන් කිරීම සඳහා එවැනි සාකච්ඡා ලියකියවිලි (DP/May/2018/03 (w)) 2018 මැයි 30 වෙනි දින පවත්වනු ලබන 145 වෙනි CAASL මණ්ඩල රැස්වීමේදී ඉදිරිපත් කරන ලදී.

9. සේවක ප්‍රතිලාභ

9.1 නිර්වචිත දායකත්ව සැලසුම්

අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුකූලව, සේවක අර්ථසාධක අරමුදල (EPF) දායක මුදල් සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා සේවකයින් සුදුසුකම් ලබයි. අධිකාරිය විසින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදල, සේවකයින්ගේ දළ වැටුප්වල ස්ථාවර දායක මුදලට ගෙවන අතර, තවදුරටත් මුදල් ගෙවීමට නීතිමය හෝ සාධනීය බැඳීමක් නොමැත.

9.2 නිර්වචිත ප්‍රතිලාභ සැලසුම්

නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් යනු නිර්වචිත දායකත්ව සැලසුම හැරුණු කොට පවතින පශ්චාත් සේවා නියුක්ති සැලැසුම් ය. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනතට ප්‍රකාරව අධිකාරිය පාරිතෝෂික ගෙවීමට වගකීමෙන් බැඳේ. සේවයේ යෙදී සිටින වසර ගණනින් ගුණ කළ සම්පූර්ණ මාසික වැටුප මත, පනත යටතේ බැඳීම් සඳහා විධිවිධාන තීරණය කරනු ලබන අතර ගණනය කිරීම් LKAS 19 සූත්‍රය මත පදනම් වේ. සෑම වසරකම අවසානයේ පාරිතෝෂික ප්‍රතිපාදනවල වටිනාකම සඳහා වෙනම ආයෝජනයක් පවත්වාගෙන යනු ලැබේ.

9.3 කාර්ය මණ්ඩල සුභසාධන සහ සමාජ සුරැකුම් අරමුදල

රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගෙන සිවිල් ගුවන්සේවා අධිකාරිය සමඟ සම්බන්ධ වූ රාජ්‍ය සේවකයින්ට අදාළව 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 20 (5) වෙනි වගන්තිය යටතේ කාර්ය මණ්ඩල සුභසාධන සහ සමාජ සුරැකුම් අරමුදල සකස් කර ඇත. උපචිත පොලිය සමඟ විශ්‍රාම ලත් සෑම සේවකයෙකුගේම නමට පවතින වටිනාකම ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියෙන් විශ්‍රාම ගනු ලබන අවස්ථාවේදී ලබා දෙනු ලැබේ.

10. මූල්‍ය වගකීම්

10.1 මූලික හඳුනා ගැනීම සහ මිනුම්කරණය

LKAS 39 විෂය පථය තුළ මූල්‍ය වගකීම් සුදුසු පරිදි ලාභ හෝ අලාභ සහ ණය සහ ණය ගැනීම් හරහා සාධාරණ වටිනාකම මත මූල්‍ය වගකීමක් ලෙස වර්ගීකරණය කොට දක්වයි. අධිකාරිය විසින් මූලික හඳුනාගැනීම මත මූල්‍ය වගකීම් වර්ගීකරණය නිශ්චය කරනු ලැබේ. මූල්‍ය වගකීම් මූලිකව සාධාරණ වටිනාකම මත හඳුනා ගනු ලබන අතර, ණය සහ ණය ගැනීම්වල දී ක්‍රමක්ෂය පිරිවැය යටතේ දක්වනු ලැබේ.

11. වෙනත් වගකීම්

වෙනත් වගකීම් සඳහා උපචිත වියදම් ඇතුළුව වෙනත් ණය හිමියන් ඇතුළත් වේ. එහි සාධාරණ වටිනාකම ලෙස සලකනු ලබන මේවා ඒවායේ ඓතිහාසික අගය මත සඳහන් කරනු ලැබේ.

12. ආදායම් හඳුනාගැනීම

12.1 2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 12 වෙනි පරිච්ඡේදය ප්‍රකාරව, අධිකාරිය සතුව එයට අයත් අරමුදල් සහ 12(2) වෙනි පරිච්ඡේදය යටතේ අධිකාරිය වෙත ලැබෙන සියලු මුදල් පැවතිය හැකිය. 12(2) වෙනි පරිච්ඡේදය මූල්‍ය ප්‍රකාශන යටතේ ලැබෙන මුදල් SLFRS 15 සමඟ ඉදිරිපත් කරනු ලබන කාරණා අනුකූල වීමට මූල්‍ය ප්‍රකාශයේ ආදායම් යටතේ වර්ගීකරණය කොට ඇත.

12.2 ආදායම් මාර්ග

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පහත මූලාශ්‍ර මඟින් ආදායම උපයනු ලැබේ.

මෙහෙයුම් ආදායම

- ✈ එතෙර විකුණුම් අධිහාරය

- අපගමන බදු වෙතින් සේවා ගාස්තු
- නියාමන සේවා (රක්ෂණ/බලපත්‍ර අලුත් කිරීම/සහතික පත්/ විභාග අනුමැතිය සහ පැවැත්වීම)

මෙහෙයුම් නොවන ආදායම

- වෙනත් ආදායම්
- පොලී ආදායම් (කාර්ය මණ්ඩල ණය සහ මූල්‍ය උපකරණ)

එතෙර විකුණුම් අධිභාරය/ අපගමන බදු වෙතින් සේවා ගාස්තු/ නියාමන සේවා අදාළ සේවා ලබා දුන් කාල සීමාවල සාධාරණ වටිනාකම්න් හඳුනා ගනු ලැබේ. උපචිත පදනමක් මත මෙම සියලුම ආදායම් හඳුනා ගැනේ.

12.3 පොලී ආදායම

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ වටිනාකම්න් මනිනු ලබන මූල්‍ය උපකරණ ඇතුළු පොලී දරන මූල්‍ය උපකරණ සියල්ල සඳහා පොලී ආදායම, ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිත කරමින් ආදායම් ප්‍රකාශයේ 'ආයෝජන ආදායම්' තුළ හඳුනා ගැනේ. ලැබිය යුතු දෑ හානිකරණ වන විට අධිකාරිය විසින් උපකරණවල මුල් ඵලදායී පොල අනුපාතයට අපේක්ෂිත ඉදිරි මූල්‍ය ප්‍රවාහ වට්ටම් කිරීම හේතුවෙන් එහි ආපසු ලබා ගත හැකි වටිනාකමට ධාරණ වටිනාකම අඩු කරනු ලබන අතර එම වට්ටම් පොලී ආදායමක් ලෙස දිගටම පවත්වා ගෙන යනු ලබයි.

12.4 වෙනත් ආදායම්

වෙනත් අදායම් උපචිත පදනමින් හඳුනා ගැනේ.

13. වියදම් හඳුනා ගැනීම

සියලු වියදම්, විමර්ශනයේ සාධාරණ වටිනාකම මත ගණනය කරනු ලබන අතර, එම වියදම්වලට සම්බන්ධ කාල සීමාව තුළ හඳුනා ගැනේ.

වත්කම්වල දක්වා ඇති ඉදිරි ආර්ථික ප්‍රතිලාභවල ප්‍රයෝජනවත් ආයු කාලය හෝ පරිභෝජන රටාවේ අපේක්ෂිතයන්හි වෙනස්කම් ක්ෂයවීමේ කාල සීමාව වෙනස් කිරීම මඟින් ගණනය කරනු ලබන අතර ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස සලකනු ලැබේ.

14. ණය ගැනීමේ පිරිවැය

අරමුදල් ගැනීමට සම්බන්ධව අධිකාරිය විසින් දරන ලද පොලී සහ වෙනත් පිරිවැය, ණය ගැනීමේ පිරිවැය වේ. ණය ගැනීමේ පිරිවැය එය දරන ලද කාලය සීමාවේ දී වියදම්වල හඳුනා ගැනේ.

15. ප්‍රවර්තන සහ විලම්බිත ආදායම් බදු

15.1 කාලපරිච්ඡේදයකට බදු වියදම්, ප්‍රවර්තන සහ විලම්බිත බදු වලින් සැකසී ඇත. වෙනත් විස්තීරණ ආදායම් හෝ සෘජුවම හිමිකම්වල හඳුනා ගැනෙන අයිතමයන්ට අදාළ වන ප්‍රමාණයක් හැරුණු කොට බදු ආදායම් ප්‍රකාශයේ දී හඳුනා ගැනේ. මෙම අවස්ථාවේ දී බදු ද පිළිවෙළින් වෙනත් විස්තීරණ ආදායම් හෝ සෘජුවම හිමිකම්වල හඳුනා ගැනේ.

විලම්බිත ආදායම් බදු වගකීම් ක්‍රමය යොදා ගනිමින් මූල්‍ය ප්‍රකාශවල වත්කම් සහ වගකීම් මත බදු සහ එහි ධාරණ වටිනාකම (Carrying Value) අතර ඇතිවන තාවකාලික වෙනස්කම් මත හඳුනා ගැනේ. කෙසේ වෙතත් ගනුදෙනුව සිදු වන අවස්ථාවේ ගිණුම් හෝ බදු අය කළ හැකි ලාභයට බලපාන ව්‍යාපාර සමායෝජන හැර විලම්බිත ආදායම් බදු ගනුදෙනුවක වත්කම් සහ වගකීම් හඳුනාගන්නා මුල් අවස්ථාවේ ඇති වන්නේ නම් එය අඟය කරනු නොලැබේ. වාර්තා කරන දිනයේ අවසානයට නිරූපණය කරන ලද හෝ ප්‍රායෝගිකව නිරූපණය කරන ලද බදු පොලී (සහ නීති) භාවිත කිරීම පාලනය කරනු ලබන අතර, අදාළ විලම්බිත ආදායම් බදු වත්කම් හඳුනා ගන්නා ලද හොත් හෝ විලම්බිත ආදායම් බදු වගකීම් පියවනු ලැබුවහොත් විලම්බිත ආදායම් බදු යොදා ගනු ලැබේ.

තාවකාලික වෙනස්කම් භාවිත කළ හැකි දෑට එදිරිව ඉදිරි බදු අය කළ හැකි ලාභවල පවතින ප්‍රමාණයට විලම්බිත ආදායම් බදු හඳුනා ගැනේ.

අධිකාරිය විසින් තාවකාලික වෙනස්කම්හි ප්‍රත්‍යාවර්තනවල කාල නිශ්චය පාලනය කරන විට අවස්ථාවන් හැර අනුබද්ධිත සහ සම්බන්ධිතයන්හි ආයෝජනවල හටගන්නා තාවකාලික වෙනස්කම් මත විලම්බිත ආදායම් බදු සපයනු ලබන අතර ඉදිරි පුරෝකථනවල තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය නොකරන බව පැහැදිලිය.

ප්‍රවර්තන බදු වත්කම්වලට එදිරිව ප්‍රවර්තන බදු වගකීම් හිලව් කිරීම බලාත්මක කිරීමට නීත්‍යානුකූල අයිතියක් ඇතිවිට සහ ශුද්ධ පදනම මත පියවීමට අදහසක් ඇති විට, බදු අය කළ හැකි ආයතනය හෝ විවිධ බදු අය කළ හැකි ආයතන මත එම බදු අය කළ හැකි අධිකාරිය මඟින් අයකරන ආදායම් බදුවලට විලම්බිත ආදායම් බදු වත්කම් සහ වගකීම් අදාළ වන විට විලම්බිත ආදායම් බදු වත්කම් සහ වගකීම් හිලව් කරනු ලැබේ.

ඉදිරියට ගෙන යන භාවිත නොකළ අලාභ හෝ භාවිත නොකළ බදු වැයෙහි බදු බලපෑම, මෙම අලාභයන් භාවිත කළ හැකි දේට එදිරිව ඉදිරි බදු අය කළ හැකි ලාභයන් පවතින්නේ නම් වත්කමක් ලෙස හඳුනා ගැනේ.

15.2 විලම්බිත බදු වත්කම් සහ වගකීම් වෙත විශ්ලේෂණය

	2022	2021
ආරම්භක ශේෂය	21,668,927	24,883,458
පරිතෝෂ සඳහා ප්‍රතිපාදන වෙතින්	3,124,000	2,004,206
	23,164,109	(5,218,737)
වැඩි වූ බදු ක්ෂය වීම වෙතින්	47,957,036	21,668,927
ශුද්ධ විලම්බිත බදු වගකීම්		

2018 වසරට පෙර ගිණුම් සඳහා පරිතෝෂ ප්‍රතිපාදන සඳහා විලම්බිත ආදායම් බදු වගකීම් හඳුනා ගනු නොලැබේ.

15.3 බදු වියදම් සහ ව්‍යවස්ථාපිත බදු අනුපාතයෙන් ගුණ කරන ලද ගිණුම්කරණවල ලාභය අතර සන් සන්දනය පහත පරිදි වේ

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	2022 (රු.)	2021 (රු.)
ආදායම් බදු වියදම්වලට පෙර ලාභය ගිණුම් තැබීම	3,387,758,674	420,599,959
අඩු: වෙනත් සම්පත් වෙතින් ආදායම සහ විවර්ජන ආදායම	(677,754,961)	257,499,747
	2,710,003,713	163,100,213
අඩු කළ නොහැකි වියදම්	165,819,885	157,048,889
ව්‍යාපාර වෙතින් ව්‍යවස්ථාපිත ආදායම	2,875,823,598	320,149,102
අඩු: බදු විවර්ජන ලාභය	(1,000,000,000)	(50,000,000)
බදු ගෙවිය යුතු ආදායම- ව්‍යාපාරික ආදායම	1,875,823,598	270,149,101
බදු ගෙවිය යුතු ආදායම- ව්‍යාපාරික නොවන ආදායම	541,714,111	121,167,983
මුළු බදු ගෙවිය යුතු ආදායම	2,417,537,709	391,317,084
ආදායම් බදු වියදම්		
බදු අය කළ හැකි ආදායම - ව්‍යාපාර සහ ව්‍යාපාර නොවන ආදායම 24% සහ 30%	618,309,763	93,916,100
ආදායම් බදු වියදම්	618,309,763	93,916,100

16. විදේශීය මුදල් පරිවර්තනය/ගනුදෙනු

ක්‍රියාකාරී මුදල් හැරුණු කොට ව්‍යවහාර මුදල්වල සියලු ගනුදෙනු, ගනුදෙනු කරන අවස්ථාවේ පැවති විනිමය අනුපාතිකය යොදා ගනිමින් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත. සෑම මූල්‍ය තත්ව ප්‍රකාශයකම දිනයට, විදේශීය මුදලකින් දක්වා ඇති මූල්‍ය වත්කම් සහ වගකීම් වාර්තා කරන ලද දිනයට පවතින විනිමය අනුපාතිකයට සමාන ශ්‍රී ලංකා රුපියල් වෙත පරිවර්තනය කරනු ලැබේ. විදේශීය මුදලකින් දක්වා ඇති මූල්‍ය නොවන වත්කම් වාර්තා කරන ලද දිනයට පවතින විනිමය අනුපාතිකයට සමාන ශ්‍රී ලංකා රුපියල් වෙත පරිවර්තනය කරනු ලැබේ. මූල්‍ය අයිතම පියවීමේ දී ඇති වන විනිමය වෙනස්කම් සහ මූල්‍ය අයිතම නැවත පරිවර්තනය එය ඇති වූ වර්ෂයේ දී ආදයම් ප්‍රකාශයෙන් හඳුනා ගනේ.

විදේශ මුදල් ගනුදෙනුවලට අදාළ විදේශ විනිමය ලාභ සහ අලාභ 'මූල්‍ය ආදායම හෝ පිරිවැයී යටතේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ දක්වා ඇත.

17. අයවැය ලේඛනයට පසු සිදුවීම්

අධ්‍යක්ෂ මණ්ඩලය සිදුවීම් ඉතා හොඳින් නිරීක්ෂණය කරනු ලබන අතර අදාළ පරිදි ද්‍රව්‍යාත්මක පශ්චාත් අයවැය ලේඛනය සම්බන්ධයෙන් වත්මන් මූල්‍ය ප්‍රකාශයේ අවශ්‍ය පරිදි වෙනස්කම් හෝ අනාවරණය කිරීම් සිදු කරනු ලබයි.

18. අවිනිශ්චිත වගකීම්

පෙර සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස අනාගතයේ වගකීමක් පවතී නම් හෝ පෙර සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වර්තමානයේ වගකීමක් පවතී නම් හෝ නමුදු සසම්භාවී නොවන හෝ ප්‍රමාණයක් නොදක්වන ගාස්තුව සාධාරණ ලෙස තක්සේරු කිරීමට නොහැකි නම් අවිනිශ්චිත වගකීම් අනාවරණය කරනු ලැබේ.

19. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශ මත LKAS 7 වෙත අනුකූලව වක්‍ර ක්‍රමයක් භාවිත කොට මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සකස් කරනු ලැබේ. මූල්‍ය නොවන ස්වාභාවය, ඕනෑම විලම්බිතයක් හෝ පෙර හෝ ඉදිරි මූල්‍ය ආදායමක් ක්‍රියාත්මක කිරීමේ උපචිත හෝ ආයෝජන හෝ මූල්‍ය ගලන මුදල් යෙදවීම සමඟ ආදාළ ආදයම් හෝ වියදම් අයිතමයක ගනුදෙනු බලාත්මකව ලාභ හෝ අලාභ වෙනස් කර ඇති බව වක්‍ර ක්‍රමය අනාවරණය කරනු ලබයි.

20. රජයේ ප්‍රදාන

ලැබීමක් පවතින බවට හෝ අධිකාරිය වෙත පවරා ඇති බවට සාධාරණ සහතිකයක් ඇති විට සාධරණ වටිනාකම ඔස්සේ රජයේ ප්‍රදාන හඳුනා ගනේ.

රජයේ ප්‍රදානයන්හි වටිනාකම අධිකාරිය නිර්මාණය කරන අවස්ථාවේ සිවිල් ගුවන්සේවා දෙපාර්තමේන්තුව වෙත පවරන ලද වත්කම් සහ වත්කම් සමුච්චිත ක්ෂයයෙන් අඩු කිරීමෙන් පෙන්නුම් කරනු ලබයි.

රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය

ක්‍රමක්ෂය සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ දේපළ, පිරියත සහ උපකරණ හි පිරිවැය/අගය තක්සේරු කිරීම මත (ශේෂ වටිනාකමේ පිරිවැය/වත්කමේ අගය තක්සේරු කිරීම 10%ට අඩු) සරල රේඛීය පදනමක් මතය. රජයේ ප්‍රදානවලට එදිරිව, අනුරූප ගිණුමක් ලෙස ගිණුම් කරන ලද භූමිය හැරුණු කොට සියලු දේපළ, පිරියත සහ උපකරණ ප්‍රයෝජනවත් ආයු කාලය මත පහත ප්‍රතිශතයන්ට වාර්ෂිකව ක්‍රමක්ෂය වී ඇත.

ගොඩනැගිලි	6 2/3%
රථ වාහන	12.5 %
දේපළ, පිරියත සහ උපකරණ	25 %
ලී භාණ්ඩ සහ සවිකිරීම්	25 %
වෙනත් ස්ථිර වත්කම්	25 %

21. ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සහ සම්බන්ධිත පාර්ශ්ව සමඟ ගනුදෙනු

21.1 ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සමඟ ගනුදෙනු

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS 24) අනුව ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩල සම්බන්ධිත පාර්ශ්ව අනාවරණය කිරීම යනු, අධිකාරියේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, මඟ පෙන්වීම, පාලනය සඳහා බලය සහ වගකීම ඇති පිරිස වේ. ඒ අනුව අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය, අධිකාරියේ ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය ලෙස වර්ගීකරණය කොට ඇත. ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය වෙත සිදු කරන ලද හානිපූරණ පහත පරිදි වේ.

	2022	2021
	(රු.)	(රු.)
කෙටි කාලීන සේවක ප්‍රතිලාභ	3,987,858.78	3,729,000
පශ්චාත් රැකියා ප්‍රතිලාභ	-	-
වෙනත් දිගු කාලීන ප්‍රතිලාභ	-	-
රැකියා සමාප්ති කිරීමේ ප්‍රතිලාභ	-	-

21.2 **සම්බන්ධිත පාර්ශ්ව සමඟ ගනුදෙනු**

සිවිල් ගුවන්සේවා අධිකාරිය ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස, සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමඟ පහත සඳහන් පරිදි සැලකිය යුතු මට්ටමින් ගනුදෙනු සිදු කර ඇත.

ආයතනයේ නම	සම්බන්ධතාවය	ගනුදෙනුවේ ස්වභාවය	2022 (රු.)	2021 (රු.)
			(රු.)	(රු.)
සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස්	රජය සතු	එතෙර විකුණුම් අධිභාරය	1,155,774,055	298,751,714
ලංකා විදුලිබල මණ්ඩලය	රජය සතු	විදුලි ගාස්තු	16,315,556	15,042,565
සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (පෞද්ගලික) සමාගම	රජය සතු	විදුලි ගාස්තු	1,614,816	1,469,058
ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලය	රජය සතු	ජල ගාස්තු	138,270	214,573
සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (පෞද්ගලික) සමාගම	රජය සතු	ජල ගාස්තු	935,182	555,555
මහා භාණ්ඩාගාරය	රජය සතු	අපගමන බදු ගෙවීම්	22,248,864,840	3,350,052,053
සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (පෞද්ගලික) සමාගම	රජය සතු	අපගමන බදු ගෙවීම්	4,770,744,713	725,849,651
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	රජය සතු	අපගමන බදු ගෙවීම්	2,385,327,870	362,924,826
සේවක නියුක්ති භාරකාර අරමුදල් මණ්ඩලය	රජය සතු	සේවක නියුක්ති භාරකාර අරමුදල	9,297,357	7,272,812
සේවක අර්ථසාධක අරමුදල	රජය සතු	සේවක අර්ථසාධක අරමුදල	46,486,769	36,364,062
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	රජය සතු	ආදායම් බදු	309,550,100	39,772,423
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	රජය සතු	මුද්දර බදු	1,551,975	1,139,309
ශ්‍රී ලංකා ටෙලිකොම්	රජය සතු	විදුලි සන්දේශ ගාස්තු	7,016,072	5,207,707
ශ්‍රී ලංකා ගුවන් හමුදාව	රජය සතු	ඉන්ධන ගාස්තු	262,998	576,532
සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (පෞද්ගලික) සමාගම	රජය සතු	ඉන්ධන ගාස්තු	10,032,241	3,963,813
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	රජය සතු	රක්ෂණ ගාස්තු	1,193,830	1,189,717
ලංකා බැංකුව	රජය සතු	ආයෝජන	2,070,348,167	1,734,764,065
මහජන බැංකුව	රජය සතු	ආයෝජන	73,000,000	932,700,000
සීමාසහිත ශ්‍රී ලංකන් කේටරින් (පෞද්ගලික) සමාගම	රජය සතු	රැස්වීම් සහ පුහුණු කිරීම් සඳහා ආහාර සැපයුම් සේවා	1,707,459	28,066
මාර්ග සංවර්ධන අධිකාරිය	රජය සතු	අධිවේගී මාර්ගයේ අය කිරීම්	1,629,096	2,013,326
ලැබිය යුතු දෑ				
සීමාසහිත ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් සමාගම	රජය සතු	එතෙර විකුණුම් අධිභාරය	53,590,915	38,998,442
ගෙවිය යුතු දෑ				
මහා භාණ්ඩාගාරය	රජය සතු	අපගමන බදු ගෙවීම්	2,932,292,550	446,562,373
සීමාසහිත ගුවන්තොටුපළ සහ ගුවන්සේවා (පෞද්ගලික) සමාගම	රජය සතු	අපගමන බදු ගෙවීම්	787,638,087	96,755,181
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	රජය සතු	අපගමන බදු ගෙවීම්	393,819,043	48,377,590

ප්‍රමාණය හේතුවෙන් සහ සියලු ගනුදෙනු අත් කර ගැනීම සහ අනාවරණය ප්‍රායෝගික නොවන හෙයින්, LKAS 24 - 'අදාළ පාර්ශ්ව හෙළිදරව් කිරීම්' ප්‍රකාරව, වෙන් වශයෙන් වැදගත් වන සියලුම රාජ්‍ය/ආදාළ ආයතන සමඟ සිදු කරන ලද ගනුදෙනු සඳහා සීමාසහිත හෙළිදරව් කිරීම් සිදු කර ඇත.

ශ්‍රී ලංකා රජය විසින් පාලනය කරනු ලබන ආයතනවල සිට / දක්වා ශේෂයන් මූල්‍ය තත්වය ප්‍රකාශයේ වෙළඳ ලැබිය යුතු, වෙළඳාම සහ අනෙකුත් ගෙවිය යුතු දේ යටතේ දක්වා ඇත.

22. මූල්‍ය අවදානම්

කළමනාකරණය ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය යනු ව්‍යවස්ථාපිත මණ්ඩලයකි. මෙම අධිකාරියේ ප්‍රධාන කාර්යභාරය වනුයේ සිවිල් ගුවන්සේවා කර්මාන්තයට නියාමන සේවා සැපයීමයි. කොටස්, ණයකර සහ ණය ආදී මූල්‍ය උපකරණ සමඟ අධිකාරිය ආයෝජන සිදු කර නොමැත. අධිකාරිය එහි මූල්‍ය උපකරණ භාවිතයෙන් පහත දැක්වෙන අවදානම් කෙරෙහි අවම නිරාවරණය වීමක් වේ.

- ණය අවදානම
- ද්‍රවශීලිතා අවදානම

22.1 ණය අවදානම

ණය අවදානම යනු කිසියම් ගනුදෙනුකරුවෙකු ගිවිසුම් බැඳීම සපුරාලීමට අසමත් වුවහොත් අධිකාරිය වෙත ඇති වන මූල්‍ය අලාභය පිළිබඳ අවදානමයි. එය අභ්‍යන්තර සහ බාහිර පාර්ශවයන්ගෙන් අය විය යුතු දෑ මඟින් මූලිකව ඇති වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

ආයෝජන

රජයේ භාණ්ඩාගාරික බිල්පත්වල පමණක් ආයෝජනය කිරීම තුළින් අධිකාරිය ණය අවදානම් සඳහා නිරාවරණය වීම අවම කරනු ලබන අතර කෙටි කාලීන තැන්පතු CAASL නිල බැංකුකරු වන ලංකා බැංකුව සමඟ පමණක් සිදු කරනු ලබයි.

කාර්ය මණ්ඩල ණය

සේවකයාගේ මාසික වැටුපෙන් ණය ශේෂය අය කර ගැනීම හෝ සේවකයා පැහැර හැරියොත් වැනි වටිනාකමක් ඇපකරුගෙන් අය කිරීම සහතික කරමින් අධිකාරිය ණය අවදානම් සඳහා නිරාවරණය වීම අවම කරනු ලබයි.

22.2 ද්‍රවශීලිතා අවදානම

ද්‍රවශීලිතා අවදානම යනු ගෙවිය යුතු මූල්‍ය වගකීම් අධිකාරිය විසින් ගෙවීමට නොහැකි වීමේ අවදානමයි. දැරිය නොහැකි අලාභ හෝ අධිකාරියේ කීර්තියට හානි නොවන ආකාරයෙන්, ගෙවිය යුතු දෑ සාමාන්‍ය සහ අනපේක්ෂිත තත්වයේ පසුවන විට එහි වගකීම් සපුරාලීමට ප්‍රමාණවත් මුදලක් පවතින බව හැකි තරම් සහතික කරලීම ද්‍රවශීලිතා කළමනාකරණය මඟින් අධිකාරිය අපේක්ෂා කරනු ලබයි.

රුපියල් මිලියන 5 ට අමතරව කෙටි, මධ්‍ය සහ දිගු කාලීන මූල්‍ය උපකරණ මඟින් අධිකාරිය විසින් පවත්වා ගෙන යනු ලබන ආයෝජන අතිරික්ත මුදල් මඟින් ද්‍රවශීලිතාව පවත්වා ගෙන යන බවට සහතික කරනු ලබයි. මූල්‍ය ප්‍රවාහ පුරෝකථනය මූල්‍ය සහ ආදායම් කළමනාකරණ අංශය මඟින් සිදු කරනු ලබයි. මෙහෙයුම් අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් මුදල් ඇති බවට සහතික කිරීමට මූල්‍ය සහ ආදායම් කළමනාකරණ අංශය විසින් අධිකාරියේ ද්‍රවශීලිතා අවශ්‍යතාවන්හි ක්‍රමවත් පුරෝකථන අධීක්ෂණය කරනු ලබයි.

23. ආදායම

	2022	2021
	රු.	රු.
මෙහෙයුම් ආදායම	**3,685,224,914**	993,344,282
මෙහෙයුම් නොවන ආදායම	**549,162,285**	122,561,616
වෙනත් මෙහෙයුම් නොවන ආදායම	**33,915,474**	12,343,808
මුළු ආදායම	**4,268,302,673**	1,128,249,706
මෙහෙයුම් ආදායම		
විදේශීය විකුණුම් අධිභාරය	**3"376"434"208**	892"315"495
අපගමන බද්දෙහි සේවා ගාස්තුව	**227"543"076**	33"339"951
නියාමන සේවා වෙතින් ලද ආදායම	**81"247"630**	67"688"837
	3,685,224,914	993,344,282
මෙහෙයුම් නොවන ආදායම		
කුලී ආදායම	**-**	170,250
සංචාරක බංගලාව වෙන් කරවා ගැනීම	**214,360**	168,565
ටෙන්ඩර් අයදුම්කිරීමේ ගාස්තු	**31,500**	102,000
ශතක ගුවන්සේවා ග්‍රන්ථය අලෙවිය	**2,160**	17,460
විවිධ ආදායම්	**6,933,154**	808,609
පරිපාලන ගාස්තු / සිසුන් සඳහා වීසා නිර්දේශ	**267,000**	297,000
කාර්ය මණ්ඩල ණය වෙතින් ලද පොලී	**5,316,369**	5,010,996
භාණ්ඩාගාර බිල්පත් මත ආයෝජනයෙන් ලද පොලී	**221,025,270**	57,859,211
රක්ෂණ තැන්පතුවල ආයෝජනය කිරීමෙන් ලද පොලී	**257,889,819**	51,236,717
අනෙකුත් ආයෝජනවලින් ලද පොලී	**57,482,654**	6,890,808
	549,162,285	122,561,616
අනෙකුත් මෙහෙයුම් ආදායම්		
කාර්ය මණ්ඩල ණය වෙතින් ලද පොලී ආදායම (IFRS ගැළපුම්)	**30,206,157**	8,124,446
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම	**3,709,152**	4,219,362
විදේශ මුදල් ගනුදෙනු මත විනිමය ලාභය	**165**	-
	33,915,474	12,343,808
සම්පූර්ණ මෙහෙයුම් නොවන ආදායම	**583,077,759**	134,905,424
මුළු ආදායම	**4,268,302,673**	1,128,249,706

මුදල් වෙළෙඳපොළේ සෑම දිනකම අවසානයේ බැංකුවේ මුදල් ශේෂය එක් දිනක් ඇතුළත ආයෝජනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව CAASL විසින් ලංකා බැංකුවේ කටුනායක ශාඛාවේ සහ මහජන බැංකුවේ සීදුව ශාඛාවේ අරමුදල් කළමනාකරණ ගිණුම් විවෘත කර ඇත. මෙම කෙටි කාලීන ආයෝජන හරහා උපයන පොලී ආදායම වෙනත් ආයෝජනවලින් ලැබෙන පොලිය යටතේ දක්වා ඇත.

24. කාර්ය මණ්ඩල වියදම්

	2022	2021
	රු.	රු.
වැටුප් සහ වේතන	**124,696,647**	125,401,269
වෙනත් දීමනා	**180,128,106**	128,662,464
සේවක අර්ථසාධක අරමුදල	**46,507,826**	38,243,060
සේවක භාරකාර අරමුදල	**9,301,568**	7,648,612
ප්‍රයෝජනයට නොගත් නිවාඩු සඳහා මුදල් ගෙවීම	**7,501,654**	4,493,967
ප්‍රසාද දීමනා	**9,690,863**	4,723,380
අතිකාල සහ නිවාඩු ගෙවීම්	**7,197,885**	8,527,388
සුභසාධන වියදම්	**30,483,367**	22,579,351
පාරිතෝෂික	**12,250,981**	8,350,858
ණය ප්‍රතිලාභ සඳහා වන කාර්ය මණ්ඩල පිරිවැය - (IFRSj ගැළපුම්)	**30,206,157**	8,124,446
මුළු කාර්ය මණ්ඩල වියදම්	**457,965,055**	356,754,794

25. රැස්වීම්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා වියදම්

	2022	2021
	රු.	රු.
රැස්වීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු සඳහා වියදම් - දේශීය	**274,870**	10,570
රැස්වීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු සඳහා වියදම් - විදේශීය	**1,992,788**	2,281,466
COSCAP කමිටු රැස්වීම් වියදම්	**5,240,150**	-
රැස්වීම්, සම්මන්ත්‍රණ, වැඩමුළු සඳහා මුළු වියදම්	**7,507,808**	2,292,036

26. පුහුණු වියදම්

	2022	2021
	රු.	රු.
පුහුණු වියදම් - දේශීය	**1,316,568**	4,332,220
පුහුණු වියදම් - විදේශීය	**157,722**	285,402
මුළු පුහුණු වියදම්	**1,474,290**	4,617,621
පුහුණු වියදම් - දේශීය	**1,316,568**	4,332,220

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

27. පරිපාලන සහ වෙනත් වියදම්

	2022	2021
	රු.	රු.
පරීක්ෂණ	**1,348,751**	1,233,341
සේවා ස්ථානයෙන් පිටත රැස්වීම්	**55,595**	64,450
සේවා ස්ථානය තුළ රැස්වීම්	**488,386**	212,694
ප්‍රවාහන වියදම් - දේශීය	**1,629,096**	2,014,826
උපදේශන සහ නෛතික ගාස්තු	**249,344**	29,943
බාහිර තාක්ෂණික සහය	**25,216,200**	19,854,000
අනුකූලතා කළමනාකරණ පිරිවැය	**-**	2,262,500
සම්මුඛ පරීක්ෂණ / කාර්ය මණ්ඩල ඇඟයීම්	**33,545**	169,878
මණ්ඩල ගෙවීම්	**760,500**	1,036,000
දේපළ, පිරියත සහ උපකරණ නඩත්තු කිරීම	**2,763,805**	1,329,944
ලිපි ද්‍රව්‍ය සහ පරිභෝජන වියදම්	**14,662,702**	11,888,900
අභ්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධනය	**209,118**	86,026
වෙනත් සැපයුම්	**1,280,921**	1,645,267
විදුලි සංදේශ	**11,790,472**	10,129,214
තැපැල් ගාස්තු	**412,868**	244,531
ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය වෙත දක්වන ලද දායකත්වයන්	**72,653,816**	29,967,465
ප්‍රකාශනය සහ ප්‍රචාරණය සඳහා දායක මුදල්	**2,033,391**	3,690,250
විභාග ගාස්තු	**1,655,285**	619,280
මුද්‍රණ වියදම්	**5,846,738**	5,440,802
බැංකු ගාස්තු	**-**	895
කල්බදු වගකීම් සඳහා වන මූල්‍ය පිරිවැය	**4,296**	2,946
විගණන ගාස්තු	**881,200**	435,400
වත්කම් බැහැර කිරීම මත අලාභය	**3,550**	243,984
පරිවර්තන සහ ටයිප් කිරීම සඳහා වියදම්	**84,398**	53,825
සුභසාධන උපයෝගිතා - ක්‍රීඩා	**64,445**	-
විවිධ වියදම්	**22,675**	10,175
ඉන්ධන සහ ලිහිසි තෙල්	**11,004,059**	5,216,960
රථවාහන නඩත්තු කිරීම	**11,611,738**	10,148,633
බදු කුලී සහ කුලී ගාස්තු	**15,851,355**	19,119,750
පොදු - සුබසාධන	**10,442,710**	3,496,412
කාර්යාල ගොඩනැගිල්ල සහ නිල නිවාස සඳහා වියදම්		
විදුලිය	**17,716,285**	16,487,917
ජලය	**1,650,734**	1,311,541
ආරක්ෂාව	**9,997,320**	9,927,530
සහිපාරක්ෂාව	**10,993,835**	10,087,450
වෙනත් නඩත්තු කිරීම්	**14,284,852**	15,958,799
කළමනාකරණ සේවා	**3,026,755**	2,376,000
ගුවන්සේවා සංවර්ධනය	**1,203,617**	4,782,448
තොරතුරු තාක්ෂණ නඩත්තු කිරීම්	**8,952,010**	3,930,240
මුළු පරිපාලන සහ වෙනත් වියදම්	**260,886,367**	195,510,215

28. ආදායම් බදු වියදම්

දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් බදු වියදම්වල ප්‍රධාන සංරචක පහත පරිදි වේ;

	2022	2021
	රු.	රු.
ආදායම් බදු	-	-
වත්මන් බදු ගාස්තු		
ආදායම් බදු වියදම්	**618,309,763**	93,916,100
විලම්බිත බදු		
විලම්බිත බදු සම්බන්ධයෙන් අයකිරීම/ (ආපසු හැරවීම) (සටහන 39)	**26,205,237**	(3,214,531)
මුළු බදු වියදම්	**644,515,000**	90,701,569

පහත සඳහන් පරිදි අධිකාරියේ ලාභයට අදාළ මූලික බදු අනුපාතය (24%) සහ 30% භාවිතයෙන් පැන නගින සංද්ධාන්තික ප්‍රමාණයට වඩා බද්දට පෙර අධිකාරියේ ලාභය මත බද්ද වෙනස් වේ;

	2022	2021
	රු.	රු.
බද්දට පෙර ලාභය	**3,387,758,674**	420,599,959
24% සහ 30% ක සඵල අනුපාතයකින් ගණනය කරන ලද බද්ද	**863,878,462**	100,943,990
බදු සඳහා අඩු කළ නොහැකි වියදම් මත බද්ද	**182,258,816**	66,772,049
බදුවලට යටත් නොවන ආදායම මත බදු බලපෑම		
බදු සඳහා අඩු කළ හැකි වියදම් / ආදායම මත බලපෑම	**(427,827,515)**	(73,799,939)
විලම්බිත ආදායම් බදු වත්කමක් හඳුනා නොගත් බදු අලාභ	**26,205,237**	(3,214,531)
මුළු බදු වියදම්	**644,515,000**	90,701,569

29. දේපළ, පිරියත සහ උපකරණ

i. මහා භාණ්ඩාගාරය/රජය විසින් පවරා ඇති දේපළ, පිරියත සහ උපකරණ වත්කම් හි ලදු පතෙහි දක්වා ඇති දිනයට, සාධාරණ වටිනාකමෙහි දක්වා ඇත. (තක්සේරුකරණය 2003 වසරේ දී සිදු කරන ලදී.) IFRS පරිවර්තන කාර්යන් සඳහා ඉහත සඳහන් කරන ලද වත්කම් හි ප්‍රත්‍යාගණන වටිනාකම 2011 ජනවාරි 1 දිනට සැලකෙන පිරිවැය ලෙස සලකනු ලැබේ.

ii. අධිකාරිය 2021.12.31 වන විට සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වත්කම් නැවත තක්සේරු කර ඇත. අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුව විසින් නිර්දේශ කර ඇති පරිදි අභ්‍යන්තරව පත් කරන ලද කමිටුවක් මගින් ඇගයීම සිදු කර ඇත. ශේෂ වත්කම් 2023 වර්ෂය තුළ නැවත තක්සේරු කෙරේ.

අධිකාරිය සතු සම්පූර්ණ ක්ෂය වූ වත්කම්වල වෙළඳපල වටිනාකම හෙළි කිරීම සඳහා මෙම තක්සේරුව සිදු කරන ලදී. සාධාරණ වටිනාකම තීරණය වන්නේ සමාන දේපල සඳහා ගණුදෙණු මිල පිළිබඳ වෙළඳපල පදනම් වූ සාක්ෂි වෙත යොමු වීමෙනි. තක්සේරු කිරීම් විවෘත වෙලඳපොල මිල මත පදනම් වන අතර, දේපලෙහි ස්වභාවය, ස්ථානය හෝ තත්වයේ ඕනෑම වෙනසක් සඳහා සකස් කර ඇත. සාධාරණ අගය මැනීමට ප්‍රමාණවත් දත්ත පවතින අවස්ථා වලදී, අදාළ නිරීක්ෂණය කළ හැකි යෙදවුම් උපරිම ලෙස භාවිතා කිරීම සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කිරීම සඳහා මෙම තක්සේරු ක්‍රම සුදුසු වේ. සාධාරණ වටිනාකමේ වෙනස්වීම් වෙනත් විස්තීර්ණ ආදායම් සහ කොටස් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත. වටිනාකම්කරු විසින් දේපලෙහි ස්වභාවය මත පදනම්ව ලබා ගත හැකි සංසන්දනාත්මක වෙළඳපල දත්ත හිඟ වූ විට වෙළඳපල වටිනාකම් සහ වට්ටම් සහිත මුදල් ප්‍රවාහ ක්‍රම වැනි තක්සේරු ක්‍රම භාවිතා කර ඇත.

iii. වර්ෂය තුළ වර්ගීකරණ වෙනස්කම් හඳුනාගෙන ඇති අතර, LKAS 1 අනුව අංක 30 සහ 31 සටහන්වල දැක්වෙන පරිදි නැවත වර්ගීකරණය සිදු කර ඇත. ඉහත සඳහන් නැවත වර්ගීකරණය ලාභයට බල නොපායි.

iv. අමාත්‍ය මණ්ඩලය විසින් 2019 ජනවාරි 29 වන දින ගනු ලැබූ තීරණයට අනුව පෙබරවාරි 05 සහ අප්‍රේල් 02 යන දිනයන්හිදී ගනු ලැබූ පසුකාලීන තීරණ මගින් සංශෝධනය කරන ලද අතර, පලාලි ගුවන් තොටුපළ රුපියල් වලින් සමන්විත දේශීය අරමුදල් යොදා ගනිමින් කලාපීය වාණිජ ගුවන් ගමන් ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනය කිරීමට අනුමැතිය ලබා දී ඇත. CAASL විසින් රුපියල් මිලියන 900 ක් සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදල (SLTDA) විසින් රුපියල් මිලියන 1,050 ක දායකත්වයක් ලබා දී ඇත.

v. 2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරී පනතේ 9 වැනි වගන්තියට අනුව ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා විසින් මඩකලපුව ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියට පැවරීම සහ පැවරීම සඳහා 1973/78 දරන ගැසට් නිවේදනය 2016 ජූලි 1 දින ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව 2017 සහ 2018 වර්ෂවලදී ඉඩම් සහ ගොඩනැගිලි සිවිල් ගුවන්සේවා අධිකාරියේ වත්කම් ලේඛනයට ගෙන යන ලදී. මෙම දේපල සීමාසහිත ගුවන්තොටුපල සහ ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම වෙත සිය මෙහෙයුම් සඳහා බදු දී ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

vi. ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය විසින් 2015 සහ 2016 වසරවල මඩකලපුව ගුවන් තොටුපළ සංවර්ධනය සඳහා රුපියල් 482,779,024/- ක් වැය කර ඇත. ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඔහුගේ අංකය MT/04/ යන ලිපියෙන් එම වටිනාකම සිවිල් ගුවන්සේවා අධිකාරියේ වත්කම් ලේඛනයට ගන්නා ලෙස 2022.09.27 දිනැති 03/01-1 වරාය හා ගුවන්සේවා අමාත්‍යාංශය හරහා දන්වා තිබුණි. එහෙත් වත්කම් කාණ්ඩ හඳුනා ගැනීමට තවත් සාක්ෂි අවශ්‍ය වීම හේතුවෙන් එම මුදල වත්කම් ලේඛනයට ගැනීමට මෙම අධිකාරියට හැකියාවක් නැත; මුදල සත්‍යාපනය කිරීමෙන් පසු මෙය 2023 මූල්‍ය ප්‍රකාශන වෙත ගනු ලැබේ.

vii. 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය පනතේ 9 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව, ගමනාගමන සහ සිවිල් ගුවන්සේවා අමාත්‍යතුමා විසින් දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සහ ඉහත දක්වන ලද පනතේ තුන්වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගුවන්නාවික පහසුකම් සහ ඉඩම, උපලේඛනයේ විශේෂ කොට දක්වා වහා බලාත්මක වන පරිදි සිවිල් ගුවන්සේවා අධිකාරියේ පහත ගුවන් තොටුපළවල් පැවරීමට සහ බලාත්මක කිරීමට 2017.12.21 දිනැති අංක 2050/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය හදුන්වා දී ඇත.

ගගන යාත්‍රාංගණ (දෙවන කාර්ය සටහනෙහි නිරූපිත)

කටුනායක ගුවන්තොටුපළ

රත්මලාන ගුවන්තොටුපළ

ගගන නාවික පහසුකම් සහ ඊට අදාළ භූමිය (තෙවන කාර්ය සටහනෙහි නිරූපිත)

- කන්දවල පාර, රත්මලාන පිහිටි සිවිල් ගුවන්සේවා පුහුණු මධ්‍යස්ථානය, එහි ගොඩනැගිලි සහ ව්‍යුහයන් සහ ඊට අයත් ඉඩම්
- අත්තිඩිය, රත්මලාන පිහිටි ගගන නාවික සන්නිවේදන සම්ප්‍රේෂණ මධ්‍යස්ථානය, එහි ගොඩනැගිලි සහ ව්‍යුහයන් සහ ඊට අයත් ඉඩම්
- මඩම්පැල්ල, ගම්පහ පිහිටි බණ්ඩාරණායක ගුවන්තොටුපළෙහි ගුවන් විදුලි සංතරණ ආධාරක, එහි ගොඩනැගිලි සහ ව්‍යුහයන් සහ ඊට අයත් ඉඩම්
- ගම්පහ - පමුණුගම හි කපුගොඩ පිහිටි බණ්ඩාරණායක ගුවන් තොටුපළෙහි ගුවන් ධාවන පථය සඳහා ගුවන් විදුලි සංතරණ ආධාරක, එහි ගොඩනැගිලි සහ ව්‍යුහයන් සහ ඊට අයත් ඉඩම්
- පිදුරුතලාගල කන්දේ පිහිටි රේඩාර් මධ්‍යස්ථානය, එහි ඇති ගොඩනැගිලි සහ ව්‍යුහයන් සහ ඊට අයත් ඉඩම්
- ගුවන් සමාගමේ කාර්ය මණ්ඩලය සඳහා නිවාඩු නිකේතනය ඉදි කර ඇති නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිදුරුතලාගල ඉඩම සහ එහි පවතින හෝ ඊට අදාළ ව්‍යුහයන්
- අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම්පලාත නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, අංක 249 II අදියර - ග්‍රාමසේවා වසමේ, අනුරාධපුර නව නගරයේ, ඉඩම් කට්ටි අංක 976 දරන හෙක්ටයාර 0.125 කින් යුතු බිම් කට්ටිය

ඉහත දේපළ වල වටිනාකම, පිඹුරු සහ අගය කිරීම් අවසන් කළ පසු CAASL හි වත්කම් ලේඛන හි දක්වන අතර, 2002 අංක 34 දරන සිවිල් ගුවන්සේවා අධිකාරියේ අනුව වත්කම් පවරනු ලැබේ.

වත්කම් වර්ගය	01/01/2022 දිනට ශේෂය රු.	එකතුකිරීම්/ පැවරුම් රු.	නැවත ඇගයීම රු.	බැහැර කිරීම් රු.	31/12/2022 දිනට ශේෂය රු.	31/12/2021 දිනට ශේෂය රු.
පිරිවැය						
ඉඩම්	**575,826,244**	-	-	-	**575,826,244**	575,826,244
ගොඩනැගිලි	**1,840,456,431**	17,682,861	-	-	**1,858,139,292**	1,840,456,431
බහාලූම් ව්‍යුහයන්	**4,315,018**	-	-	-	**4,315,018**	4,315,018
රථ වාහන	**132,502,263**	-	22,820,732	-	**155,322,995**	132,502,263
පිරියත සහ යන්ත්‍රෝපකරණ	**139,596,199**	6,635,103	(40,499,659)	(897,350)	**104,834,293**	139,596,199
ලී බඩු සහ සවිකිරීම්	**61,214,797**	768,232	(9,049,240)	-	**52,933,789**	61,214,797
වෙනත් සථිර වත්කම්	**625,254**	-	(89,110)	-	**536,144**	625,254
	2,754,536,206	25,086,196	(26,817,277)	(897,350)	**2,751,907,775**	2,754,536,206

වත්කම් වර්ගය	01/01/2022 දිනට ශේෂය රු.	එකතුකිරීම්/ පැවරුම් රු.	නැවත ඇගයීම රු.	බැහැර කිරීම් රු.	31/12/2022 දිනට ශේෂය රු.	31/12/2021 දිනට ශේෂය රු.
ක්ෂය වීම						
ගොඩනැගිලි	**272,810,496**	110,975,602	-	-	**383,786,098**	272,810,496
බහාලූම් ව්‍යුහයන්	**20,216**	388,352	-	-	**408,567**	20,216
රථ වාහන	**106,309,994**	3,618,645	(76,165,770)	-	**33,762,870**	106,309,994
පිරියත සහ යන්ත්‍රෝපකරණ	**97,673,040**	15,845,114	(48,151,008)	(803,607)	**64,563,539**	97,673,040
ලී බඩු සහ සවිකිරීම්	**45,296,060**	6,514,494	(16,223,914)	-	**35,586,641**	45,296,060
වෙනත් සථිර වත්කම්	**540,847**	32,523	(89,110)	-	**484,260**	540,847
	522,650,653	137,374,730	(140,629,802)	(803,607)	**518,591,974**	522,650,653
ලිඛිත අගය					**2,233,315,802**	2,231,885,553

30. අස්පෘශ්‍ය වත්කම්

වත්කම් වර්ගය	01/01/2022 දිනට ශේෂය රු.	එකතුකිරීම්/ පැවරුම් රු.	බැහැර කිරීම් රු.	නැවත ඇගයීම රු.	31/12/2022 දිනට ශේෂය රු.	31/12/2021 දිනට ශේෂය රු.
පිරිවැය						
තොරතුරු තාක්ෂණ මෘදුකාංග	**50,332,868**	-	-	(14,487,351)	**35,845,518**	**50,332,868**
	01/01/2021 දිනට ශේෂය රු	වසර සඳහා ගාස්තු	බැහැර කිරීම්	නැවත ඇගයීම	**31/12/2022** දිනට ශේෂය රු.	**31/12/2021** දිනට ශේෂය රු.
ක්ෂය වීම						
තොරතුරු තාක්ෂණ මෘදුකාංග	**23,088,827**	15,314,716	-	(14,487,351)	**23,916,192**	**23,088,827**
ලිඛිත අගය					**11,929,326**	**27,244,041**

31. වත්කම් භාවිතයේ අයිතිය - විරවිල ඉඩම

2008 ජනවාරි සිට රජයෙන් වසර තිහක කල්බදු ගිවිසුමක් යටතේ වීරවිල සංචාරක බංගලාව හි ඉඩම අධිකාරිය වෙත ලැබුණි. 2019.12.31 දින තෙක් කල්බදු ගෙවීම් ලාභ සහ අලාභ ගිණුම අධිකාරිය අය කර ඇත. LKAS 17 වෙනුවට SLFRS 16 කල්බදු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇත. එබැවින් SLFRS 16 හි C7-C13 ඡේදය අනුගමනය කරමින් ආරම්භක අයදුම්පතෙහි දිනයට හඳුනා ගන්නා ලද ප්‍රමිතිය මූලිකව යොදා ගැනීමේ සමුච්චිතයන් බලාත්මක කිරීමත් සමඟ අතීතානුයෝගීව 2020 ජනවාරි 1 දින සිට මෙම ප්‍රමිතිය සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් යොදා ගෙන ඇත.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

වත්කම් භාවිතයේ හඳුනාගත් අයිතියට අදාළ ධාරණ වටිනාකම පහතින් දැක්වේ.

	2022	2021
	රු.	රු.
2022 ජනවාරි 1 දිනට	**336,539**	357,573
එකතු කිරීම්	**-**	-
වියදම් ක්ෂය වීම	**(21,034)**	(21,034)
2022 දෙසැම්බර් 31	**315,505**	336,539

32. නොනිමි ප්‍රාග්ධන ක්‍රියාකාරකම්

i. ජාතික අයවැයෙන් යෝජනා කරන ලද පුත්තලම සහ බණ්ඩාරවෙල අභ්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධනය සඳහා සමීක්ෂණ සැලසුම් සඳහා CAASL මුදල් වැය කර ඇත. මෙම අභ්‍යන්තර ගුවන් තොටුපළවල් සංවර්ධනය කිරීම අවසන් කර නොමැති නිසා එවැනි ඉදිකිරීම් ආරම්භ කළේ නැත.

ii. රු. 446,509,332/- වියදමක්a CAASL විසින් 2019.12.31 දක්වා දරන ලද අතර, මූල්‍ය ප්‍රකාශනවල "නොනිමි වැඩ - ප්‍රාග්ධනය" අත්තිකාරම් යටතේ - පලාලි ලෙස රු. 170,621,991/- දැක්වේ. ඉදිකිරීම්කරුවන් සම්පූර්ණ කිරීමේ සහතිකය ඉදිරිපත් කර නොමැති බැවින් වත්කම තවමත් ප්‍රාග්ධනීකරණය කර නොමැත.

යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ අදියර තුනකින් නිම කිරීමට සැලසුම් කර ඇත. පළමු අදියර ඉදිකර ඇති අතර, පළමු අදියර යටතේ සුළු සංවර්ධන කටයුතු කිහිපයක් සිදු කිරීමට නියමිත බැවින් සිවිල් ගුවන්සේවා අධිකාරියට සම්පූර්ණ කිරීමේ සහතිකයක් ලැබී නැත. තවද, රජයේ ප්‍රතිපත්ති තීරණ අනුව, 2022 දෙසැම්බර් 12 දින සිට යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළේ මෙහෙයුම් ආරම්භ කර ඇත. රජය ඒ පිළිබඳව නිසි තීරණයක් ගත් පසු ඉදිකිරීම් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

iii. රු. 2,163,312/- කටුනායක අංක 09 හි පිහිටි පරීක්ෂක නිල නිවාස සඳහා මාඩිම් තාප්පයක් ඉදිකිරීමට කොටස් වශයෙන් ගෙවා ඇති අතර එය ඉදිකිරීම් - නිල නිවාස යටතේ දැක්වේ.

iv. ගුවන් තොටුපල ඉඩම් මැනුම් සැලසුම් සඳහා 2021 දී රුපියල්. 54,210 ක් ඇති අතර 2022 දී රු. 269,000/- ගෙවා ඇත. එය ගුවන්තොටුපල ඉඩම් අත්පත් කර ගැනීම යටතේ පෙන්වා ඇත.

v. තොරතුරු තාක්ෂණ සංවර්ධනය යටතේ සඳහන් කර ඇති HRIS මෘදුකාංග (රු. 5, 078,125/-) සහ අපගමන කළමනාකරණ මෘදුකාංග (4,730,000/-) සහ ස්වයංක්‍රීය පුද්ගලික බලපත්‍ර පද්ධතිය (1,125,000/-) සඳහා කරන ලද කොටස් ගෙවීම්.

	2022	2021
	රු.	රු.
අභ්‍යන්තර ගුවන්තොටුපළ - බණ්ඩාරවෙළ	**677,000**	677,000
අභ්‍යන්තර ගුවන්තොටුපළ - පුත්තලම	**315,000**	315,000
යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ - පලාලි	**446,509,332**	446,509,332
ගුවන් තොටුපල ඉඩම් අත්පත් කර ගැනීම	**323,210**	54,210
ඉදිකිරීම් - ප්‍රධාන කාර්යාලය	**-**	16,613,532
ඉදිකිරීම් - පරීක්ෂක නිල නිවාස	**2,163,312**	-
තොරතුරු තාක්ෂණ සංවර්ධන	**10,933,125**	5,453,124
	460,920,979	469,622,198

33. වෙළඳ ලැබිය යුතු දෑ

	2022	2021
	රු.	රු.
OSS සහ ලැබිය යුතු අපගමන සේවා වියදම් ආදායම	**291,010,409**	125,715,503
වෙනත් ණයගැති	**2,905,039**	512,775
	293,915,448	126,228,278

34. කාර්ය මණ්ඩල ණය

	2022	2021
	රු.	රු.
කාර්ය මණ්ඩල ණය	**134,590,825**	124,903,221
විලම්බිත කාර්ය මණ්ඩල පිරිවැය (ණය)	**(78,609,923)**	(45,730,488)
	55,980,902	79,172,733

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් (2021.12.31 දිනට ශේෂය) නඩත්තු කිරීම සඳහා රුපියල් 50, 084,994/- ක වෙනම ආයෝජනයක් මූල්‍ය වත්කම්වලට ඇතුළත් කර ඇත.

35. මූල්‍ය වත්කම්

	2022	2021
	රු.	රු.
භාණ්ඩාගාර බිල්පත්	**3,474,976,963**	1,404,628,796
භාණ්ඩාගාර බිල්පත් - පාරිතෝෂිත අරමුදල		
අඩු කළ: විලම්බිත පොලී ආදායම	**(122,122,458)**	(10,291,259)
	3,352,854,505	1,394,337,537

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් (2021.12.31 දිනට ශේෂය) නඩත්තු කිරීම සඳහා රුපියල් 50, 084,994/- ක වෙනම ආයෝජනයක් මූල්‍ය වත්කම්වලට ඇතුළත් කර ඇත.

36. අත්තිකාරම්, පෙර ගෙවීම් සහ වෙනත් ලැබිය යුතු දෑ

	2022	2021
	රු.	රු.
අත්තිකාරම්	**175,649,471**	176,842,956
පෙර ගෙවීම්	**12,509,901**	12,598,863
ලැබිය යුතු වකතු කළ අගය මත බදු	**255,416,974**	251,139,837
ලැබිය යුතු පොලී ආදායම්	**23,236,120**	71,205,328
පෙර ගෙවීම් කරන ලද කාර්ය මණ්ඩල පිරිවැය	**78,609,923**	45,730,488
	545,422,389	557,517,473

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මධ්‍යම ආයතනික ආපසු ගෙවීමේ ඒකකය 2016 ට පෙර කාලපරිච්ඡේදවල වකතු කළ අගය මත බදු ආපසු ගෙවීම් පිළිබඳ විගණනයක් සිදු කරයි. එම මුදල් ආපසු ගෙවීම 2023 පෙබරවාරි මස අවසන් වන විට අවසන් කරන බව ඔවුන් තහවුරු කර ඇත.

2016 අප්‍රේල්/ජූනි බදු කාලසීමාව සඳහා රුපියල් 4,387,027 ක ආපසු ගෙවීමක් විශාල ආයතනික ආපසු ගෙවීමේ ඒකකය විසින් අවසන් කර ඇති අතර, එම මුදලම ගෙවිය යුතු ආදායම් බදුවලට එරෙහිව ගෙවීමට මෙම අධිකාරිය ඉල්ලා ඇත. IRD විසින් 2017 සිට විගණන ආරම්භ කර නැත. අඛණ්ඩ පසු විපරම් ක්‍රියා සිදුවෙමින් පවතින අතර, IRD නිලධාරීන් විසින් තහවුරු කරන ලද පරිදි ආපසු ගෙවීම් ලැබීම පිළිබඳව සැකයකින් තොරව තහවුරු කරන්නෙමු.

RAMIS පද්ධතියේ සිවිල් ගුවන් සේවයේ ආපසු ගෙවීම් "සැකසෙමින් පවතින" ලෙස දැක්වේ.

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

37. මුදල් සහ මුදල් සමාන දෑ

	2022	2021
	රු.	රු.
බැංකුවේ මුදල්		
ජංගම ගිණුම: 000 202 6666 - BOC	**63,290,060**	52,175,812
ජංගම ගිණුම: 000 202 6678- BOC	**978,156,779**	171,045,728
ජංගම ගිණුම: 0088591866 -BOC (ලංකා QR)	**147,950**	-
USD ගිණුම: 89897817- BOC	**98,137**	-
ජංගම ගිණුම: 324 100 190 023 731 - මහජන බැංකුව	**214,916,769**	261,675,259
කෙටි තැන්පතු (Call Deposit)	**1,335,000,000**	1,262,700,000
සුළු මුදල් අත්තිකාරම්	**737,000**	639,950
මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සම්පූර්ණ මුදල් සහ මුදල් සමාන දෑ	**2,592,346,695**	1,748,236,749

විදේශීය ගනුදෙනුකරුවන්ගෙන් මුදල් එකතු කිරීමට සහ පරීක්ෂණ සඳහා විදේශගත වන පරීක්ෂකවරුන්ට මුදල් නිකුත් කිරීමට අධිකාරිය විසින් ලංකා බැංකුවේ USD ගිණුමක් ආරම්භ කර ඇත.

විදේශ මුදල් ගනුදෙනුවලට අදාළ විදේශ විනිමය ලාභ සහ අලාභ 'මූල්‍ය ආදායම හෝ පිරිවැයි යටතේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කෙරේ.

ලංකා QR ගෙවීම් ක්‍රමය හරහා මුදල් එකතු කිරීම සඳහා අධිකාරිය වෙනම ජංගම ගිණුමක් විවෘත කර ඇත.

38. රජයේ ප්‍රදාන ලැබීම්

i. සිවිල් ගුවන්සේවා අධිකාරියේ 2002 අංක 34 දරන පනතේ 9 වන වගන්තිය අනුව මඩකලපුව ගුවන් සමාගමේ ගොඩනැගිල්ලේ සහ භූමියේ වටිනාකම, CAASL වෙත පවරන ලදී.

ii. ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ ව්‍යාපෘතිය වෙතින් 65-3651 සහ 65-3653 යන වාහන දෙකෙහි වටිනාකම ලැබීම.

iii. ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ සංවර්ධන වැඩසටහන සඳහා ජපානය විසින් උපකාර පිරිනැමීමේ ක්‍රියාවලිය මඟින් මද්‍යසාර පරීක්ෂණ සඳහා ප්‍රශ්වාස විශ්ලේෂක ඒකක 3 ක වටිනාකම බාහිර සම්පත් දෙපාර්තමේන්තුව හරහා ශ්‍රී ලංකාවට පරිත්‍යාගයක් ලෙස පිරිනැමීම.

2021.01.01 දිනට රජයේ ප්‍රදාන	562,818,117
එකතු කල: 2021 වසර තුළ ලැබුණු ප්‍රදාන	-
අඩු කල: 2021 වසර සඳහා ක්‍රමක්ෂ කිරීම	(4,219,362)
2021.12.31 දිනට රජයේ ප්‍රදාන	558,598,755
එකතු කල: 2022 වසර තුළ ලැබුණු ප්‍රදාන	-
අඩු කල: 2022 වසර සඳහා ක්‍රමක්ෂය	(3,709,152)
2022.12.31 දිනට රජයේ ප්‍රදාන	554,889,603

	2022	2021
	රු.	රු.
ඉඩම්	**522,374,500**	522,374,500
ගොඩනැගිලි	**28,799,702**	31,101,398
දේපළ, පිරියත සහ උපකරණ	**205,331**	660,498
ලී බඩු සහ සවිකිරීම්	**7,201,109**	8,663,608
වෙනත් ස්ථිර වත්කම්	**18,113**	18,113
එකතුව	**558,598,755**	562,818,117
වසර සඳහා ක්‍රමක්ෂය	**(3,709,152)**	(4,219,362)
වසර අවසානයේ ශේෂය	**554,889,603**	558,598,755

39. රඳවාගත් ඉපැයුම්

	2022	2021
	රු.	රු.
වසර ආරම්භක දිනට 3	**4,029,697,346**	3,762,707,811
වත්මන් වර්ෂය ලාභය	**2,743,202,237**	329,898,389
වෙනත් විස්තීර්ණ ආදායම් / (වියදම්)	**53,276,761**	(12,908,854)
ඒකාබද්ධ අරමුදල වෙත පැවරීම	**(1,000,000,000)**	(50,000,000)
වසර අවසාන දිනට	**5,826,176,346**	4,029,697,346

